
sinhalaebooks.com



# පිපාසය

දයා දිසානායක

sinhalaebooks.com



## පෙරවදන

මේ කතාව පිළිබඳ අදහස මට මුලින්ම ඇතිවූයේ 2003 වසරේ මැයි මස 3 වනදා උදේ 10.30 ට පමණ තලවාකැලේ සිට පුණ්ඩලූඔය දක්වා යන අතරමගදී ඉහළ කොත්මලේ ව්‍යාපාරයට විරුද්ධව පැවති උද්ඝෝෂණයක් දුටු අවස්ථාවේදීය. එහෙත් මෙය ලියා අවසන් කරන්නට වසර 8ක් ගතවූයේ ඇයිදැයි කියන්නට මට අපහසුය. මේ කතාව මීට වඩා සංක්ෂිප්ත ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් ලියා අන්තර්ජාලය හරහා මුදා හැරියත් මෙය සිංහලෙන් ලියා නිම කරන්නට අතපසු වූයේ සිත තුළ නළියන තවත් කතා කිහිපයක් ලියන්නට මගේ සිත මා පෙළඹවූ නිසා විය හැකිය.

අදටත් වඩා ඒ කාලයේ ජනතාව අපේ පරිසරය පිළිබඳව මනා අවබෝධයකින් සිටි බවත්, පරිසරයට අහිතකර යම් දෙයක් සිදුවන විට ඊට විරෝධතාවය පළ කරන්නට ඇති බවත් මගේ විශ්වාසයයි.

ඒ නිසාය මා මෙය පාරිසරික ඓතිහාසික නවකතාවක් ලෙස හැඳින්වීමට කැමති.

මා පාඨකයින්ගෙන් ඉල්ලා සිටින්නේ මේ කතාව තුළින් අපේ රටේ සිටි කිසිම රජෙකු හෝ පාලකයකු හෝ අපේ ඓතිහාසික සිදුවීමක් අඳුනාගන්නට තැත් නොකරන ලෙසය. මෙය දකුණු ආසියාවේ ඕනෑම රටක ඕනෑම කාලයක සිදුවිය හැකිව තිබූ සිදුවීම් දාමයකි.

December 8th, 2004

sinhalaebooks.com



ස්ථානය - දකුණු ආසියාවේ පිහිටි රටක්

කාලය - 1වේනි සහශ්‍රය

හඳුනාගැනීමේ පහසුව සඳහා පමණක් මෙහි එන චරිත සඳහා දී ඇති නම්

පූරාක - රටේ එවකට සිටි රජු

රේටා - මහඇමති

හගාර - ප්‍රධාන වාරිතාක්ෂණවේදියා

පූනා - මහඇමතිගේ වැඩිමහල් දුව

අභි - මහඇමතිගේ බාල දුව

ටබා - ව්‍යාපෘති කළමනාකාර

තිසගුත හිමි - අසල ගමක බෞද්ධ භික්ෂුවක්

චිතා - තිසගුත හිමි ගේ නැගනිය

උවි - පිටරට සිට පැමිණි වාරිතාක්ෂණවේදියා

සන්ධ - ප්‍රධාන ගෘහනිර්මණ ශිල්පියා

දන්ත - වාරිතාක්ෂණවේදියකුව සිටි භික්ෂුව

sinhalaebooks.com



# 1.

ගඟ අයිනේ වාඩිවී සිටි භික්ෂුව මුලින්ම දක්නට ලැබුණේ වැඩ අරඹන්නට වැව් බැම්ම වෙත යන කම්කරුවන්ටය. පිරිසෙන් එක් අයෙක් ව්‍යාපෘති කළමනාකරුට මේ බව දැන්වීමට ආපසු දිව ගිය අතර සෙස්සෝ හිටි තැනම ගල් ගැසී නතරවූහ. දෙපස පිහිටි කඳු ගැට දෙක යා කරමින් ගඟ හරහා බැම්ම ඉදිකිරීම බාරව සිටියේ ටබා ය. ඒ වන විට බැම්ම දෙපසින්ම ගඟ අසලටම ඉදිකර අවසාන වී තිබිණ. ගඟ පතුලේ පිහිටි ගල් තට්ටුව දක්වාම පහත් කරන ලද ගල් කණු සිටුවා තිබුණේය. ඉතිරි වී තිබුණේ ගල් සහ පස් දමා ගඟ අවහිර කර මීටර තිහක් උසට බැම්ම සම්පූර්ණ කිරීම පමණක් විය.

කම්කරු පිරිස භික්ෂුව මෙතැන වැඩ සිටි හේතුව දැන සිටියහ. උන්වහන්සේ එතැනින් ඉවත් වන තුරු බැම්මේ වැඩ ඇරඹීමට නොහැකි බවත් ඔවුන්ට වැටහී තිබිණ. අවට සිදුවන කිසිත් නොදැන මෙන් භික්ෂුව වැඩ සිටියේ එදින බැම්මේ වැඩ කරන්නට සැලසුම් කර තිබූ තැනමය. කළමනාකරු පැමිණෙන තෙක් බලා සිටින්නට ඔවුන්ට සිදුවිය.

ඉක්මන් ගමනින් එතැනට පැමිණි ටබා භික්ෂුව දැක පිරිස සිටි අසල නැවතී වට පිට බැලුවේය. සේවක පිරිස ඔහුගේ උපදෙස් බලා සිටින බවත් මෙහිදී ඔවුන්ගෙන් කිසිදු සහයෝගයක් ඔහුට නොලැබෙන බවත් ඔහු දුටුවේය. ටබා සෙමින් සෙමින් භික්ෂුව අසලට ගොස් දණ නමා නමස්කාර කළේය.

භික්ෂුව නිහඬවම අත දිගු කර ඔහුට ආශීර්වාද කළහ. උන්වහන්සේ ඔහුට කතා කරන තුරු ටබා බලා සිටියේය. එහෙත් භික්ෂුව නොසැලී සිටියේ සියලු ඉඳුරන් වසාගෙන සිටි ලෙසය.

විදේශ භාෂාවකින් උස් හඬකින් කතා කරනු ඇසී ටබා පසුපස බැලුවේය. ඔහු දුටුවේ විදේශීය තාක්ෂණවේදියා බැම්ම මත සිට අත පය වනමින් කෑ ගසනා බවයි. ඌටි කතා කරන භාෂාව නොතේරුණත් සේවක පිරිසට ඔහු භික්ෂුවට අවලාද නගන බව වටහා ගත හැකි විය.

තිසගුත තෙරණුවෝ නිහඬව නිසලව වැඩ සිටියහ.

'අප මෙතැන සිදු කරන්නේ මහරජතුමාගේ අණ පිළිපැදීමයි හාමුදුරුවනේ', ටබා පැවසීය.

'අපට දවසේ වැඩ පටන්ගන්නට අවසර', ටබා යළිත් ඉල්ලා සිටියේය.

sinhalaebooks.com



'නියමිත දවසට මේ බැම්ම අවසාන නොකළොත් අපේ ජීවිත වලින් වන්දි ගෙවන්නට අපට සිද්ධ වෙනවා. රජතුමාගෙන් අපට කිසිම අනුකම්පාවක් ලැබෙන එකක් නැහැ'

තිසගුත තෙරණුවෝ නිහඬව නිසලව වැඩ සිටියහ.

'මෙතන හැදෙන මේ මහ වැව නිසා අපේ රටවැසියන්ට ම තමයි යහපතක් වෙන්නෙ. මේ පළාතටම තව කන්නයක් වගා කරන්නට වතුර මේ වැවෙන් ලැබේවි. ඒක මුලු රටටම කරන සේවයක්'

ටබා පිළිතුරක් ලැබෙන තෙක් බලා සිටියේය.

'අප මෙතෙන කිසිම වරදක් කරන්නෙ නැහැ ස්වාමීන් වහන්ස. අපේ අතින් කිසිම පවක් සිද්ද වෙන්නෙත් නැහැ. මේක උසස් පිංකමක් විදිහටයි අපි දකින්නෙ'

හිරු පායා එත්ම ඇතිවන දැඩි රශ්මිය නිසා මේ වනවිට ටබාගේ ඉහින් කනින් දහඩිය ගලන්නට විය. හිසේ සිට පිට හරහා ගලන දහඩිය ඉනට ඇඳ සිටි සලුවට උරා ගන්නා බව ඔහුට දැනුණේය. බැම්ම උඩ සිටි ඌවී කෑ ගසනා හඬ අවට වූ නිහැඬියාව බිඳ ලන බව ඔහුට ඇසුණේය. ආරක්‍ෂක භටයින්ද මේ වන විට වැව් බැම්ම මතට පැමිණ ඇති බව ඔහු දුටුවේය.

තිසගුත හිමියන් ගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබෙන බව වැටහීමෙන් ටබා වාඩිවී සිටි තැනින් නැගිට ගත්තේය. ආපසු වැව් බැම්ම වෙත නගින අතර ඔහු නළල මතින් දෑසට වැගිරෙන දහඩිය ඇඟිල්ලකින් පිසදා ගත්තේය.

'අපි මේ වැඩේ නවත්තන කම් හාමුදුරුවො එතනින් හොල්ලන්න බැරි වෙයි, මං හිතන්නෙ', ඔහු ඌවී දෙස බලාගෙන හැමදෙනාටම ඇසෙන්නට කීවේය.

'දැන් කොහොමද වැඩ නවත්තන්නෙ? හතරෙන් තුන්පංගුවක් වැඩ අහවර කරල තියෙද්දි? ඊටත් රජතුමා නං කියටවත් අවසර දෙන එකක් නැහැ', ඌවී පැවසීය.

'රජ්ජුරුවන් වහන්සෙට දන්වන්න වෙනව මේ ගැන'

'මේ ව්‍යාපාරය නවත්තන්න ඉල්ලුවොත් ඔහේගෙ හිස ගසා දමන්න කියාවි රජ තුමා', ඌවී පිළිතුරු දුන්නේය. 'ඇයි අපට බැරි හාමුදුරුවන් මෙතනින් අයින් කරන්න?'

චාරිත්‍රාක්‍ෂණවේදියා තවත් කිසිවක් කීමට පෙර ටබා ඔහු තරමක් ඈතට කැඳ වාගෙන ගියේය. ඔවුන් ජීවත් වන්නේ බෞද්ධ රටක බවත්, බෞද්ධ භික්‍ෂුව ඉතා ගරුබුහුමන් ලබන අයකු බවත් ටබා ඔහුට පැහැදිළි කර දුන්නේය.

sinhalaebooks.com



'මේ හාමුදුරුවො අල්ලපු ගමේ පන්සලේ. ඊටත් මෙතන වැඩ කරන හුඟ දෙනෙක් මේ ගමේ අය. ඒ හින්දයි අපි බොහොම පරිස්සමෙන් මේ ප්‍රශ්නයට අත දාන්න ඕන'

'මට කමක් නැහැ ඔහේල හාමුදුරුවන්ට කොහොම ගරු කළත් නැතත්. මට ඕන කොහොම හරි මං බාරගත්තු වැඩේ බාරගත්තු වෙලාවට ඉවර කරන්නයි' තාක්ෂණවේදියා කියා සිටියේය.

තැන තැන වූ ගස් සෙවණට වී සේවක පිරිස හිනෙහි ගසාගෙන සිටි මල්ල ලිහාගෙන බුලත් විඩ හපන්නට වූහ. වැව් බැම්ම බඳින්නට ඔවුන්ට හදිසියක් නැත. ඉක්මනින් එය හමාර වූ තරමට ඔවුන්ගේ ගොවිතැන් කටයුතු සඳහා යාමට අවස්ථාව ලැබෙන බව ඔවුන් දැන සිටියත් මේ වැව නිසා යට වන සරුසාර කෙත් බිම් ගැන ඔවුන්ට ඇත්තේ මහත් සිත් වේදනාවකි. නිලධාරීන් විසින් මේ ගැටලුව විසඳන තුරු ඔවුන්ට විවේකීව සිටින්නට හැකිවේ.

එහෙත් වැඩි වේලාවක් ඔවුන්ට එසේ විවේකය අත් විඳින්නට ඉඩ ලැබුණේ නැත. තාක්ෂණවේදියා ඔවුන් වෙත ආවි ඔහුගේ තරහ මේ කම්කරුවන්ගෙන් පිරිමසා ගන්නට මෙන්ය. මේ වනවිට දේශීය භාෂාව යම් තරමකට හසුරුවා ගැනීමට හැකි වීම නිසා ඔහුට සේවකයින්ට අණ දෙන්නට හැකිවිය. ඔහුගේ කෝපය වැඩි වූ විටය ඔහුට ඔහුගේම ජන්ම භාෂාවෙන් කතා කරන්නට සිදුවූයේ.

'ඇයි මේ හැමෝම බූරුවො වගේ මෙතන බලාගෙන ඉන්නෙ?' ඔහු කෑ ගැසුවේය. 'කොච්චර වැඩ තියෙනවද? හා. හා දැන් සේරම යනව වැඩට'

'එතකොට අපේ සාධු?' එක් අයෙක් අසා සිටියේය.

'එයා ඕන තැනක උන්නාවෙ. එයාටම ඇති වෙලා එතනින් යාවි නෙ'

'ඒ උනාට තාම එතන වැඩ ඉන්නවනේ'

'අපට තව බඹ විස්සක් බඳින්න තියෙනව. දැනට අපි එයා ඉන්න තැන ඉඩ තියල බැම්ම බැඳගෙන යමු. එයා එතනින් ගියාම අපි ඒ ටික පුරවමු'

ටබා හැකි ඉක්මනින් මහ ඇමති හමුවීම පිනිස අගනුවර බලා පිටත් විය. කිසිවෙකු අතේ මේ සිද්ධිය කියා යැවීමට ඔහු අකමැති විය. ඔහු විසින්ම ඒ බව මහ ඇමතිට දැන්විය යුතුයැයි ඔහු සිතුවේය.

මේ බව වහාම රජතුමාට දැන්විය යුතුයැයි මහ ඇමති තීරණය කළේය.

'මේ වැඩේ මොන කාරණයක් නිසාවත් ප්‍රමාද කරන්නට බැහැ. මගේ සම්පූර්ණ අවසර තියෙනව තමුන් කැමති විදිහකට මේ ප්‍රශ්නය විසඳන්න. කාලය අපතේ

sinhalaebooks.com



යවල වැඩ ප්‍රමාද කරන්න විතරක් එපා.' මහ ඇමති සහ ටබා රජු හමුවූවිට ඔවුන් දෙදෙනාට ලැබුණ ආඥාව විය.

'අපේ වැඩ අත්හිටුවා නැහැ, මහරජතුමාණනි, මිනිසුන් නොනවත්වාම වැඩෙහි යෙදී ඉන්නවා' මහ ඇමති යටහත් පහත්ව පැවසීය.

ටබා ආපසු වැඩබිමට එන විට අඳුරු වැටී තිබුණේය. කඳවුර වෙත යන්නට පෙර ඔහු ගඟ අසලට ගියේය. භික්ෂූන් වහන්සේ උදේ සිටි අයුරින්ම එතැනම වැඩ සිටියහ. කිසිවෙක් ඒ අසලට පැමිණි බවක් උන්වහන්සේට දැනුනේ නැත.

කඳවුරට ගියපසු ටබාට දැන ගන්නට ලැබුණේ භික්ෂුව මුලු දවසම එතැන සිටි බවත් දිය උගුරක් වත් පානය නොකළ බවත්ය. උන්වහන්සේට පිළිගන්වනු ලැබූ කිසිම දෙයක් තිසගුත තෙරුන් විසින් පිළිගෙන තිබුණේ නැත. උන්වහන්සේ අසලට පැමිණියේ කවුරුන්ද කියාවත් බැලුවේත් නැත.

ටබා යළිත් ගඟ වෙත ගියේ දහඩිය කුණු සෝදාහැර පිරිසිදු වීමටය. මඳ අඳුරේ වුවත් ඈත වැඩ සිටි භික්ෂූන් වහන්සේ ඔහුට පෙනුනේය. උන්වහන්සේ අසල නැගී සිටි ගල් කුලුනේම කොටසක් ලෙසය ටබා හට පෙනුනේ. තිසගුත තෙරුන් එහි වැඩසිටි බව ඔහු නොදත්තේ නම් ටබා හට එතැන කිසිවෙක් සිටිනා බවක් හඳුනා ගැනීමට නොහැකි වන්නට ඇත.

පසුදා උදේ දියනෑමට ගියවිටත් ටබා දුටුවේ එතැනම නොසැලී සිටිනා භික්ෂූන් වහන්සේය. උන්වහන්සේ මේ සිටිනා අයුරින්ම අපවත් වී ඇත්නම් ඔහුගේ ප්‍රශ්නය ඉබේම විසඳෙන බව ඔහුට සිහි විය. එහෙත් ඒ සමගම සිතට ආවේ ඒ සිතිවිල්ල මහත් පවුකාර කමක් බවයි.

භික්ෂුව එතැනින් ඉවත් නොවූවත් බැම්මේ වැඩ නොනැවති කරගෙන යන බව ඔහු මහ ඇමතිට හසුනක් මගින් දන්වා යැව්වේය.

එහෙත් ඇත්තටම වැඩ සිදුවන්නේ වෙනදාට වඩා සෙමින් බව වැව් බැම්ම පරීක්ෂා කරන විට ඔහුට වැටහුණේය. ඉන් පෙර දිනයේ ඔවුන්ගේ වැඩ සටහන පැය කිහිපයකින් ප්‍රමාද වීමත්, ගල් හා පස් පුරවන පිළිවෙලේ වෙනසක් සිදුකිරීම අවශ්‍ය වීමත් එයට හේතු වී ඇත. මිනුම්කරුවෝ ඒ වන විටත් අලුතින් ගල් කනු සිටුවන ස්ථාන ළකුණු කරමින් සිටියහ. ඒ කොටසේ ගල් කණු සිටවීම ඊළඟ සති කිහිපය තුළ සිදුකිරීමටය ඔවුන්ගේ මුල් සැලැස්ම වූයේ.

ඒ අතරම ටබා හට දැනුනේ වැඩබිමේ කිසියම් වෙනසක් සිදුවී ඇති බවයි. ඒ ගැන පරීක්ෂා වීමේදී ඔහුට වැටහුනේ වැඩබිමේ නැගෙන හඬ ගල් ඔසවා ඇදගෙන ගොස් පෙරළා දැමීමත් පස් කැපීමේදී ඇති වන හඬත් පමණක් බවයි. වෙනසකට තිබුණේ මෙවැනි වැඩ බිමක නොනවත්වා ඇසෙන කතා බහ, කෑ කෝ ගැසීම් හා උස් හඬින් සිනාසීම එදා ඔහුට නොඇසීමයි. සියලු දෙනාම තමන්ට හිමි වැඩකොටස නිහඬව ඉටු කරමින් සිටියහ.

sinhalaebooks.com



'මේ විදිහට නම් වැඩ කරන්න බැහැ. මේ මිනිස්සු වැඩ කරන්නෙ මෙතන කවුරුහරි මැරිල වගේ නෙ. මෙතන මළ ගෙයක් වගෙයි. බලන්න මුන් දිහා. හොල්මනක් දැකල වගෙයි. එකෙකුගෙ වත් මූනෙ හිනාවක් තියෙනවද?' ඌවි කීවේය.

'අපි කල්පනාවෙන් වැඩ කරන්න ඕන. මේ මිනිස්සු තරහ කර ගන්න බැහැ. මං ඒකයි ඊයෙත් කිව්වෙ මේ මිනිස්සු අපේ හාමුදුරුවන්ට පුදුම විදිහට ගරු කරන්නෙ. ඒ නිසා හාමුදුරුවන්ට බාධා කරන්න ඒ අය කැමති නැහැ. මේ වැඩ කරගෙන යද්දි ගල් පතුරක් තියා වැලි කැටයක් වත් හාමුදුරුවන්ගෙ ඇඟේ නොවැදෙන්නයි ඒ අය පරිස්සම් වෙන්නෙ. සද්ද කරන්නෙ නැත්තෙ හාමුදුරුවන්ගෙ භාවනාවට ඒකෙන් බාධාවක් වන නිසා'

'මට මේ වැඩ අවසන් කරන්න දවසක් නියම වෙලයි තියෙන්නෙ. මම රජතුමාට පොරොන්දු උනා නියම දවසට හරි ඊට කලින් හරි වැඩ අවසන් කරනව කියල. රජතුමාට වැදගත් වෙන්නෙ එතුමාගෙ උපන් දිනය දවසට මේ වැවට වතුර පුරවන්නයි'

'ඒක මාත් දන්නව. අපි කොහොම හරි මේ ප්‍රශ්නය විසඳ ගනිමු කාටවත් කරදරයක් නොවෙන විදිහට'

'මට නම් මගේ ජීවිතෙන් වන්දි ගෙවන්න බැහැ මේ කොහෙවත් ඉන්න පූජකයෙක් නිසා'

'මේ නිකම් ඔයලාගෙ රටේ හැම තැනම ඉන්න පූජකයො වගේ නෙවෙයි. අපේ ඉතාම සිල්වත් හාමුදුරු කෙනෙක් මෙතන ඉන්නෙ'

අසල ගම් වල වැසියන් කිහිප දෙනා බැගින් වැඩ කීම අසලට ඊස්වන බව ටබා දුටුවේය. ඒ පිරිසෙන් වැඩි දෙනෙක් ටබා දැන හැඳින සිටියේය. ඔවුන් පැමිනෙන්නේ හාමුදුරුවන් බැලීමටත් උන් වහන්සේට සහාය පළකිරීමටත් බව ටබාට වැටහින. ඒ අතර ඔවුහු තිසගුත තෙරුන්ට ආහාර සඳහා යමක් හෝ අඩුම වශයෙන් ගිලන්පස පූජා කරන්නට උත්සාහ කළහ. එහෙත් උන්වහන්සේ ඒ පූජා දෙස දෙඇස් හැර බැලුවේ නැත.

අවට නිහැඬියාව නිසා සේවක පිරිස දිවා ආහාර සඳහා වැඩ නවතා ඇති බව ටබා හට වැටහිණ. ගම් වැසියන්ද ඔවුන්ගේ නිවෙස් බලා යන්නට ඇත. නැතිනම් ඔවුන් රැගෙන ආ කිසියම් සැහැල්ලු ආහාරයක් ගන්නවා ඇත. තිසගුත තෙරුන් පමණක් වැව් බැම්ම අසල නොසැලී සිටිනවා ඇත.

උන්වහන්සේ සාගින්නෙන් හා පිපාසයෙන් පෙළනෙවා ඇත. දින දෙකක් දිය උගුරක් පවා නැතිව ඉවසා සිටින්නේ කෙසේදැයි ඔහුට සිතා ගත නොහැකි විය. තව කොපමණ කලක් හාමුදුරුවන්ට මෙසේ සිටිය හැකිවේදැයි සේවකයෙකු

sinhalaebooks.com



විසින් ඔහු වෙත ගෙන ආ බත් පිඟාන අතට ගන්නා අතර ඔහු සිතුවේය. අනා ගත් පත් පිඩ කටට ගත්තද එය උගුරේ හිරවෙන බවක් ටබාට දැනුනේය. ඔහු වතුර උගුරක් බීවත් කැස්ස නැවතුනේ නැත. පිඟාන මත වූ කෙසෙල් කොළයත් සමග ඔහුගේ කෑම වේල ගසක් යට තැබුවේ වැඩබිම තුළ ස්ථිර වාසයක් කරගෙන සිටි බල්ලන් දෙදෙනාටය.

'කොහොම හරි මේ පූජකය අයින් කර ගන්න ඕන. දැනටම දවස් දෙකක වැඩ ප්‍රමාද වෙලා', එදා සවස වැඩ අවසන් වූ පසු ගල් තලාවක් මත වාඩිවී සිටි ටබා අසලින් වාඩිවූ තාක්ෂණවේදියා පැවසීය.

'බඩගින්න ඉවසගන්න බැරි උනාම නැගිටල යාවි මං හිතන්නෙ' ටබා කීවේ ඒ ගැන කිසිත් විශ්වාසයක් ඇතිව නොවේ.

'මං නං හිතන්නෙ රෑට හොරෙන් කනව ඇති මොනව හරි. ගමේ මිනිස්සු ගෙනැල්ල දෙනව ඇති'

'ඒක නම් වෙන්නෙ නැහැ. කොහොමවත් රෑට නම්. බෞද්ධ භික්ෂුව ඉර හැරුනට පස්සෙ ආහාර වළඳන්නෙ නැහැ. මෙහෙම වෙලාවකට උනත් ඒ ප්‍රතිපත්තිය කඩන එකක් නැහැ'

'ඒ ඉතින් ඔහේ හිතන හැටි නෙ'

'නෑ. ඒ මං හොඳටම දන්න දෙයක්'

'ටබාට ඕන ඒක විශ්වාස කරන්නයි', ඌටි තර්ක කළේය. 'ඔහේ මිනිස්සු ගැන ඒ තරම් දන්නෙ නැතුව වගෙයි. මිනිස්සු පිටින් පෙන්නගෙන ඉන්න විදිහවත් අපි ඒ අය ගැන හිතාගෙන ඉන්න විදිහවත් නෙවෙයි'

'මං දන්නව මං හරි කියල. අපි බලමු'

'මේ හාමුදුරුවො සමහරවිට රජතුමාගෙන් මොනව හරි ලැබෙයි කියල බලාගෙන ඉන්නවද දන්නෙ නැහැ. තාන්න මාන්න, එහෙමත් නැත්නම් පන්සලට ලොකු ඉඩකඩම් ටිකක්'

'හාමුදුරුවො කියන්නෙ ඒ සියලු තන්හා ආසා අත් හළ කෙනෙක්'

'ඒ උනාට ඒ අයත් මිනිස්සු නේ මිනිස් දුර්වල කම් තාමත් ඒ අය ඇතුළෙත් ඇති'

'කාලය විසින් මං හරි බව ඔප්පු කරනවා ඇති'

sinhalaebooks.com



'මට එහෙම බලා ඉන්න කාලයක් නැහැ. මං මේ වැඩේ අහවර කරන්න ඕන නියම දවසට කලින්. වැහි කාලෙ එන්න කලින් මේ බැම්ම අවසාන නොකළොත් මේ තරම් දවසක් කරපු වැඩ ටිකත් හේදිලා යාවි'

'අපි තව දවසක් බලමු. සමහරවිට හෙට අපි නැගිටින කොට හාමුදුරුවො එතනින් ගිහිල්ල ඇති'

පසුදා උදෑසන වන විටත් තිසගුත තෙරණුවෝ එතැනම වැඩ සිටියහ.

ටබා තවමත් බලාපොරොත්තු වූයේ උන්වහන්සේ එතැනින් ඉවත්වේයැයි කියාය. ගම්වැසියන් විසින් කෙසේ හෝ උන්වහන්සේගේ ජීවිතය බේරාගන්නවා ඇත කියාය. මෙසේ නිරාහාරව සිටියොත් තවත් වැඩි දවසක් උන්වහන්සේට ජීවත් විය නොහැකි බව ගම් වැසියන්ට ද වැටහෙනවා ඇත.

මේ වන විට අවට ගම් කිහිපයකින් විශාල පිරිසක් මෙතැනට රැස්ව සිටි අතර ඔවුහු වරින් වර හාමුදුරුවන් ඉදිරියට පැමිණ එතැනින් ඉවත් වන ලෙස ඉල්ලා සිටින බව ටබා දැන සිටියේය. හාමුදුරුවන්ගේ උපවාසය ගැන දැනගත් ඈත ගම්වල වැසියන්ද මෙතැනට රැස් වන්නට විය.

තමාම ගොස් රජතුමා මුණ ගැසිය යුතුයැයි ඌටි තීරණය කළේය. ටබා ඔහුගේ ගමන වැලැක්වීමටවත් ඔහු සමග යන්නට වත් උනන්දු වූයේ නැත. තාක්ෂණවේදියාටම රජුගේ උදහසට මුහුණ දෙන්නට ඉඩහැර ඔහු වැඩබිමේ නැවතුණේය.

ඌටි ගමන් කළේ ගොනෙක් බැඳි කරත්තයකින්ය. දැඩි අව්වේ පයින් ගමන් කරන්නට ඔහු කැමති නොවීය. අගනුවරට පැමිණියත් ඔහුට රජු හමුවීමට බොහෝ වේලාවක් ඉන්නට සිදුවිය. පිපාසයත් බඩගින්නත් දැනුනත් රජමැදුරේ සේවකයෙකුගෙන් කිසිවක් ඉල්ලා සිටීමට ඔහු කැමති නොවීය. ඔහුට සංග්‍රහ කිරීම රජගෙදර සේවකයින්ගේ යුතුකමක් විය යුතු බව ඔහු සිතා සිටියේය.

'මගේ රාජකාරිය කරගෙන යාම අපහසුයි දේවයන් වහන්ස' අවසානයේ රජු ඉදිරියට පැමැණි විට ඔහු කියා සිටියේය.

'ඇයි? දැන් ඇති ප්‍රශ්නය කුමක් ද? කළයුතු දේ ගැන මා නියෝග දීල ඇති. කිසිම හේතුවක් නිසා වැඩට බාධාවක් ඇතිවෙන්න බැහැ'

'ඒත් අර පූජකය තවමත් ගඟ අයිනෙ ඉන්න නිසා අපට එතැන බැම්ම ඉදිකරන්නට බැහැ'

'එයා තවමත් එතන ඉන්නවද?' රජු ඇසුවේය. 'ටබා මොකද ඒ ගැන කරන්නෙ?'

sinhalaebooks.com



'ටබා ඒ ගැන කිසි දෙයක් කරන්නෙ නැහැ දේවයන් වහන්ස. ඔහු පූජකයට බයයි. පූජකයත් එතැනින් යන්නෙ නැතුව වගෙයි. දැන් අහල පහල ගම් වල මිනිස්සු එතන පිරිල මේ ආරංචියට. ඒකත් ප්‍රශ්නයක් වෙන්න පුලුවන්. මේ මිනිස්සු අපේ වැඩට බාධා කරන්න පුලුවන්. සමහරවිට බැම්මට හානියක් කරන්නත් පුලුවන්'

'හාමුදුරුවො ගැන හිතන්නෙ නැතුව වැඩ කරගෙන යන්නයි මං එදත් කීවෙ'

'ඒ උනත් දේවයන්වහන්ස පූජකය වාඩිවෙලා ඉන්නෙ හරියටම බැම්ම ඉදිකරන තැනමයි'

'මම දැන් එක් වරක් පැවසුවේ එයා එතන ඉන්න බව අමතක කරල වැඩ කරගෙන යන්නයි. එයා එතන නැහැ කියල හිතාගෙන බැම්ම ඉදිකරගෙන යන්න'

රජු ගෙන් ඊට වඩා උපදෙස් ලැබෙතැයි ඌවි තව මොහොතක් බලා සිටියේය. එහෙත් අසල සිටි සේවකයකු ඔහුට ඉඟි කළේ එතැනින් ඉවත්ව යන ලෙසය.

'මට ඔය හාමුදුරුවො ගැන යළිත් කිසිවක් දැන ගන්න අවශ්‍ය නැහැ', ඉවතට යන ඌවි හට රජු අවසන් වරට පැවසීය.

සවස යළිත් වැඩබිමට ආ විට රජුගෙන් ලැබුනු උපදෙස් මොනවැදැයි දැන ගැනීමට ටබාට අවශ්‍ය විය. එහෙත් ඌවි ඒ ගැන කිසිවක් පැවසුවේ නැත. ටබා වැඩිදුර ඒ ගැන නොවිමසා ඉන්නට තීරණය කළේය. රාජ උපදෙස් ඔහුටද දැන්වීම තාක්‍ෂණවේදියාගේ යුතුකමය.

පසුදා උදේ ඌවි වෙනදාට වඩා කලින් අවදි විය. ඔහු වෙනදාට කලින් ස්වක පිරිස කැඳ විය. කිසියම් දෙයක් සිදුවෙතැයි හැඟීමෙන් ටබා එතැනට පැමිණියේය. රජුගේ නියෝගය කුමක්දැයි තියාත් මෙහිදී දැන ගන්නට හැකි වෙතැයි ඔහු බලාපොරොත්තු විය.

සේවක පිරිසට වැඩ අරඹන ලෙස ඌවි නියෝග කළේය. ඔවුහු එකිනෙකාගේ මුහුණ බලමින් නිහඬව සිටියහ. තාක්‍ෂණවේදියා යළිත් කෑ ගැසුවේය. සේවකයෝ ටබා දෙස බැලුවේ ඔහුගේ උපදෙස් බලාපොරොත්තු වෙන්ය.

'ඇයි බලාගෙන ඉන්නෙ?' ඌවි සේවක පිරිසට යළිත් කෑ ගැසුවේය. 'යනව. ගිහිල්ල ගල් වැටිය පුරවනව'

ටබා කිසිත් නොපවසා බලා සිටියේය.

'අපේ හාමුදුරුවො තවමත් එතන වැඩ ඉන්නව' එක් සේවකයෙක් නිහැඩියාව බිඳ මින් පැවසීය.

sinhalaebooks.com



'මොන හාමුදුරුවොද? කොහේද?' ඌෆ්ට් ඇසුවේය. 'මෙතන එහෙම කවුරුවත් නැහැ'

'මෙතන ඉන්නව. ගඟ අයිනෙ. එතන ගල් පුරවන්න බැහැ'

'ගඟ අයිනෙ කවුරුවත් නැහැ. මං නියෝග කරනව වැඩ පටන් ගන්න. මේක රාජ කාරියක්. රජතුමාගෙ අණ පිළිදීමක්'

ටබා නිහඬව බලා සිටියේය.

ව්‍යාපෘති කළමණාකරු ලෙසින් ඔහු දෙන නියෝගය කුමක්දැයි සේවකයෝ බලා සිටියහ.

සේවක පිරිස සියලුදෙනාම අවට ගම් වලින් පැමිණි අය නිසා ඔවුහු තිසගුත තෙරුන් හොඳින් දැන සිටියහ. උන් වහන්සේගේ බන අසා ආශීර්වාද ලබා තිබුණෝය. ඒ පළාතේ වැඩවිසූ ඉතාමත් සිල්වත් වූද, උගත් වූද භික්‍ෂුන්වහන්සේ කෙනෙකු බවත් ඔවුහු දැන සිටියහ. වැඩබිම අසල ක්‍රමයෙන් වැඩි වන පිරිස නිසාද, ඈත ගම් නියම්ගම් වලින් පවා සෙනග පැමිනෙන්නට ගත් බැවින්ද මේ භික්‍ෂුව ගැන නොදැන සිටි කෙනෙකුට වුවත් මේ බව පැහැදිලි විය යුතු වුවත් ඌෆ්ට් ඒ කිසිවක් සැලකූ බවත් පෙනෙන්නට නොවීය.

'ඇයි බලා ඉන්නෙ?' ඔහු යලිත් ඇසුවේය.

සේවක පිරිස කලබල වන බවක් පෙනුනේය. භික්‍ෂුවකට හිංසා කිරීම අනන්තරීය පාපකර්මයක් ලෙසය ඔවුන් දැන සිටියේ. මෙහි සිටි සියලු දෙනාම බෞද්ධයින් වූහ. වෙනත් ආගමක් අදහන අය සිටියත් පූජකවරයකුට හිංසා කිරීමට ඒ කිසිවෙක් ඉදිරිපත් නොවනු ඇත. මේ සියලු දෙනාම උපන්දා සිටම ස්වභාවධර්මය සමග එක්ව ජීවත් වූහ. පරිසරයත් එහි සිටි සියලු ජීවීන් හා ගහකොල සමග සහජීවනයෙන් වාසය කරන අය වූහ. එවැනි කෙනෙක් කිසිදිනක කිසිවෙකුට හිංසාවක් නොකරන බව ටබා දැන සිටියේය.

තාක්‍ෂණවේදියා කෝපයෙන් වට පිට බැලුවේය. ඔහු වැඩබිමේ ආරක්‍ෂක කටයුතු සඳහා රජු විසින් පත් කළ හමුදා නිලධාරියා ඒ අසල සිටිනු දැක ඔහු වෙත කැඳ වීය. ඌෆ්ට් විසින් තමාට අවශ්‍ය දේ නිලධාරියා හට පැහැදිලි කළේය. ඒ අනුව නිලධාරියා සේවක පිරිසට විධාන කළත් කිසිවෙක් සෙලවුනේ වත් නැත. ඔහු යළිත් අණ දුන්නේය. එයටත් කිසිදු ප්‍රතිචාරයක් නොලද විට ඔහු හිනේ තිබූ අසිපත ඇද ගත්තේය. මිනිස්සු ඒ ගැන ත් තැකීමක් නොකළහ. ඔවුහු නොසෙල්වී, දෑස් බිමට යොමාගෙන නිහඬව සිටියහ.

මේ නිලධාරියා විශ්වාස කළේ තමන්ගේ අසිපත අතට ගත්තා නම් එසේ ගන්නට වූ අවශ්‍යතාවය ඉටු කෙරෙන තෙක් එය යළිත් කොපුවට බහා ලිය නොහැකි

sinhalaebooks.com



බවයි. ඔහු අසිපත අතින් ගෙන යළිත් අණ දුන්නේය. ඔහු ඉදිරියේ සිටි පිරිස එක්කෝ ඔහුගේ අණ පිළිපැදිය යුතුය. නැතිනම් ඔහු හා සටනට පැමිණිය යුතුය.

ඔහු තවත් සුලු වේලාවක් බලා සිටියේය.

එක්වරම ඔහු අසිපත ඔසවා ඉදිරියෙන් සිටි මිනිසුන් දෙදෙනෙක් කපා බිම හෙළීය. සේවක පිරිස නොසෙලවී බිම වැටී සිටි දෙනොගේ තුවාල වලින් ලේ ගලා යනු බලා සිටියහ. තුවාල කරුවන්ට පිහිට වන්නට ඔවුන්ට ශක්තියක් නොතිබුනේද එසේ නැත්නම් ඔවුන් කිසියම් ආකාරයක මෝහනයකට පත් වී ඇතිදැයි ටබා ට සිතා ගැනීමට අපහසු විය.

'එහෙනම් අපිව සේරම මරල දාන්න වෙයි'. පිරිසේ එක් අයෙක් කෑගැසුවේය. තව එක කඩු පහරකින් ඔහුගේ හිස කඳින් වෙන් විය. එවර තවත් කිහිප දෙනෙක් කඩු පහරින් තුවාල ලැබූහ.

හමුදා නිලධාරියා රජු සමග සතුරන්ට විරුද්ධව යුද වැද ඇති පළපුරුද්ද නිසා මිනිස් ජීවිත ගැන ඔහු තුළ කිසිම හැඟීමක් හෝ අනුකම්පාවක් ඉතිරිවී තිබුණේ නැත. දහස් ගණනක් මිනිසුන්, ගැහැනුන් හා දරුවන් මරන්නට අණ දුන්, ඔහුගේ අතින්ම සිය ගණනක් මැරූ කෙනෙකුට ඉන් පසු මිනිසෙක් කපා බිම හෙළීම කෙසෙල් ගසක් කලා බිම හෙළීම තරම් සුලු කාර්යයක් විය.

'මේ විදිහට මේ ප්‍රශ්නය විසඳන්න බැහැ.' ඌවී නිලධාරියා අසලට ගියේය. 'මට ඕන මේ මිනිස්සුන්ට කියල මගේ වැඩේ කර ගන්නයි. උන් සේරම මරල දැම්මම කවුද මගේ වැව් බැම්ම බඳින්නෙ'

'මේ පාහර බල්ලන්ට තේරෙන්නෙ මේ භාෂාව විතරයි', නිලධාරියා කීවේ අසිපතෙහි ගෑවී තිබූ ලෙ යටි අතලෙන් පිසදමමින්ය.

'මෙහෙම නොකර බැරිද ඔහේගෙ හේවායන්ට කියල අද අපට පුරවන්න තියෙන තැනට ලොකු ගල් ගෙඩි ටිකක් දාල දෙන්න? මේකත් රාජ සේවයේ කොටසක් නෙ'

නිලධාරියා මොහොතකට නැවතී කල්පනා කරන්නට විය. ජීවිතේ ප්‍රථම වරට ඔහුගේ අසිපතට වඩා බලවත් වූ අභියෝගයකට ඔහු මුහුණ දී සිටියේය. අසිපතකින් සියලු ප්‍රශ්න විසඳිය හැකියැයි ඔහු මෙතෙක් කලක් සිතා ගෙන සිටියේය. ඔහු සිය ආරක්ෂක භටයින් දෙස බැලීය. ඔවුන් අතර බෞද්ධයින් එක් කෙනෙකුවත් නැති බව ඔහුට සිහි විය. භටයින් ගෙන් වැඩි දෙනෙක් වෙනත් රටවලින් පැමිණ සිටි කුලී හේවායන් විය. සෙස්සෝ ද කිසිම ආගමක් නොඅදහන, ඕනෑම අපරාධයක් කරන්නට පසුබට නොවන අය වූහ. ඔවුන්ගේ සේවය සඳ හා ලැබෙන රන් කාසි වලට පමණය ඔවුන් සැලකීමක් කළේ.

sinhalaebooks.com



එසේ නම් මේ භටයින්ට බෞද්ධ භික්ෂුවක් යනු තවත් එක නොවටිනා මිනිස් ප්‍රාණයක් පමණක් වනු ඇත. තවත් හතුරෙක් පමණක් වනු ඇත. ඔවුන්ගේ රාජකාරිය වූයේ සතුරන් පරදවා ජය ගැනීමය. ඔවුන්ට වැටුප් ගෙවන ලද්දේ ඒ සඳහාය.

නිලධාරියා ඔහුගේ භටයන් ඔහු වෙත කැඳවා තාක්ෂණවේදියාට බාර දුන්නේය.

'ඔබට අවශ්‍ය වැඩ කොටස මේ අය ඔබට කර දේවි. ඔබට ඇත්තේ ඔවුන්ට අණ දීම පමණයි'

මුරභටයින් මේ වැඩබිමේ මාස ගණනාවක් සේවය කර තිබූ නිසා එහි කටයුතු ගැන මනා දැනීමක් තිබීම මේ අවස්ථාවේ තාක්ෂණවේදියාට මහත් පහසුවක් වීය.

සේවක පිරිස සිදුවන්නට යන දේ වටහා ගැනීමෙන් පසු උස් හඬින් කෑකෝ ගසන්නට වූහ. මේ අසා ගඟ අසල රැස්ව සිටි පිරිස්ද කෑ ගසන්නට වූහ. සන්නද්ධ භට පිරිසක් සේවකයින් හා ගම්මුන් වට කර ඔවුන් ගඟ අසලට යාම වැලැක්වූහ. නිරායුධ වූත්, කිසිම සටන් පුහුණුවක් නැති වූත්, සාමකාමී ගැමියෝ ආයුධ බලය ඉදිරියේ මහත් සේ අසරණ වී සිටියහ.

තාක්ෂණවේදියා විසින් තෝරා දෙන ලද විශාල ගල් වැව් බැම්ම බැඳ නවතා තිබූ තැනට ඇද ගෙන ගිය භටයෝ ඒවා බැම්ම අයිනේ රැස් කළහ. අවශ්‍ය තරම් ගල් එකතුවී ඇති බව දුටු තාක්ෂණවේදියා දුන් සංඥාවත් සමග එක් භටයෙක් මහ සටනකට යන්නා සේ අභියෝගාත්මක රණ හඬක් නගමින් විශාල ගලක් පහලට පෙරලීය. අනිත් භටයෝ ඉතිරි ගල් සියල්ල බැම්ම පහල ගඟ අයිනට පෙරලන්නට වූහ.

තිසගුත තෙරුණ් වහන්සේ නොසෙල්වී සිටි සේක.

වාරිතාක්ෂණවේදියා ජයග්‍රාහී සිනහවකින් ඒ දෙස බලා සිටියේය.

සේවකයින් හා ගම්වැසියන් අසරනව බලා සිටියහ. ඔවුන්ගේ කෑ ගැසීම සහ විලාප පරදාගෙන ගල් පෙරලෙන හඬත් භටයින්ගේ ගෝසාවත් නැගී සිටි අතර පළාතම දූවිල්ලෙන් වැසී ගියේය.

ක්‍රමයෙන් ගඟ අයිනේ සිටවූ ගල් කණු ගලින් හා පසින් වැසී ගියේය.

භටයින්ගේ ගෝසාව මැකී යන විට සෙමින් තුනීවන දූවිලි වළාව අතරින් වැසියන්ට දකින්නට ලැබුනේ වැව් බැම්ම දික්වී ගඟ අසලටම ලඟාවී ඇති බවයි. තිසගුත තෙරුන් වහන්සේගේ සළකුණක් වත් දක්නට නොතිබුණේය.

තිසගුත තෙරුන් වහන්සේ මහාවාපී බැම්මේ කොටසක් වූයේ එසේය.

sinhalaebooks.com



ගම්වැසියන්ගේ සහ සේවකයින්ගේ එකම ප්‍රාර්ථනය වූයේ ටිකින් ටික තුවාල වී හුස්ම ගැනීමට නොහැකි වනවාට වඩා පළමු ගල් කුට්ටියෙන්ම උන්වහන්සේ අපවත්වූවානම් යහපත් බවයි.

මුලු පරිසරයම නිහඬ විය. ඉඳහිට හෝ ඇසුනේ එතැන සිටි ගැහැනියක ඉකිබිඳ හඬනා හඬයි. පිරිමින්ගේ දෑසින් ගළනා කඳුලු පිසදා දැමීමට ඔවුහු උත්සාහ නොකළහ. එහෙත් ඔවුන් නිහඬවම නිසලවම සිටියේ කිසිසේත්ම හමුදා බලයට එරෙහිවන්නට ඔවුනට නොහැකි වූ නිසාය. හැකියාව තිබුණත් ඔවුන්ට නායකත්වය දෙන්නට කෙනෙක් නොසිටි නිසාය.

ගැමියන් අතර එක් යුවතියක් මඳක් ඈතින් බලා සිටියාය. ඇය හැඬුවේ නැත. ඇගේ මුහුණේ කිසිම හැඟීමක් පෙනුනේත් නැත. එහෙත් ඈ ඇගේ අතැඟිලි තදින් මිරිකාගෙන නොසෙල්වී සිටියාය.

ඇය චිත්‍රා නම් වූවාය. මෙතැනදී මොහොතකට පෙර අමානුෂික ලෙස මරා දැමූ තෙරණුවන්ගේ නැගනිය වූවාය. ඇය තිසගුත හිමියන් දැන සිටියේ වැඩිමහල් සහෝදරයකු ලෙස නොව භික්ෂුවක ලෙස පමණය. ඇය උපදී තිබුණේ සහෝදරයා මහණ වූ පසුවය. එහෙත් දෙමාපියන්ගේ වියෝවෙන් පසු තිසගුත තෙරණුවෝ භික්ෂුවකට අමතරව ඇයගේ දෙමාපියන් සහ වැඩිමහල් සහෝදරයා ද විය.

තිසගුත තෙරුන් වහන්සේ මෙතැනදී ජීවිතය පූජා කළේ අවට ගම් වාසීන් සඳහා පමණක් නොව මුලු රටවැසියන් සඳහාත් අනාගත පරම්පරා සඳහාත් බව ඇය දැන සිටියාය.

ඒ පරිත්‍යාගය නිෂ්ඵල ව්‍යායාමයක් නොවිය යුතුය. උන්වහන්සේ ඇරඹූ සටන දිගටම ගෙන යා යුතුය. මේ නිම්නයේ සිදුවන්නට යන ව්‍යසනය වලක්වාගත යුතුය.

චිත්‍රා ඒ සටන දිගටම ගෙනයාමට තීරණය කළාය. ඇගේ ජීවිතය ඒ වෙනුවෙන් කැප කරන්නට ඇය සිතා ගත්තාය. එහෙත් ඒ අතරම ඇයට වැටහී ගියේ මේ රජු වත් රජුගේ හමුදාව වත් මිනිස් ජීවිත ගැන කිසිදු තැකීමක් නොකරන අය වූ බවයි. ඔවුන්ට රට වැසියන්ගේ ජීවිත වැදගත් නොවූ බවයි. ඒ නිසා ඇගේ ජීවිතය නිකරුනේ නැති කර නොගැනීමටත් ඇය සිතා ගත්තාය. ඇය හොඳින් කල්පනා කර බලා තීරණ ගතයුතු විය. සැලසුම් කළ යුතු විය. මේ සටන ජයග්‍රහනය කරා ගෙනයන තුරු ඇය ජීවත් විය යුතුය.

## 2.

රාජාභිෂේකය සඳහා ඉතාමත් ම යහපත් වූ නැකැත සෑදීම නැකැත් කරුවන්ට බාරදී තිබිණ.

sinhalaebooks.com



රාජාභිෂේක පෙරහර ප්‍රතාපවත් කිරීම සඳහා දළ ඇතුන් එකසිය විස්සක් රැස්කරගෙන තිබිණ. ඒ ඇතුන් එකතු කර ගන්නා ලද්දේ රට පුරා පන්සල් වලින්ය. ඔවුන්ගෙන් සමහරුන්ට දින ගණනාවක් ඇවිද ගෙන එන්නට සිදුවූයේ කුඩා පාරවල් ඔස්සේ අව්වෙන් හා දූවිල්ලෙන් පීඩා විඳිමින් විටෙක තිසි ආහාරයක් හෝ නැතිවය. නගරයට පැමිනෙන විට ඔවුන් ඉතාමත් විඩාපත් ව සිටියත් වැවකට බැස සිරුර සිසිල් කර ගන්නට, දූවිලි හා ගමන් විඩාව සෝදා හරින්නට ඔවුන්ට අවස්ථාවක් ලැබුනේ නැත. මේ ඇතුන් පිට අගලින් ඔබ්බේ උද්‍යානයක ගස් වලට බැඳ දමා ඇත්ගොව්වෝ විවේක ගත්හ.

රැස්කර ගෙන සිටි අලි ඇතුන්ට ඔවුන්ගේ අව්‍යශතාවයන් ලබා දෙන්නට, වතුරට බසින්නට, කුසට හොඳ ආරක් ලබා දෙන්නට සමහර ඇත් ගොව්වන්ට අවශ්‍ය වුවත් ඒ සඳහා පහසු කම් තිබුණේ නැත. ඇත් ගොව්වෝද ඇතුන් මෙන්ම අසරණ වී සිටියහ.

මහ වනාන්තර තුළ අනිත් අලි ඇතුන් සමග නිදහසේ ගත කල කාලය මේ ඇතුන්ට සිහි වන්නට ඇත. ඔවුන්ගේ දරුවන් ගැන සිහිවන්නට ඇත. යළිත් කිසි දිනක හෝ ඒ නිදහස නොලැබෙන බවත්, මරණය තෙක්ම මේ වද වේදනා විඳිය යුතු බවත් ඇතුන් දැන සිටින්නට ඇත. හොඩින් උසවා පොලොවේ ගසන්නට හෝ පයින් පාගා මරා දමන්නට හැකි කුඩා දෙපාවකුගේ අනසකට යටත් ව උන්ගේ සිරකරුවකු ලෙස ජීවත් වීම, හෙන්ඩු පහර වලට වඩා දරුණු වේදනාවක් මේ සතුන්ට දැනෙන්නට ඇත.

එරට සිටි අශ්වයින් සියලු දෙනාමත් මේ පෙරහර සඳහා රැස් කර තිබුනේය. ඔවුන් රජුට අයිති වූ නිසාත්, නුවර අසල කඳවුරක ජීවත් වූ නිසාත් ඇතුන්ට මෙන් පීඩාකාරී ගමනකට මුහුණ දෙන්නට ඔවුන්ට සිදු වූයේ නැත. අගනුවරත් එහි වටපිටාවත් උන්ට හුරුපුරුදු විය. අශ්වයින්ගෙන් වැඩි දෙනෙක් පසුගිය යුද සමයේ වෙනත් රටවලින් මිළදී ගත් අය වූහ. ඒ අශ්වයින් නිදැල්ලේ වනාන්තර වල ජීවත් වෙද්දී මිනිස්කම් නැති මිනිසුන් විසින් අල්ලා මෙල්ල කර ගෙන නැව් මගින් මෙරටට ගෙන එන ලදී. මෙහි පැමිනි දා සිටම යුද පෙරමුණේ සිට නොවිඳිනා දුක් විඳන්නට, තිරිසන් මිනිසුන් පිට උඩ තබාගෙන යන්නට, සතුරු ආයුධ වලින් තුවාල ලබන්නට මේ අශ්වයින්ට සිදුවිය.

මුලු අගනුවරම ජනතාවත්, අවට ගම් නියම්ගම් වල ජනතාවත් උදේ පාන්දර සිට ප්‍රධාන වීදි දෙපස රැස් කරවා තිබ්ණේ අලි ඇතුන් හා අශ්වයින් රැස් කර තිබූ ලෙසමය. ඔවුන්ගේ අත් වලට රාජකීය ලාංඡනය සහිත කොඩි ලබා දි තිබිණ. රජු දකින විට ඒ කොඩි වනමින් හැකි තරම් උස් හඩින් ජය සොෂා නැගීමට ඔවුන්ට උපදෙස් ලැබී තිබිණ. පැය ගණනාවක් වතුර පොදක් වත් නැතිව ගිණි අව්වේ සිටින්නට ඔවුන්ට සිදුවිය. රජුගේ ආරක්ෂාව සඳහා එසේ ඒ සෑම පිරිමියෙක්ම, ගැහැනියක්ම, දරුවෙක්ම ඉතා දැඩි පරීක්ෂාවට භාජනය කර තිබූ අතර, ආරක්ෂක හේතුන් මත ඔවුන්ට ඒ සිටි තැන් වලම සිටින්නටත් සිදුවිය.

sinhalaebooks.com



මහල්ලන් දරුවන් ක්ලාන්තව ඇද වැටුනත් ඔවුන් සෙවනකට ගෙනයාමට වත් වතුර පොදක් දෙන්නට වත් ආරක්ෂක භටයින් උනන්දුවූයේ නැත.

පෙරහර ඇරඹූ පසු මේ සෙනග පසුකර යන ඇතුන්ගේ සහ අශ්වයින්ගේ පා ගැටීමෙන් නැගි දූවිලි, දහඩියෙන් තෙත්වූ සිරුරු මත ඇලෙන්නට විය. ඒ සමගම නැගුන ඝොෂාව ට බියවූ කුඩා දරුවන් මහත් හඬින් හඬන්නට වූවත් ඔවුන් සනහා ගන්නට දෙමාපියන්ට අවසරයක් ලැබුණේ නැත.

පෙරහරේ සිටි අශ්වයින්ට අමතරව පාර දෙපස ගැවසුනේ අශ්වාරෝහක හමුදාවය. තවත් ආරක්ෂක භටයින් පෙරහරට පිටුපා, රැස්වූ සෙනග දෙසම නෙත් යොමාගෙන මහත් අවධානයෙන් සිටියේ රජුට කිසිදු අනතුරක් අන්තරාවක් සිදුවීම වැළක්වා ගැනීමටය.

පුරුෂෝත්තමයා, යුග පුරුෂයා, චක්‍රවර්ති රාජයා, ගැලවුම්කරුවා, ආදී නම් වලින් හැඳින්වන රජුගේ සිත්තම් මග දෙපස එල්ලා තිබිණ. මහරජ රනින් කළ ආවරණ හා ආභරණ පැළඳි මහා හස්ති රාජයකු පිට නැග එනවිට රටවැස්සෝ මහා හඬින් රජුට ආචාර කළහ. ගුණ ගැයූහ. වන්දනා කළහ.

රජුට අවශ්‍ය වූයේ මේ උත්සවය අන් කිසිකලක පවත්වන ලද උත්සව වලට වඩා ඉහලින් පැවැත් වීමටය. මිනි පසු කිසි දිනක වත් ඔහුට පසුව එන කිසිම රජකුට පැවැත්විය නොහැකි ලෙසින් පැවැත් වීමටය. රටේ සියලු වැසියන්ගේ සිත් තුළ හැමදාමත් රැඳෙන අවස්ථාවක් කරන්නටය. ඔහු නැති දවසක වුවත් සිහිපත් වන අන්දමේ අවස්ථාවක් කරන්නටය. ඒ සඳහා වැයවෙන ධනය හා ශ්‍රමය ඔහුට ප්‍රශ්නයක් නොවීය. ඒ නිසා රටවැසියන්ටත් සතුන්ටත් වන වද හිංසා ඔහුට ප්‍රශ්නයක් නොවීය. පසුගිය සමයේ දක්ෂිණ හා මධ්‍යම ප්‍රාන්ත ජයග්‍රහනය කිරීමේදී එකතු කර ගත් වස්තුව ඔහු සතු වීය. තවත් කාලයක් යන තුරු ඔහුගේ භාණ්ඩාගාරයට මුදල් හිඟයක් ඇති නොවනු ඇත.

නගරය ප්‍රදක්ෂිණා කර අවසානයේ මේ මහා වීර වික්‍රමාන්විත, තේජෝබල පරාක්‍රම, සර්වබලධාරී රාජෝත්තමයානන් වහන්සේ ආපසු මාලිගාවට සම්ප්‍රාප්ත වූ සේක.

රජු ආපසු අගනුවරට පැමිණියේ වසර කිහිපයක සිට පැවති යුද්ධය අවසාන කළ පසුවය. ඔහු නගර හා ගම් හරහා ආපසු ආවේ ජයග්‍රහණයේ සතුට විඳිමින්ය. ඔහු පසුපස දහස් ගණනක ගේ මළ සිරුරු තිබුණේය. තවත් දහස් ගණනක් අංග විකල වී සිටයහ. ඊටත් වැඩි ගණනක් වැන්දඹුවන් සහ අනත් දරුවන් සිටියහ. කුඹුරු සහ කෙත්වතු විනාශ කිරීම නිසා ඉදිරියේ තවත් දහස් ගණනක් හාමතේ මියයනු ඇත.

එයයි ඔහු ලැබූ සැබෑ ජයග්‍රහනය.

හැම සටනකටම පසු මීයන්ට සහ කපුටන් හට ඉතිරි කරන ලද මළ සිරුරු බොහෝ විය. ඒ රජුගේ හමුදාවට අල්ලා ගැනීමට හැකිවූ සතුරු සෙබලුන් උල හිඳ

sinhalaebooks.com



වූ නිසාත් එසේ මරණයට පත් කල අයගේ සිරුරු පහතට ගෙන අවසන් කටයුතු කිරීමට ගමේ ඉතිරිවූ කිසිවෙක් ඉදිරිපත් නොවූ නිසාත්ය.

යුද බිමින් පලා ගොස් වනවැදී සිටි ගැහැනුන් හට ආපසු ගමට පැමිනි විට ඔවුන්ගේ පියවරුන්, සැමියන්, සහෝදරයින් හා පුතුන් මරා දමා සිටි අයුරු දකින්නට සිදුවිය. කුඩා දරුවන් ඒ බිහිසුනු අපරාද දැකීමෙන් වලක්වා ගැනීමට ඔවුන්ට මහත් උත්සාහයන් ගන්නට සිදුවිය. ඔවුන් අසනා ප්‍රශ්න වලට පිළිතුරු දීම ඊටත් වඩා අපහසු කාර්යයක් විය.

සමහර තරුණ ගැහැණුන්ට දරාගන්නට වූයේ මේ බිහිසුනු මරණ වල මතක පමණක් නොවේ. රජුගේ හමුදාවට අසුවූ මේ ගැහැණුන්ට මුහුණ දිමට සිදුවූ අතවර ඔවුන්ට සදාකාලිකවම ඔවුන් සිත් තුළ රැඳී තිබෙනු ඇත.

එහෙත් රජු මේ කිසිම අපරාදයක් දුටුවේ නැත. විනාසයක් දුටුවේ නැත. ඔහු සැම විටම ඔහුගේ කඳවුර තුළ ආරක්ෂිත ව සිටියේය. යුදබිමේ විස්තර ඔහු වෙත වරින් වර පැමිණි අතර ඔහුගේ උපදෙස්ද එසේම යුදබිමට යවනු ලැබිණ. ඔහුගේ ප්‍රධාන හමුදා නිලධාරින්ට ඔහු පැහැදිලි උපදෙස් දී තිබුණේය. රජුගේ අනසක පිළගන්නට අකමැතිවූ එක් අයෙක් හො ඉතිරිව සිටිනා තෙක් සටන නොනවත්වන ලෙසයි හමුදාවට අණ ලැබී තිබුණේ.

සතුරාට අනුකම්පා නොකරන්න. මින් ඉදිරියට කිසි දිනක රජතුමාට විරුද්ධව නැගී නොසිටින්නට රට වැසියන්ට පාඩමක් මේ වතාවේ උගැන්විය යුතුය. සටනේදී නොමළ අය උළ හිඳුවේත්, එල්ලා මැරුවේත්, පනපිටින්ම පුලුස්සා දැමුවේත් ඒ නිසාය. කිසිවකුට සමාවක් ලැබුණේ නැත.

රජුගේ හමුදාවේ වැඩිදෙනෙක් වෙනත් රටවලින් පැමිණි කුලී හේවායන් වූ අතර තමන්ගේම රට වැසියන් හා සටන් වදින්නට ආ කිහිප දෙනා එසේ ආවේ ලැබන රන් කාසි හා ගම් බිම් සමගම සතුරාගෙන් කොල්ල කෑමට ලැබෙන වස්තුව නිසාය. අගනුවර අසල තරුණයින් හමුදාවට බලහත්කාරයෙන් බඳවා ගනු ලැබුවේ ඔවුන්ගේ පවුල්වලට තර්ජනය කිරීමෙන්ය.

රජුට විරුද්ධව සටන් වැදී සිටි වැඩි දෙනෙක් ප්‍රාදේශිය නායකයින්ගේ බලපෑම නිසා සටන් කළ අය මිස කැපවීමකින් සටන් කළ අය නොවූහ. ඔවුන් හමුදාවට බැඳුනේ ඔවුන්ගේ පවුලේ අයගේ ජීවිත හා ගෙවල් දොරවල් බේරා ගැනීම සඳහාය. ඒ වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයක් ලෙසය ඔවුන් සටනට වැදුනේ. ප්‍රාදේශිය නායකයින් මේ තරම් ඉක්මනින් රජයේ හමුදා වලට පරාද වූයේද ඒ නිසාය. එහෙත් මේ අසරන මිනිසුන්ට ඔවුන්ගේ දරු පවුල් හෝ ගම්මාන බේරා ගැනීමට නොහැකි විය. දේශීය පාලකයින්ගෙන් බේරුනත් රජයේ හමුදා වලින් බේරෙන්නට ඒ ගම් වැසියන්ට නොහැකි විය.

රජු ජයග්‍රාහී ලෙසින් ඉදිරියටම ගොස් ජයග්‍රාහී ලෙසින් සිය අගනුවරට යළිත් සැපත් විය.

sinhalaebooks.com



# 3.

රාජාභිෂේකයෙන් ටික කලක් ගත වන විට ජයග්‍රහනයේ ප්‍රීතිය රජු කෙරෙන් ගිලිහෙන්නට විය. රජු ට මහත් අසහනයක් දැනෙන්ට විය. ඔහුගේ මුහුණේ වූ සිනහව බොඳවී යන්නට විය. මේ වෙනස මුලින්ම දුටුවේ රජ බිසව වුවත්, එය තාවකාලික අවස්ථාවකැයි සිතා ඇය ඒ ගැන තැකීමක් කළේ නැත. එහෙත් රජගෙදර සේවක පිරිස මේ වෙනස දකිත්ම ඔවුන් ගේ සිත් තුළ කැළඹීමක් ඇති විය. රජු ඉක්මනින් කෝප වීය. ඉතා සුලු කරුණකදී වුවද සේවකයින්ට හා නිලධාරීන්ට බැන වැදුනේය. මෙයට හේතු වන්නට ඇත්තේ කුමක් දැයි කිසිවෙකුට සිතා ගත නොහැකි විය.

'මිනිහෙකුට ඉන්න පුලුවන් ගෙදරක්ද මේක? හැරෙන්නවත් ඉඩක් නැහැ මේක ඇතුළෙ', දිනක් රජු කීවේය.

'ඉතින් අපි මේක ටිකක් ලොකු කරමු. නව කොටසක් එකතු කරළ මොනව හරි වෙනස් කරමු', එය ඇසූ බිසව කීවාය.

'මේ මාලිගාව මට නම් එපා වෙලයි තියෙන්නෙ. මේක නිකම් හිර ගෙයක් වගෙයි මට දැනෙන්නෙ'

'එහෙනම් අපි අලුත් මාලිගාවක් හදමු'

පසුදා උදය ඇමතිවරුන් පැමිණි විට අලුත් මාලිගාවක් තැනීමට තීරණය කළ බව රජු පැවසුවේය.

'මාලිගාවෙ වෙනස් කම් කරන්නද දේවයන් වහන්ස?', මහ ඇමති රේටා ඇසුවේය.

'නැහැ. මට ඕන අලුත් මාලිගයක්. විශාල රජකීය උද්‍යානයක් සමග'

'එහෙම තැනක ආරක්ෂාව ගැනත් හිතන්න අවශ්‍ය වෙනව', තවත් ඇමතියෙක් කීවේය.

'ඇතුලු නුවර තමයි මේ රටේ තියෙන ආරක්ෂිතම ප්‍රදේශය', තවත් ඇමතියෙක් කීවේය. 'අලුත් මාලිගාවත් ඇතුලු නුවර ගොඩනගන එක වඩා සුදුසුයි. අපේ පැරණි රජවරුත් ඇතුලු නුවරම මාලිගා තනා ගත්තෙ ඒ නිසයි'

'මට වැඩක් නැහැ කලින් අය කරපු දේවල්. මට මෙතන ඉන්න බැහැ හිරකාරයෙක් වගේ. මම හිරකාරයෙක් නෙවෙයි. මමයි මේ රටේ මහරජ. මමයි මේ රට පාලනය

sinhalaebooks.com



කරන්නෙ. මටයි මේ මුලු රටම අයිති. ඒ හින්ද මට පුලුවන් මේ රටේ මට ඕන තැනක මගේ මාලිගාව හදා ගන්න. මට ඕන තැනක ජීවත් වෙන්න' රජු උස් හඬින් පවසා සිටියේය.

රජු මෙසේ කෝප වූ විට ඔහුගේ තීරණ ගැන කිසිවක් කීමට කිසිවෙක් ඉදිරිපත් වූයේ නැත.

'එහෙම නම් ඒක තීන්දුයි. හෙට උදේ ප්‍රධාන ගෘහනිර්මාන ශිල්පියා මෙහි ආ යුතුයි'

පසුදා උදේ ගෘහනිර්මාන ශිල්පියා පැමිණි විට රජු ඔහුගේ අවශ්‍යතාවයන් පැහැදිලි කළේය.

'මට ඕන තට්ටු හතක මාලිගාවක්. කාමර දහසක් තියෙන්න ඕන. දේදුන්නේ පාට ඇති කුලුණු හැම තැනම තියෙන්න ඕන. හැම තැනම හැමදාම මල් පිපෙන ගස් වැල් තියෙන්න ඕන මාලිගාව ඇතුලෙත්. දොර කවුලු සියල්ලම රන් තහඩු වලින් සරසන්න ඕන. හැම කාලයටම සුදුසු විදිහට සැලසුම් කළ යුතුයි ශිත කාලයටත් ග්‍රීෂ්ම කාලයටත් වැහි කාලයටත් මාලිගාවේ වාසය කරන්නට හැකි විය යුතුයි. ගෙතුළ සියල්ලම ලෝකයේ ඇති හොඳම කිරිගරුඬ, ඇත්දත් හා රත්‍රං වලින් වියයුතුයි. සියලු ඇඳ ඇතිරිලි, තිර රෙදි චීනයේ ඉස්තරම් පටසලු වලින් විය යුතුයි.'

මේ අසා සිටි ඇමති මඩුල්ලට සිතුනේ රජු විසින් කුවේර ගේ ආලකමන්දාව විස්තර කරනා බවකි.

'දැන් මාලිගාව ගොඩනැගිය යුතු තැන බලා ගත යුතුයි', රජු අසුනෙන් නැගී සිටියේය.

රජු මහඇමතියා සහ ගෘහනිර්මාන ශිල්පියා සමග මාලිගාවෙන් පිටව ඇතුලු නුවරින්ද පිටවිය. මුර භටයින් ඔහු වටා ගමන් කළහ. සෙස්සෝ පිටුපසින් ගමන් කළහ. ඇතුලු නුවරින් පිටවී ඈතට යන්නට යන්නට ආරක්ෂක ප්‍රධානියා ගේ සිතේ කනස්සල්ල වැඩි වන්නට විය.

රජු රාජකීය වන උයනට පිවිසියේය.

'මෙතන තමයි මාලිගාව ගොඩ නැගෙන්නෙ'

'මේ උයන ගොඩනැගුවෙ ඔබ වහන්සේගෙ මුත්තණුවන් වන මහරජතුමා', ශිල්පියා කියා සිටියේය.

'ඉතින්? මගේ මුත්තාට ඕන උනේ වන උයනක්. මට ඕන කරන්නෙ මාලිගාවක්'

sinhalaebooks.com



'මේ ලස්සන ගස්වැල්. වටිනා බෙහෙත් පැල. මේ වනයේ ජීවත්වන කරුල්ලන් හා සමනළ රැන්', ගෘහනිර්මාන ශිල්පියා වට පිට බලමින් පැවසීය.

ගෘහනිර්මාන ශිල්පියා මෙතැන දුටුවේ එදා විස්තර කරන ලද නන්දන වනයයි. ඔහු අවට ඔහුගේ නෙත් ගැටුනේ චම්පක, අසෝක, සල්, කාදම්බ, මාලති වැනි ගස් ය. ඉදුනු පළතුරු වෙත ඇදෙන ලේනුන් හා නොයක් විධි පක්ෂීන්ය. මල් ගොමු වෙත ඇදෙන සමනලුන් හා මී මැස්සන්ය. මේ පැමිණ සිටින පිරිසට පෙන්වන්නට මෙන් පිල් විදහා රඟන මොනරුන්ය.

තැනින් තැන රතු, නිල් හා සුදු මානෙල් මල් පිපී දිලෙන පොකුණු කිහිපයක් විය. අලසව ඒ මේ අත පීනන හංසයින් මේ කිසිවක් ගැන තැකීමක් නොකළ බවත් ඔහු දුටුවේය.

'මේ ගස් වලින් අපට ඕන කරන දැව සියල්ලම ලබා ගන්න පුලුවන් වෙයි. ඒ නිසා ඈත සිට දැව ගෙන ඒම අවශ්‍ය වෙන්නේ නැහැ. ඉතිරි වෙන දැව යොදාගන්න පුලුවන් ආරක්ෂක ස්ථාන ඉදි කරන්න' රජු පැවසීය. 'මේ ඉන්න සත්තු වෙන කොහේ හරි තැන් සොයා ගනීවි. නැත්නම් මසට ගන්න පුලුවන් වෙයි' සන්ධ නිහඬව සිටි නිසා ඔහු යළි කීවේය.

'අපට ප්‍රාකාරයක් සහ දිය අගල් තනන්න වෙයි', හමුදා ප්‍රධානියා පැවසීය.

'ඔව්. ඒ වැඩ කටයුතුත් මේ සමගම අරඹන්න.'

සැලසුම් ඉදිරිපත් කළ විට රජු යළි යළිත් බෙහෝ වෙනස් කම් කළේය. ඒ සෑම විටම ශිල්පියාට අලුත් සැලසුම් අඳින්නට සිදුවිය. කිසි විටක ගෘහනිර්මාන ශිල්පියාට ඒ කිසිවක් ගැන කරුනු පැහැදිලි කිරීමක් හෝ ඔහුගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට අවසර ලැබුණේ නැත. මේ හැම වෙනස් කිරීමක් නිසාම මාලිගාව තව තවත් සංකීර්න වූ අතර එය ඉදිකිරීමේ වියදම් ද වැඩි විය.

'මේ ගොඩනැගිලි නිම කරන්න මාස දහඅටක් වත් අඩුම වශයෙන් අවශ්‍ය වෙයි', සන්ධ රජුට පැවසීය.

'තමුන්ගෙ සිහි විකල් වීද?', රජු කෑ ගැසුවේය.

'මාස තුනයි දෙන්නෙ මේ මාලිගාව නිම කරන්න. බැරි නම් මට හෙට උදේට ඒ බව දන්වන්න. මට වෙන කෙනෙක් ඒ සඳහා සොයාගත හැකියි'

ගෘහනිර්මාන ශිල්පියා දරුණු රෝගයකින් පෙළෙන්නකු සේ වෙව්ලන්නට විය. කිසිවෙක් ඔහුගේ හදවත දැඩි ලෙස මිරිකාගෙන සිටින ලෙසක් ඔහුට දැනුණේය. ඔහුට ජීවත් වන්නට ඉතිරිව ඇත්තේ තවත් එක දවසක් පමණක් බව ඔහුට සිතුණේය. රාජ උදහසට ලක්වීමෙන් පසු ජීවිත් වන්නට කිසිවෙකුට වාසනාවක් තිබුණේ නැත. මේ ප්‍රශ්නයට විසඳුමක් ඔහුට සිතා ගත නොහැකි විය.

sinhalaebooks.com



රජු බලාපොරොත්තු වූ ඉදිකිරීම් මාස තුනක් ඇතුළත අවසන් කිරීමට සමත් කෙනෙක් මේ ලොව සිටිතැයි ඔහු විශ්වාස නොකළේය.

උපදෙසක් ලබා ගැනීමට ඔහු මහඇමති රේටා සොයා ගියේය.

'ඇයි ඔබ සිතන්නෙ මේ වැඩේ මාස තුනකින් කරන්නට බැරි බව?', මහ ඇමතියා ඇසුවේය.

'ඒක කරන්න බැරි කමක් නැහැ. මං ඒ ගැන තමයි රජ මාලිගයෙන් පිටවූ මොහොතේ සිටම කල්පනා කළේ. ඒ උනාට එහෙම කරන්න ගියොත් වියදම පස් ගුණයකින් වත් වැඩි වෙයි. ඒ එක්කම මේ ඉදිකිරීම වල තත්ත්වය පහල වැටෙන්න පුලුවන්. අපට සමහර විට පදම් නොකළ දැව භාවිතා කරන්න වෙයි. ඒවායේ හැඩය ටික දවසකින් වෙනස් වෙන්න පුලුවන්. ඉක්මනට දිරාපත් වෙන්නත් පුලුවන්. කණු සඳහා වඩාත් සුදුසු ගල් සොයා ගැනීමට අපහසු වෙයි. වැඩිපුර සේවකයින් යොදා එක්වර වැඩ කිහිපයක් සිදුවන විට මට ඒ සෑම දෙයක්ම හොඳින් පරීක්ෂා කිරීමට අපහසු වෙයි'

'වියදම ගැන ඔබ කරදර වෙන්න අවශ්‍ය නැහැ. රජතුමා අවසර දීලයි තියෙන්නෙ ඔබට අවශ්‍ය මුදල් භාන්ඩාගාරයෙන් නිකුත් කරන්න, කිසිම ප්‍රශ්නයක් නැතුව. ඒ අරමුදල සීමා රහිතයි.' රේටා ඔහුට සහතික විය. 'ඉතින් ඇයි ඒ ගැන කනස්සලු වෙන්නෙ'

'එතකොට ගොඩනැගිල්ලෙ ගුණාත්මක පැත්ත?'

'ඒක ඔබේ වගකීම. සියලු ඉදිකිරීම් නියම ආකාරයට සිදුවීම ඔබ සොයාබැලිය යුතුයි. මං කතා කරන්නම් ආරක්ෂක ප්‍රධානියාට රට පුරාම සොයන්න කියල දක්ෂ, දැනුම් තේරුම් ඇති පුහුණු කම්කරුවන්. ඒ අතරෙ අපට හමුදා නිලධාරින් අනුයුක්ත කරන්න පුලුවන් ඔබ යටතෙ මේ වැඩ අධීක්ෂණයට'

'ඔහු කැමති නොවෙන්න පුලුවන් නිලධාරින් මුදා හරින්න. හමුදා භටයින් මගේ උපදෙස් පිළිපදින්න අකමැති වෙයි'

'ඒ වගකීම මට බාරදෙන්න, මං ඒක විසඳන්නම්'

තවත් ටික වේලාවක් මහ ඇමතියා සන්ධ සමග පිළිසඳරේ යෙදුනේ ඔහුගේ සිත සංසුන් කිරීමටය. ඔහුගේ දෙමාපියන්ගේ තොරතුරු, දරුවන්ගේ ඉගෙනීමේ කටයුතු ගැන ඔහු විමසා සිටියේය. ශිල්පියා රේටා ගේ නිවසින් පිටව ගියේ ඔහුගේ ජීවිතය බේරාගැනීම ගැන දිවි ඇතිතාක් කෘතඥ වන බවට සහතිකවීමෙන් පසුව, සැහැල්ලු සිතෙන් සැහැල්ලු ගමනින්ය. එහෙත් ඔහුට සැනසීමක් ලැබීමට හැකි වන්නේ රජුගේ අලුත් අදහස් අනුව යළිත් වරක් සැලසුම් ඇඳ අවසන් කර, මාස තුනකින් වැඩ නිමකිරීමට කාලසටහනත් පිළියෙල කළ පසුවය.

sinhalaebooks.com



තමා මහත් වගකීමක් බාරගත් බව රේටාට වැටහින. මේ කාලය තුළ මාලිගය ඉදිකිරීමට මිනිස් බලය සොයාදීම ඔහු විසින් කල යුතුව ඇත. මේ සඳහා සන්ධ ට උපරීම සහයෝගය දීම ඔහුගේ යුතුකම විය. මාලිගාව මාස තුනක් ඇතුළත නිම කරන්නට නම්, රජුට අවශ්‍ය ලෙසින් එය ඉදිකරන්නට නම් මොහු හැරෙන්නට ඊට සුදුසු ගෘහනිර්මාණ ශිල්පියෙක් අස රටවල් හතකින් වත් සොයා ගැනීමට නොහැකි බව මහ ඇමතියා දැන සිටියේය. රජ තුමාගේ අවශ්‍යතාවන් සපුරාලීම මත ඔහුගේත් පැවැත්ම රඳා පවතින බව රේටා දැන සිටියේය.

'මා සිතා සිටියේ හෙට උදෑසන ඔබ හමුවීමට හමුදා මූලස්ථානයට එන්නයි. ඒත් දැන් මට මෙතැනදී ඔබ සමග කතා කළහැකියි.' එදා සවස පන්සලේදී හමුදා ප ධානියා මුණගැසුන විට මහ ඇමති ඔහුට කියා සිටියේය. හමුදා ප්‍රධානියා බෝධිය අසල පහන් කිහිපයක් දල්වමින් සිටියේය.

'පනිවිඩයක් එව්වානම් මා ඔබේ නිවසට එනවා නෙ'

'ඔබෙන් ඉල්ලීමක කරන්නයි මං එන්නට සිටියෙ'

'මට කරන්න හැකි ඕනෑම දෙයක්'

'මහරජතුමාගෙ අලුත් මාලිගාව සම්බන්ධවයි'

'ඒ ගැන නම් මටත් බොහොම ගැටලු තියෙනව. ඒ ස්ථානය ආරක්‍ෂාව අතින් කොහෙත්ම සුදුසු නැහැ. මා දන්නෙ නැහැ කොහොමද රජතුමාගෙ ආරක්‍ෂාව තහවුරු කරන්නෙ කියල, ඒ වගේ විවෘත තැනක'

'මාත් දන්නව ඒක. අපි කොහොමහරි ඒ ආරක්‍ෂාව ලබාදෙන්න හැම දෙයක්ම කරන්න ඕන. අපි එකතු වෙලා ඒහෙම කරමු'. රේටා හමුදා ප්‍රධානියාගේ කරවටා අතක් දමාගනිමින් කියා සිටියේය. 'මගේ ගැටලුව ඊට වඩා බරපතලයි. අපට මාස තුනයි තියෙන්නෙ මාලිගාව තනා නිම කරන්න. ඒ සඳහා මට ඔබේ දක්‍ෂ නිලධාරින් කිහිප දෙනෙකුගේ සේවය අවශ්‍ය වෙනව'

'මගේ නිලධාරින් මොනව කරන්නද වැඩබිමක?. ඒ අය දන්නෙ සටන් කරන්න. වැඩබිමක ඒ අයට පුලුවන් එතන ආරක්‍ෂාව තහවුරු කිරීම විතරයි.'

'සන්ධ තක්සේරු කළේ මේ ව්‍යාපෘතියට මාස දහඅටක් ගත වෙයි කියල. ඉතින් දැන් මාස තුනකින් කරන්නට නම් අති විශාල මිනිස් බලයක් අවශ්‍ය වෙනව. ඒ මිනිස්සු එකතුකර ගැනීමටත් අපට ඔබේ ප්‍රාදේශීය බල ඇණි වල සහාය අවශ්‍ය වෙනව. මේ විශාල මිනිස් හමුදාව පාලනය කරන්නත්, වැඩ අධීක්‍ෂණය කරන්නත් තමයි අපට ඔබේ නිලධාරින්ගෙ සේවය උවමනා කරන්නෙ'

'ඔබලාට අවශ්‍ය සෙනග සේරම ගෙනැත් දෙන්නම්. දැන් මුලු රටම අපේ අතේ. මුලු රටේම ඉන්න මිනිස්සු අපේ සේවකයො'

sinhalaebooks.com



'අපට ඕන කරන්නෙ විනයක් ඇති පිරිසක්. ඒ වගේම අපට විශ්වාස කරන්න පුලුවන් අය. ඔබේ හමුදාවෙත් ඇති නේද ඉදිකිරීම් ක්ෂේත්‍රයෙ පළපුරුදු අය'

'ඒක නම් ඇත්ත. ඒ උනාට මං රජතුමාගෙන් අවසර ගත්ත අපේ හමුදාවෙ වැඩි පිරිසකට ටික කලකට නිවාඩු ලබා දෙන්න ගමරට බලා ගිහින් එන්න. ඒ අය වැඩි දෙනෙක් අවුරුදු දෙකකින් විතර අඹුදරුවන් බලන්න ගිහින් නැහැ. යුද්ධය ඉවර උනත් රාජාභිශේකය අවසන් වනතුරු ඒ අයට නිවාඩු දෙන්න බැරි උනා'

'මට විශ්වාසයි ඒ අයට කරුණු පැහැදිලි කර දී තවත් මාස තුනකට සේවයේ රඳවා ගන්න හැකිවේය කියල. වැඩිපුර පාරිතෝශිකයක් ලබා දෙන්න පුලුවන් ව්‍යාපෘතියට වෙන් වන මුදලින්. වියදම් වලට කිසිම සීමාවක් පනවා නැහැ'. මහ ඇමති එසේ පැවසුවේ ඔහුගේ බිරිඳ සහ දියනියන් දෙදෙනා සමග ආපසු යාමට සැරසෙමින්ය.

අසීමිත මුදල් වෙන්කිරීම ගැන ඇසූ හමුදා ප්‍රධානියාගේ මුහුනේ සිහින් සිනාවක් මතු විය. මේ මුදලින් නිසි ප්‍රයෝජන ගැනීමට මහ ඇමතියා නොසිතීම නිසා හමුදා ප්‍රධානියා ඔහු ගැන සිතුවේ මහා මෝඩයකු ලෙසය. යුද්ධය පැවති සමයේ හමුදා ප්‍රධානියා තමන්ගේ පරම්පරා කිහිපයකට සැප විඳින්නට තරම් ධනයක් උපයා ගත්තේ සටනට වෙන්වූ මුදලින් පමණක් නොව සතුරාගේන් උදුරා ගත් වස්තුවද සමගය. උදුරාගත් වස්තුව සියල්ල භාන්ඩාගාරයට නොයැවීමට ඔහු වග බලා ගත්තේය.

තවත් කෙනෙකුගේ සටනක් මෙහෙයවීමේදී තමන්ටත් යහපත් කර නොගැනීම අනුවන කමක් ලෙසයි ඔහු සිතුවේ. හැරත් මේ සියලු වස්තු රජතුමාට අයිති කර ගැනීම සදාචාරත්මක නම් එයින් කොටසක් ඔහු ලබා ගැනීමත් සාධාරන වන බව ඔහු විශ්වාස කළේය.

එහෙත් හමුදා ප්‍රධානියා ඒ රැස් කළ වස්තුව අගනුවර තබා නොගන්නට පරිස්සම් වූයේ ඉදිරියේදී ඇති විය හැකි ඕනෑම අවස්ථාවකට මුහුණ දීමට සිතාගෙනය.

සෑම උදයකම රජු ඉදිකිරීම් බිමට පැමිණියේය. ඒ හේතුවෙන් රජවාසලේ සියලු ර ස්වීම් හා අනිකුත් නිළ රාජකාරි රජතුමා එනතුරු කල්දැමීමට සිදුවිය. සෑම උදයකම රජු විසින් ගොඩනැගිලි වල හෝ උද්‍යානයේ වෙනස් කම් නියම කළේය. අඩක් ඉදිවූ බිත්තියක් දෙස බලා හිඳ ඒ වටා ගමන් කර සන්ධ කැඳවා බිත්තිය කඩා දමා වෙනත් ආකාරයකට හෝ වෙනත් තැනක ඉදිකරන්නට ඔහු උපදෙස් දුන්නේය. දොරක් හෝ කවුලුවක් තිබූ තැනින් ගලවා වෙනත් තැනක සවි කරන ලෙස හෝ එතැන වසා දැමීමට නියම කළේය.

sinhalaebooks.com



මාලිගාව තුළ කාමර වෙනස් කිරීමට, විශාල කිරීමට හෝ කුඩා කිරීමට සිදුවිය. මේ වෙනස් කිරීම් නියම කළේ රජු ඉදිකිරීම් සැලැස්ම බලාගෙන නොවේ. සන්ධට ඒ නිසා රජු පසු පස යන අතරම සිය සහායකයා අත තිබූ සැලැස්මෙහි මේ ස්ථාන ලකුණු කර ගැනීමට සිදුවිය. අතපසු කළහොත් යළි රජු ගෙන් ඒ වෙනස අසා ගන්නට නොහැකි වන්නේ රාජ උදහසට බියටත් වඩා රජුටම ඒ අණකළ වෙනස කුමක් දැයි අමතක වන නිසාය.

පොකුනක් ඉදිවන තැන යළි වසා දමා තවත් තැනක ඒ පොකුනම ඉදිකරන්නට හෝ ඒ වෙනුවට එතැන මල් වවන්නට රජු උපදෙස් දුන්නේය. උද්‍යාන නිර්මාන ශිල්පියා ජීවිතයට ඇති ආදරය නිසා නිහඬව ඒ සියල්ල ඉටු කළේය.

සන්ධ මෙවැනි අපහසුතාවයකට පත් වූ විට ඔහුගේම හිසකෙස් අද ගැනීමට පුරුදු විය. දිනපතාම හිසකෙස් අහුරක් අතට ගැලවී ඒ ම නිසා ඔහුගේ තට්ටය පැදෙමින් තිබුණේය.

'කෙස් ටික නැතුව හරි මගේ හිස බේරා ගන්න පුලුවන් උනොත් ඒ ඇති', මේ ගැන ඔහුගේ බිරිඳ කතා කළ විට ඔහුගේ පිළිතුර විය.

සන්ධගේ දැනුම සහ පළපුරුද්ද අනුව මේ සැලසුම් බොහොමයක මහත් අඩුපාඩු ඇති බවත්, සමහර තැන් වල ඉදිකිරීම් ඉතා අස්ථායී විය හැකි බවත්, අනතුරුදායක විය හැකි බවත් ඔහු දැන සිටියේය. එහෙත් ඒ ගැන සඳහන් කිරීමට ඔහු බිය විය. සමහර වෙනස් කිරීම් වාස්තු විද්‍යාව අනුව නුසුදුසු බවත් ඉතා භයානක අසුභ ඵල ගෙන දිය හැකි බවත් ඔහු දැන සිටියේය.

රජු විසින් නියම කරන ලද සමහර වෙනස් කිරීමකින් මුලු ගොඩනැගිල්ලටම තර්ජනයක් විය හැකි අවස්ථාවක වුවත් ඔහුට නිහඬව සිටින්නට සිදුවිය. ගොඩනැගිලි ද්‍රව්‍ය හෝ වියදම් ගැන ගැටලුවක් නොතිබූ නිසා මෙවැනි අවස්ථාවල රෑ නිදිවර්ජිතව හිඳ ඔහු ඒවාට විසඳුම් සෙව්වේය. එක් පැත්තකින් අස්ථායී වන ගොඩනැගිල්ල වෙනත් ක්‍රමයකින් ස්ථායී කරන්නට ඔහු වෙහෙසුණේය.

සන්ධගේ ප්‍රශ්න වැඩි වන්නට වූයේ රජ බිසවද විටින් විට පැමිණ ඇයට අවශ්‍ය පරිදි වෙනස් කම් කරන්නට නියෝග කරන්නට වූ විටය. බිත්ති වල පාට කිහිප වාරයක් වෙනස් කරන්නට සිදුවූ අතරම ඒ නිසාම දොර කවුලු වල තිර රෙදි ද වෙනස් කරන්නට සිදුවිය. උද්‍යානයේ මල් පැල වෙනස් කරන්නට සිදුවිය. ඇය විසින්ම තෝරා දුන් මල් පැල වැඩුනු පසු, මල් හට ගත් පසු ඒ වර්ණයන් හෝ හැඩයට අකමැති බව පවසා ඒවා ගළවා දමන්නටත්, වෙනත් මල් එතැන සිටවීමටත් සේවකයින්ට සිදුවිය.

වෙනසක් සිදුකළ සෑම අවස්ථාවකම සන්ධ ඒ ගැන ඔහුගේ වාර්ථාවේ සටහන් කර ගත්තේය. ඒ නිසා වැයවූ අමතර කාලය සඳහන් කර ඒ කාලය පිරිමසා ගැනීමට ඉදිරි කාලසටහන වෙනස් කිරීමටද ඔහුට සිදුවිය. මුදල් හෝ සේවකයින් ගැන

sinhalaebooks.com



පමණකි ඔහුට කරදර වන්නට අවශ්‍ය නොවූයේ. ඉල්ලන තරමක් මුදල් ලබා දීමට භාන්ඩාගාරය සැරසී සිටි අතර මහ ඇමති මගින් හමුදා ප්‍රධානියාට දැන්වූ සැණින් වැඩිපුර සේවක පිරිස් ඔහුට ලැබුණේය.

මාලිගාව ඉදිවන මාස තුනක කාලය තුළ රජතුමාට පසු රටේ සිටි ඉතාමත්ම බලවත් පුද්ගලයා ඔහු යැයි විටෙක ඔහුට සිතට ආවේය. රජුට පසු රටේ සිටිනා ධනවත්ම පුද්ගලයා වීමටද ඔහුට අවස්ථාව තිබුණේය. හැම විටම, හැම දෙයින්ම මුදල් උපයා ගැනීමට ඔහුට හැකියාව සහ අවස්ථාව තිබුණේය. ඔහුගේ කටයුතු ගැන ප්‍රශ්න කරන්නට සමත් කිසිවෙන් රටේ සිටියේ නැත. එහෙත් ඔහුගේ සිත තුළ ඒ කිසිවකට ඉඩක් නොවීය. ඔහුගේ එකම අරමුණ වූයේ රජුට අවශ්‍ය ලෙසට මේ මාස තුන ඇතුලත මාලිගාව තනා නිම කිරීමය.

මාලිගය අවසන් නොකළහොත් හෝ අවසානයේ එය රජු බලාපොරොත්තු ලෙසට නොවූයේ නම්, ඔහුට අයත් වන්නේ මරණය බවත් ඔහු හොඳින් දැන සිටියේය. නිදහසට කාරනා කියන්නට ඔහුට අවස්ථාවක් නොලැබෙනවා ඇත.

ව්‍යාපෘතිය අවසන් කළ පසු සිය පවුලේ අයත් සමග රටින් පිටව් වෙනත් රටක වාසය සඳහා යන්නට ඔහු දැනටමත් තීරණය කරගෙන තිබුණේය. මේ මාලිගය වැඩි කලක් නොපවතින බව ඔහු දැන සිටියේය. ඊළඟ වැසි සමයේදීම වහලත් වැහි පීලිත් කඩා වැටෙන්නට ඉඩ තිබුණේය. මහ වැසි පැමිනි විට ඒ ජලය බැස යාමට සමහර නළ පද්ධති ඉඩ මදිවන බව ඔහු දැන සිටියේය. අවශ්‍ය විශාලත්වයෙන් යුතු නළ හා කානු බැඳීමට ඉඩකඩ මදි වීම එක හේතුවක් විය. නානකාමර සහ වැසිකිලි තැනීමේදී ප්‍රශ්න මතු වූයේ විටින් විට තැන් වෙනස් කිරීමට සිදුවූ හෙයින්ය. වසරක් පමණ ඇතුලට මේ අපද්‍රව්‍ය නළ පද්ධතිය සහමුලින්ම කඩා වැටිය හැකි බව ඔහු දැන සිටියේය. වැඩීමනත් දැව පදම් කරගැනීමට කාලයක් නොතිබූ හෙයින් කාලගුනික වෙනස්වීම් සමග දොර කවුලු අබලන් වීමද සිදුවිය හැකිය. සන්ධ මේ අගනුවර හො මේ රට තුළ සිටියොත් දිනපතාම මාලිගාවේ අඩුපාඩු හා ප්‍රශ්න විසඳීමට ඔහු කැඳවනු ඇත. මතුවන බොහෝ ගැටලු ඔහුට විසඳීමට නොහැකි බව ඔහු දැන සිටියේය.

ඉදිකිරීම් හා ආරක්ෂක කටයුතු වල යෙදුනු හමුදා භටයින් වැඩ කළේ මහත් කෝපයකින් හා අසහනයකින්ය. යුද්ධය අවසන් වූ වහාම අඹුදරුවන් හා දෙමාපියන් වෙත යන්නට බලා සිටි ඔවුන්ට මෙය මහත් අසාධාරන ලෙසය ඔවුන් දුටුවේ. රජුට ජීවත් වන්නට ඒ තරම් සුවපහසු මාලිගාවක් තිබියදී තවත් මාලිගාවක් තැනීමත්, ඒ මාලිගාව මේ තරම් සුලු කාලයක් තුළ ඉදිකිරීමට ඇති හදිසියත් ඔවුන්ට තේරුම් ගැනීමට නොහැකි විය. මේ සේවක පිරිස බොහොමයක් ජීවත් වූයේ එක කුඩා කාමරයක් පමණක් ඇති කටුමැටි ගසා පොල්අතු සෙවිලි කරන ලද නිවාස වලය. අවුරුදු දෙකකටත් වඩා කාලයක් ඒ නිවාස අලුත් වැඩියා කිරීමක් හෝ වහල සෙවිලි කිරීමක් නොවී ඒ නිවාස මොන තත්ත්වයක ඇති දැයි ඔවුන්ට සිතා ගත නොහැකි විය. මේ ගම් වල ඉතිරිවී සිටියේ ගැහැණුන් හා කුඩා දරුවන් පමණක් වූ හෙයින් ඔවුන්ගේ ගොවිතැන් වැඩ පවා අතපසු වන්නට ඇත.

sinhalaebooks.com



එවැනි තත්වයක් මත මෙසේ කාමර දහසක නිවසක් රජ පවුල වෙනුවෙන් ඉදිකරන්නට සිදුවීම ඔවුන්ගේ කෝපය වැඩි කළේය.

මේ ඉදිවන රජ මාලිගාවටත්, මුලු රජ පවුලටමත්, මේ සේවක පිරිස සෑම මොහොතකම සාප කළේ ඒ නිසාය.

ගෘහනිර්මාන ශිල්පියා විසින් මුදල් ඉල්ලා සිටි හැම වතාවකම භාණ්ඩාගාර නිලධාරියා මැසිවිලි කීවේය. ඒ වන විට මුලදී සැලසුම් කරණ ලද වියදම මෙන් තුන් ගුණයක් වියදම් වී තිබුනේය. මේ නිලධාරියා සහ නිර්මාන ශිල්පියා පමණක් නොව මුලු නුවරම වැසියන් දැන සිටියේ මේ අපතේ යවන්නේ ඔවුන්ගේ රටේ වස්තුව බවය. රට වැසියන්ගෙන් අයකරගත් බදු මුදල් බවය. කැරලි ගැසූ ප ්‍රදේශවල අහිංසක වැසියන්ගෙන් පවා උදුරා ගත් වස්තුව බවය.

මේ සියලු ධනය වැය වන්නේ එක් අනවශ්‍ය ගොඩනැගිල්ලක් සඳහාය යන හැඟීම කාගේත් සිත් තුළ පැවතියේය. මෙය සිදුවූයේ අගනුවර පමණක් නොව රටේ සියලු ප්‍රාදේශීය නගර වලම මං මාවත් සහ ආහාර ගබඩා වැනි රජයේ ගොඩනැගිලි ඉතා අබලන් තත්වයක තිබියදීය. රෝහල් කඩා වැටෙමින් තිබුනේය. ඒවායේ ඖෂධ සහ වෛද්‍ය පහසුකම් හිඟ විය. දරුවන්ට උගන්වන්නට සිදුවී තිබුණේ ගස් යට බිම වාඩිවී ගෙනය.

තමන්ගේ වස්තුව කොල්ලකාගත්, තමන්ගේ ගේ දොර ඉඩකඩම් විනාශ කළ රජුට රට වැසියන්ගේ සාපය හැමදාමත් එල්ල විය. මහඇමතිගේ සිට රජයේ සියලු නිලධාරින් මේ සාප කිරීම් ගැන බියවී සිටයේ ඒ සාපය ඔවුන්ටද බලපා හැකි බව දැන සිටි නිසාය. රහසිගතව ඔවුහු හැම දෙනාම දෙවියන් හට බාර හාර වීමත්, වත් පිළිවෙත් කිරීමත්, භික්ෂූන් වහන්සේලාට දානය පිරිනැමීමත්, දෛවඥයන්ගේ පිහිට පැතීමත් කළෝය.

මාලිගාව අවසන් කළ යුතු දිනය ළඟාවෙමින් තිබිණ. කාගේත් ඉවසීමේ සීමාව පනින්නටද ළඟාවෙමින් තිබිණ. සේවක පිරිස ඔවුන්ගේ කෝපය ප්‍රසිද්ධියේම ප ්‍රකාෂ කරන්නට වූහ. දිනපතා වැඩබිමට පැමිණි රජු මේ කිසිවක් නොදුටුවේය. නැත්නම් ඔහු නුදුටුවා සේ හැසිරුණේ ඔහුගේ සිහිනය සැබෑවෙමින් තිබුණු නිසා විය හැකිය.

සති ගණනාවක් දිවා රෑ සේවය කිරීම නිසා සේවකයින් රෝගී වන්නට වූහ. අධික වෙහෙසත්, පරිස්සම අඩුවීමත් නිසා සේවක අනතුරුද වැඩි වන්නට විය. වෛද්‍යවරුන්ටත් අසල පිහිටි රෝහලටත් රාජකාරි බහුල විය. රජු මේ ගැනත් නොදැන හෝ නොදන්නා සේ සිටියේය. මිනිසෙකුගේ අතක ඇඟිල්ලක්, අතක් පයක් හෝ සමහර විට ජීවිතයක් දෙකක් නැතිවීම රජුට එතරම් ප්‍රශ්නයක් නොවීය. රටවැසියන් ඔහුගේ යටත්වැසියන් වූ නිසා ඔවුන්ගේ අත පය පමණක් නොව ජීවිත ද රාජ්‍ය දේපළ ලෙස සැලකීමට ඔහුට අයිති යක් තිබුණේය.

sinhalaebooks.com



මේ අතර සන්ධ සහ හමුදා නිලධාරින්ටත් මුලු සේවක පිරිසටත් මඳ සහනයක් ලැබුණේ අවසාන කිරීමට නියමිත කාලය දින කිහිපයකින් ඉදිරියට යෙදූනේ නැකැත් කරුවන් තීරණය කළ දිනය නිසායි. එහෙත් සියලු වැඩ අවසන් කිරීමට ඔවුන්ට හැකි වූයේ නැත. බදාම නොගැල්වූ තැන්, තීන්ත ආලේප නොකළ තැන්, දොර හා කවුලු පියන්පත් සවි නොකළ තැන් හා තිර රෙදි නොඑල්වූ තැන් නොයෙක් ක්‍රම වලින් වසා දැමීමට සන්ධ ට සිදුවිය. සමහර කාමර වසා දමා තිබීම පහසුම ක්‍රියාව විය. පුද පූජා හා අනිකුත් චාරිත්‍ර අතර රජු මේ සියලු දේ සොයා නොබලන බව ඔහු දැන සිටියේය.

සත් දිනක් තිස්සේ නොකඩවා පිරිත් දේශනා කරන ලදී. හත්වන දින භික්ෂූන් වහන්සේලා පසලොස් දහසකට සාංඝික දානය පරිනමන ලද අතර මේ ව්‍යාපෘතියට සහභාගිවූ සියලුම නිලධාරින් සහ සේවකයින්ට පමණක් නොව මුලු නුවරම වැසියන්ට එදා දිවා ආහාරය ලබා දෙන්නටත් රජු විසින් උපදෙස් දී තිබිණත් දෙලක්ෂ පනස් දහසක් තරම් පිරිසකට විශාල ආහාර ප්‍රමානයක් පිළියෙල කිරීමේ ප්‍රායෝගික අපහසුකම් නිසා වියළි ආහාර ඒ සැම දෙනාටම පිළිගැන්වීමට අවසානයේ තිරණය විය.

මේ වියලි ආහාර සැපයීමේ වගකීමත් හමුදා ප්‍රධානියා වෙත පැවරීම නිසා ඔහුගේ මුහුණ ප්‍රීතියෙන් බැබලුනේය. මේ තරම් සහල් සහ වියලි ආහාර ඉතා හදිසි අවශ්‍යතාවයක් ලෙස මිළදී ගැනීමට ලැබුන අවස්ථාව ඔහුට තවත් හොඳ ඉල්ලමක් පාදා දුන්නේය. මිළ ගණන් කැඳවීමත්, තත්ව පරීක්ෂාවත් මිළදී ගන්නා ප්‍රමාන ගැන සොයා බැලීමත් ඔහු විසින්ම සිදු කරන ලදී. හමුදාවට ආහාර සපයන වෙළඳුන් සමග ඔහුගේ කවදත් තිබූ ගනුදෙනු වලට අමතරව මේ අවස්ථාවේ ඔහුගේ කොටස ඊට වඩා වැඩි කර ගැනීමට ඔහුට ඒ තරම් අපහසු නොවූයේ වෙළඳුන්ටද වැඩි වාසි අත්වන නිසාය. ඉතා බාල තත්ත්වයේ ආහාර ලබා දීම ගැන හමුදා ප ධානියාට ගැටලුවක් නොවීය.

'කවුරු හරි රජ තුමාට මේ ගැන දන්වන්නට ඉඩ ඇතිද? එක් වෙළෙන්දෙක් ඔහුගෙන් ඇසුවේය.

'ඔය යකුන්ට කෑම වල හොඳ නරක කියන්න තේරෙන්නෙ නැහැ. උන් කවදද හොඳ කෑම කාල තියෙන්නෙ වෙනසක් දැනගන්න.' හමුදා ප්‍රධානියා සිනාසුනේය. 'හැරත් කවුද මේ නුවර රටේ ඉන්නෙ මට විරුද්දව පැමිණිල්ලක් කරන්න ජගතෙක්? එහෙම පැමිනිලි කරල එයා මේ රටේ තවත් ජීවත් වෙන්නද'

මාලිගාවේ වැඩ අවසන් කිරීමට ගෘහනිර්මාන ශිල්පියාටත් ඔහුගේ පළපුරුදු සේවක පිරිසටත් තවත් සති දෙකක් ගතවිය.

## *4.*

sinhalaebooks.com



රජු වටා සිටි අය සිතා සිටියේ අලුත් මාලිගාවට පැමිණි පසු ඔවුන් සියලු දෙනාට සැනසිල්ලේ රාජකාරි කටයුතු වල යෙදෙන්නට හැකි වෙතැයි කියාය. පිය රජුගේ කාලයේ සිටම මාලිගාවේ සිටි අය කුඩා කල සිටම රජු දැන සිටියත්, තව අවුරුදු සියයක් සිටියත් මේ රජුගේ සිත තේරුම් ගැනීමට හැකි වන්නේ නැති බව ඔවුනට වැටහෙන්නට වැඩි දවසක් ගත වූයේ නැත.

නව මාලිගය තුළ ටික දිනක් පැවති සාමකාමී වටපිටාව පුපුරා ගියේ එක් දිනක් රජු විසින් මහ ඇමති ට විශේෂ කැඳවීමක් කිරීමත් සමගය.

'මගේ සිහින දෙකක් දැන් සැබෑවී ඇත'. රජු මහ ඇමතිට කීවේය. 'දැන් මේ මුලු රටම මගේ යටතට පත්වී මගේ අණසක පිළිගෙන ඇත. බොහෝ කලක සිට මගේ සිතේ ඇඳී තිබූ මාලිගාවක මට ජීවත් වන්නට ලැබුණා'

රජු ගේ කතාව අතර මහ ඇමති අනිත් ඇමතිවරු දෙස බැලුවේ සිනහවකින් මුව සරසා ගෙනය. දැන් ඔවුහු නිවී සැනසිල්ලේ ඔවුන්ගේ එදිනෙදා වැඩකටයුතු වල යෙදෙන අතර තම පවුලේ අය සමග නිදහසේ කාලයක් ගත කිරීමටද බලාපොරොත්තු වූහ.

'මගේ ලොකුම සිහිනයත්, මගේ ජීවිතයේ ලොකුම බලාපොරොත්තුවත් තවම මට දිනා ගැනීමට බැරි උනා'. රජුගේ මේ කතාව ඇමති මණ්ඩලයේ සියලු දෙනාගේ මුහුණු අඳුරු කරන්නට හේතු විය.

රේටා කිසිත් නොපවසා බලා සිටියේය. රජුගේ සිතේ කුමක් සැඟවී ඇතිදැයි ඔහුට සිතාගත නොහැකි විය. වැරදි යමක් කියා රජු ප්‍රකෝප කරවීමට වඩා නිහඬව සිටීම වඩා යහපත් යයි ඔහු සිතුවේය.

'මගේ නම සැබවින්ම රන් අකුරින් ලියවිය යුතුයි අපේ රටේ ඉතිහාසයේ. කල්ප විනාසයක් එන තුරුම මගේ නම පැවතිය යුතුයි'

'ඔබ වහන්සේගේ නම දැනටමත් කිසිදාක නොමැකෙන ලෙස සටහන් වී ඇත දේවයිනි', මහ ඇමති කීවේය.

'නැහැ. නැහැ. තවම නැහැ. දැනටමත් මේ රටේ උන්ට මගේ මුත්තාගේ නම අමතකයි'

'ඔබ වහන්සේ පිය රජතුමාත් ඒ උතුමානන්ගේ පිය රජතුමාත් කළ සියල්ලටම වඩා ජයග්‍රහන ලබා ඇති දැනටමත්'

'නැත. කොහෙත්ම නැත'. රජු ගුගුළේය. ඔහු දෙනෙත් පියාගෙන හිස අහසට හරවාගෙන දෙවියන්ට කියන්නා සේ මෙසේ පැවසීය. 'මට ඉදිකරන්න ඕන මේ රටේ තියෙන විශාලම වැව. මේ රටේ විතරක් නෙවෙයි අසල්වැසි කිසි රටක නැති

sinhalaebooks.com



තරම් විශාල වැවක්. ඒ වැවට මගේ නම යොදා ගත් විට වැව පවතින තාක් කල් මිනිසුන්ට මගේ නම අමතක වෙන්නෙ නැහැ. වැවෙන් ප්‍රයෝජන ගන්නා මිනිසුන් හැම විටම මට දෙවියන්ට වගේ නමස්කාර කරනු ඇත. මා වෙනුවෙන් දේවාල ඉදි කරනු ඇත. මගේ රූපයට මල් පහන් පූජා කරනු ඇත'

ඇමතියන් මේ කතාව කිහිප විටක් සුලු වෙනස්කම් සහිතව අසා තිබුණේය. රට පුරා යුද්ධයට යද්දී මේ කතාවම කී රජු ඉන්පසු එවැනි දේ පැවසුවේ මාලිගාව ඉදිකිරීමේදීය. මේ පිපාසය කවදා අවසන් වේදැයි ඔවුන්ට සිතා ගත නොහැකි විය.

'අපේ මුලු රටටම අවශ්‍ය තරම් අහස් දිය රැස් කර ගැනීමට වැව් තිබේය දේවයිනි', එක් ඇමතියෙක් පැවසීය.

'මිනිස්සුන්ට වතුර තිබුනම මොකද. නැති උනාම මොකද. මට එය ප්‍රශ්නයක් නොවෙයි. මගේ තීරණය එසේමයි. මහා වැවක් ඉදිකළ යුතුයි. වහාම වාරිකර්මාන්ත නිලධාරින්ට නියම කළ යුතුයි මේ මහා වැව ඉදිකිරීමට වඩාත්ම සුදුස ස්ථානය මට දන්වන ලෙසට'. රජු සභාවේ වැඩකටයුතු අවසාන බව දැන්විය.

'මගේ මේ සිහිනයට විරුද්ධව එක වචනයක් හෝ පවසා තිබුණොත් ඒ ඔහුගේ අවසානය බව සිහියේ තබාගත යුතුයි' රජුට පිටුනොපා ආ පස්සට ගමන් කරමින් සිටි ඇමතියන්ට ඔහු අවසාන ලෙසට පැවසීය.

දින කිහිපයකට පසු ප්‍රධාන වාරිතාක්‍ෂණවේදී **හගාර** සමග මහ ඇමති රජු බැහැ දකින්නට පැමිණියේය. **හගාර** විසින් සැලසුම් කිහිපයක් ඉදිරිපත් කරන ලදී. රජු ඒ කිසිවකට කැමති වූයේ නැත. එක් වැවක් විශාලත්වය මදි විය. තවත් වැවක් ඉදිවිය යුතු වූයේ ඔහුගේ පසුගිය යුද්ධ වලදී ඔහුට සම්පූර්ණ සහයෝගය නොදැක්වූ ප ්‍රාදේශීය නායකයකු ගේ බල ප්‍රදේශයේය. තවත් ස්ථානයක් අගනුවර සිට බොහෝ දුරින් පිහිටියේය. එවිට එය නඩත්තු කිරීම අපහසුය. අමතක වීම පහසුය.

'අපට මීට වඩා සුදුසු තැනක් සොයා ගත නොහැකියි දේවයිනි', සැලෙන හඬින් ඔවුහු කියා සිටියහ.

'එසේනම් මට ද මේ සෑම දෙයක්ම කරන්න සිදුවී තියෙන්නෙ, මේ තරම් විශේෂඥයො මට හිටියත්? මොනවටද මං තියාගෙන ඉන්නෙ මේ තරම් උපදේශකයො, උන් එකෙකුටවත් මට අවශ්‍ය දේ ලබා දෙන්න බැරිනම්'. රජු කෑ ගැසුවේය. 'හෙට පාන්දරින්ම මා කැටුව යාමට සැරසෙන්න ඕන. මං පෙන්වන්නම් වැවක් හදන්න නියම තැන'

**හගාර** මහ ඇමති දෙස බැලුවේය. රට සෑම තැනමත්, විශෙෂයෙන්ම අගනුවර අවටත් සියලු ගංගා ඇල දොල ගැනත්, වැවක් තැනීමට සුදුසු ස්ථාන ගැනත් **හගාර** ඉතා හොඳින් දැන සිටියේය. ඔහුට මගහැරුණු තැනක් මේ රට තුළ

sinhalaebooks.com



ඇතිදැයි ඔහුට අදහා ගත නොහැකි විය. යුධ සමය තුළ රජුද මේ සියලු තැන් දකින්නට ඇත.

පසුදා උදයම රජු ඔහුගේ පිරිස සමග ගමන පිටත් විය. පෙර ගමන් කරුවෝ මග දෙපස සිටි සියලු පිරිස ඉවත් කරන්නට වූහ. බඩු ප්‍රවාහනය කරන කරත්ත පමණක් නොව ධනවතුන්ගේ මගී කරත්ත පවා පාරෙන් ඉවත් කරන ලදී. අතුරු මාවත් හෝ විවෘත ස්ථායන්හි ඒවා නවත්වන ලද අතර මහා මාර්ගයට ඇතුලු වන අතුරු මාවත් සියල්ල තාවකාලිකව වසා දමන ලදී.

රජු පාරේ ගමන් කරන විට දඩාවතේ යන බල්ලකුට වත් පාරේ ඉන්නට ඉඩ ලැබුණේ නැත.

පෙර රජවරුන් විසින් මග දෙපස ගස් සිටුවීමට මහත් උනන්දුවක් ගෙන තිබුණේ ඒ මගින් පාරේ යන එන අයට සෙවනක් ලබා දෙන්නටය. එහෙත් මේ රජ බලයට පැමිණි පසු හමුදා ප්‍රධානියා විසින් මග දෙපස තිබූ සියලු ගස් කපා දමනු ලැබුවේ එය රජුගේ ගමන් වලදී තර්ජනයක් විය හැකි නිසාය. මේ ගස් මත හෝ ඒ අවට සැඟවී සිට රජුට පහර දෙන්නට දුනුවායන්ට අවස්ථාවක් ඇතැයි ඔහු ප්‍රකාශ කළේය.

නගර වැසියන් සහ සමහර ඇමතිවරු මේ විනාශය වලක්වාලන්නට තැත් කළත්, ඒ ගස් නිසා මගීන්ට ඇති වන සහනයත්, පරිසරයට ඇති වන යහපතත් පෙන්වා දෙන්නට තැත් කළත්, රජු ඒ කිසිවක් ගැන තැකීමක් කළේ නැත. මේ රටේ පවතින සියලු දේ රජුගේ යහපත සඳහා පමණක් විය යුතු බව ඔහු විශ්වාස කළේය. හමුදා ප්‍රධානියා ඒ හැම තීරණයකදීම රජුට අනුබල දුන්නේය.

'සෙවන උවමනා කෙනෙකුට කුඩයක් රැගෙන යා හැකියි. නැතිනම් ඉර බැස ගියාට පසු ගමන් කළ හැකියි', රජුගේ අදහස විය. 'මේ රටේ හැම තැනම ඕනෑ තරම් ගස් තිබියදී මේ ගස් කිහිපයක් ගැන කවුරුත් මේ තරම් කලබල වන්නේ ඇයි? මේ මිනිසුන්ට මීට වඩා වැදගත් වැඩක් නැතුවද'

'ඒ කතා ගැන කලබල නොවන්න දේවයිනි. ඒ අය නිහඬ කරවීම මගේ රාජකාරිය. මේ කතා පතුරුවන්නේ ඔබවහන්සේගේ සතුරු කණ්ඩායම්, මේ ගස් අතර ඉඳ ඔබ වහන්සේට අනතුරක් කිරීමට අදහස් කරගෙන' හමුදා ප්‍රධානියා කීවේය.

කපා දැමූ ගස්වල දැව හමුදා ප්‍රධානියා විසින් පිට රට වලට විකුණා විශාල මුදලක් උපයා ගත් බව රජු දැන සිටින්නට ඇත.

රජුගේ ගමන සුව පහසු විය. සම්පූර්ණ ආරක්ෂාව සලසා ඇති බවට ලැබූ සහතිකය නිසා ඔහුගේ සිතටද සැහැල්ලුවක් දැණුනේය. ඔහු ගමන් කළේ අශ්වයින් බැඳි කරත්තයක වූ අතර සෙසු නිලධාරීන් තවත් රථ වල ගමන් කළහ. සුලු සේවකයින් ට පයින් ගමන් කරන්නට සිදුවිය. රජුගේ පහසුව සඳහා අවශ්‍ය බඩු බාහිරාදිය සමග ආහාර පාන කරත්තවල පටවා තිබුණද සමහර දෑ සේවකයින් ට ඔසවා

sinhalaebooks.com



ගෙන රාජකීය කරත්තය අසලින්ම යන්නට සිදුවූයේ රජුට යමක් අවශ්‍ය වුවහොත් වහාම සපයන්නටය. මේ අතර හමුදා භටයින්ටද ඔවුන්ගේ අවි ආයුධ ඔසවාගෙන මේ ගිනි අව්වේ, අශ්වයින්ගේ කුර ගැටී නැගෙනා දූවිලි මැද ගමන් කරන්නට සිදුවිය.

කොයි තරම් දුරක් ගමන් කරන්නට සිදුවේද, කොපමණ කාලයක් නතර වෙයිද කියා කිසිවක් නොදැන අවශ්‍ය දේ ගෙන යාමට ඔවුන් සියලු දෙනාටම සිදුවිය.

කොතරම් කෑම වර්ග තිබුණත් ඒ සියල්ල තිබියදී අතර මග ගෙවත්තක ඉදුනු පළතුරක් දුටුවොත් රිය නවතා ඒ පළතුර කඩවාගෙන කෑමට හෝ එවැනි නිවසක තැඹිලි ගසකින් ගෙඩියක් කඩවාගෙන බීමටත් රජුට බොහෝ විට අවශ්‍ය විය. එවැනි දේකට ගෙහිමියා ගෙන් අවසර ගැනීමට අවශ්‍ය නොවූයේ ඒ සියලු ගෙවතු හා නිවාස රජුට අයත් බව ඔහු විශ්වාස කළ නිසාය.

සේවකයන් හට විවේක ගන්නට අවස්ථාවක් ලැබුණේ නැත. රජුට ඔවුන්ගේ වෙහෙස දැනුනේ නැත. ඔහුගේ සුඛෝපභෝගී රිය තුළ කෙතරම් දුරක් ගමන් කළද ඔහුට වෙහෙසක් දැනුනේත් නැත. අතරමග නැවතුනත් සේවකයින්ට විවේකයක් ලබා ගත නොහැකි වූයේ රජුගේ අවශ්‍යතාවන් සපයන්ට වූ නිසාය. භටයින්ට රජුගේ ආරක්ෂාව සඳහා නිරතුරුවම අවධානයෙන් සිටිය යුතු විය. නිලධාරීන්ට ද රජ අසලම රැඳී සිටින්නට සිදු විය.

මද දුරක් ගිය තැන විශාල කුඹුරු යායකට ඔබ්බෙන් කඳු ගැට පෙලක් දක්නට ලැබුණේය. රථ පෙරහර එතැන නවත්වන්ට අණ ලැබුණේය. රජු වාහනයෙන් බිමට බසින විට සේවකයින් කිහිප දෙනෙක් ඔහුට උදව්වීමට ඉදිරිපත් වූහ. එක් සේවකයෙක් වහා කුඩයක් ඔසවාගෙන ඔහු අසලට පැමිණියේය. මේ මහා රණකාමියා, විශ්වයම ජයගත් ප්‍රතාපවත් මහරජතුමාට එක් හිරුරැස් බිඳකින් වත් හිරිහැරයක් වන්න ඉඩ දිය නොහැකි විය.

භටයෝ රජු වටකර සිට ගත්හ. මැසි මදුරු වැනි සතුරෙකුටවත් රජතුමාගේ ශ්‍රීමත් ශරීරය අසලට එන්නට ඉඩ දිය නොහැකි විය. සේවකයින් දෙදෙනෙක් ඉදිරියෙන් ගමන් කළේ රජු ගමන් කළ මග ඇති ගල් කැටයක් හෝ අතු කැබැල්ලක් හෝ තිබුනොත් ඉවත් කිරීම සඳහාය. රජු ගමන් කරන දිසාව අනුමාන කරගත් පසු භට පිරිසක් නිලධාරියෙකුගේ යටතේ ඔවුන් ඉදිරියෙන් විසිරී ඉදිරියට ඇදුනෝය.

ඉතිරි අය මේ පිරිස පිටුපස ගමන් කළහ. ගමේ වැසියෝ කුඹුරේ මහ නියරක් දිගේ ගමන් කරන රජ පෙරහර දෙස ඈතට වී බලා සිටියෝය. කිසිවෙක් ඒ අසලට එන්නට කැමතිවූයේ නැත. කුඹුරුයාය පසුකර අඩිපාරක් දිගේ ඔවුන්ට කන්ද නැගීමට සිදුවිය. තුරු සෙවනට පැමිනි පසු රජු හිසට උඩින් උසවා තිබූ කුඩය පසෙකට තල්ලු කළේය. එය උසුලාගෙන සිටි සේවකයා සැනසුම් සුසුමක් හෙලුවේ මේ ගස් වැල් අතර කෙසේ කුඩය ඔසවාගෙන යන්නදැයි සිතා ගැනීමට අපහසුව සිටි නිසාය. කුඩය ඔසවාගෙන යද්දී බිම තිබූ වැලකට මුලකට පය පැකිලී

sinhalaebooks.com



වැටෙන්නට ගියා නම්, එවිට රජුගේ ශ්‍රී දේහයට අතක් හෝ වැදුණි නම් ඔහුගේ ජීවිතය එතැණින්ම කෙළවර වන්නට ඉඩ තිබිණ.

රජුගේ කෑම බීම හා අනිත් කලමනා ඔසවා ගෙන යන අයට ඒ සහනය ලැබුනේ නැත. ඔවුන්ට ඒ බර උසුලාගෙන ම කන්ද නගින්නට සිදුවිය. කඳු මුදුනේදී ඒ දේවල් අවශ්‍ය වේද නොවේද කියා රජු හැර වෙන කිසිවෙක් දැන සිටියේ නැත. එජු ඒ ගැන කිසිවක් පැවසුවේත් නැත.

ඔවුන්ට ගමන් කරන්නට සිදුවූයේ සතුන් විසින් ඇතිකළ පාරක මිස මිනිසා විසින් සාදාගත් පාරක නොවූයෙන් බොහෝ තැන් වලදී මග හරහා තිබූ අතු ඉති හා වැල් ආදිය කපා ඉවත් කිරීමට ඉදිරියෙන් ගමන් කළ භටයින්ට සිදුවිය. රජුට හිස කෙලින් තබාගෙන යා හැකි ලෙසට පාර පෑදිය යුතු වූ අතර, වැරදීමකින් වත් නටු අත්තක් ගෑවීම නිසා ශ්‍රීමත් රාජ ශරීරයට සීරීමක් වුව සිදු නොවිය යුතු විය. එවැනි ඇබැද්දියක් වුවහොත් ඊට වගකිව යුත්තන්ගේ ගෙල හරහා කඩු පහර නියත විය.

කෙසේ හෝ ඔවුහු කඳු මුදුනට පැමිණියහ.

හැමදෙනාගේම ගමන් විඩාවත් කෝපයත් නිවාලන්නට ඒ කඳු මුදුනේ සිට පෙනෙනා දර්ශනය සමත් විය. ඈත දී නිල් අහස හා ගැටෙනා තෙක් මානය ඝන කැළෑවෙන්ද, සශ්‍රීක කුඹුරු යායන්ගෙන්ද, තැනින් තැන නිල් පැහැයෙන් බැබලෙන කුඩා වැව් සමූහයද හරහා හමා ගෙන ආ සීත මඳ පවන ඔවුන්ගේ ඇඟේ දැවටී මොහොතකට නැවතුනා සේ සියලු දෙනාටම දැනෙනනට විය. මේ තැනිතලාව හරහා තැනින් තැන ගස් අතරින් දිස්වූයේ නිසලව ගලා යන ගංගාවය. එක් තැනක හිරු එලියේ රිදී පැහැයෙන් දිලුනු අතර තවත් තැනක නිල් පාට පීත්ත පටියක් සේ පෙණුනේය. නිදැල්ලේ තණ උලාකන ගවයින් සහ ඒ අවට රැස්වූ කුරුල්ලන්ද විය

'මෙතන තමයි මගේ වැව ඉදිවෙන්නෙ', රජු දෑත් විහිදා ඔවුන්ට මහත් ආඩම්බරයෙන් පැවසීය.

'අර එහා පැත්තේ ඇති කන්ද යාකර වැව් බැම්ම ඉදිකළ විට මේ මුලු ප්‍රදේශයම යටකරගෙන ජලය රැස් කරගත හැකියි' ඔහු යළිත් කීවේය.

'මේ රටේ වෙන කොතැනක වත් මීට වඩා විශාල වැවක ඉදි කිරීමට තැනක් නැති නිසා හැමදාටම මෙය පුරාකවාපිය නම් මහාවාපියම වන්නේය', සියලු දෙනා නිහඬව සිටිනා විට රජු ඔවුන් දෙස නොබලාම යළිත් උස් හඬින් පවසුවේය.

පුරාක යනු රජු ගේ නම වූවත් එය කිසිවෙක් භාවිතා කළේ නැත. ඔහුගේ පිය රජු පමණය ඉඳහිට හෝ එය භාවිතා කළේ. එම නිසා මේ වැවට පුරාකවාපි යැයි නම් කළද සාමාන්‍ය රට වැසියා ඒ නම ඔහුගේ බව දන්නේ නැත. සෙල් ලිපි වල සඳ හන් කළත් ඒ ලිපි කියවීමටද ඔවුන්ට දැනුමක් තිබුනේ නැත.

sinhalaebooks.com



මහ ඇමතියාටවත් වාරි තාක්‍ෂණවේදියාටවත් මේ කිසි දෙයක් වටහා ගත නොහැකි වූ හෙයින් නිහඬව සිටිතැයි සිතා රජු ඔහුගේ අදහස වඩාත් පැහැදිළි කළේය.

'මේ මුලු මිටියාවතම ජලයෙන් යටවෙයි මෙතැන වැව් බැම්ම ඉදි කළොත්', **හගාර** පහත් හඬින් පැවසීය.

'ඇති යාන්තම් ඒකවත් වැටහුනා නම්', රජු සැනසුම් සුසුමක් හෙළුවේය.

'අප අදහස් කලේ එවිට මේ කෙත් වතු, කුඹුරු මේ විශාල වනාන්තරයම ජලයෙන් යටවෙයි'

'ඒක මම දන්නව', රජු පැවසීය. 'ඒක තමයි මට ඕන කරන්නෙ'

'මේ මිටියාවතේ ගම් දහයක් පමණ තියෙනව. ඒ ගම් වැසියො හැම දෙනාම ජීවත් වෙන්නෙ මේ මිටියාවතෙන් ලැබෙන දෙයින්', මහ ඇමති කීවේය.

'එයාලට වෙන ඉඩම් දෙන එකනෙ ඇත්තෙ. මේ රටේ ඕන තරම් මගේ ඉඩම් තියෙන්නෙ', රජ ඒ ගැන කිසි තැකීමක් නොකළේය. 'මේ ගම් වල ඉන්න මිනිස්සු ටික දෙනෙක් නිසා රටේ සංවර්ධනය නවත්වන්න පුලුවන්ද?'

'අගනුවරට අවශ්‍ය ආහාර වැඩි ප්‍රමාණයක් ලැබෙන්නෙ මේ මිටියාවතෙන්'

'මේ වැව ඉදි කළ පසු එමෙන් දස ගුනයක් වගා කරන්න පුලුවන් බව වැටහෙන්නේ නැද්ද?' රජු යළිත් කෝප විය. 'ඇයි මෙතෙක් කල් වෙන කිසි කෙනෙකුට මේ අදහස සිතට ආවෙ නැත්තෙ?' ඔහු **හගාර** දෙස බලා ගෙන ඇසුවේය.

'මේ ගංගාවත් මේ මිටියාවතත් ගැන ඇයි මීට කළින් මට යෝජනා නොකළෙ? ඔබට පැවරී ඇති ප්‍රධාන රාජකාරිය එය නේද?' **හගාර** නිහඬව සිටිනා විට රජු යළිත් ඇසුවේය.

**හගාර** බිම බලාගත් වනම සිටියේ මේ ස්ථානය වැවක් ඉදිකිරීමට සුදුසු තැනක් නොවන නිසා බව රජුට පැවසීමට තරම් ශක්තියක් ඔහු සතු නොවූ නිසාය. මෙතැන වැවක් ඉදි කිරීමට තැත් කළහොත් ඊට විශාල විරෝධයක් නැගෙනු ඇති බවත් එයට මුහුණ දීම අපහසු විය හැකි බවත් පවසන්නට මහ ඇමතිට ශක්තියක් තිබුණේ නැත.

මේ සිදුවන්නට යන්නේ සංවර්ධනයේ නාමයෙන් මහා ව්‍යසනයක් බව එතැන සිටි කා හටත් වැටහිණ.

හොඳ ආහාර වේලක රස විඳින්නට තරම් වැදගත් කටයුත්තක් ඔහු අතින් ඉටු වූ බව සිතාගත් මහරජ ඒ බව සිය අතවැසියන්ට ඉඟි කළේය. ඒ වනවිට කඳු මුදුනේ

sinhalaebooks.com



පැතලි තැනක් බලා එතැන පිරිසිදු කර තිබූයෙන් එතැන වහාම පලසක් එළන ලදී. ඒ පළස මත කුඩා වුවත් සැපපහසු ආසනයක් පනවා ඒ ඉදිරියේ මේසයක් දිග හරින ලදී. ඒ මත සුදු රෙද්දක් එළා කෑම බඳුන් තබන ලදුව ප්‍රධාන අරක්කැමියා පැමිණ රජුට ආහාර පිළිගන්වන ලදී. රජ ආහාර ගත්තේ පහලින් ගලා යන ගංගාව දෙස බලාගෙන ඉදිරි දිනක දකින්නට ලැබෙන මහා වැව පිළිබඳ සිහින දකිමිනි.

දුෂ්කර අඩිපාරක් දිගේ මේ කඳු මුදුනට ඔහුගේ කෑමබීම හා අනිකුත් කළමනා ගෙන ආවේ කෙසේදැයි සිතන්නට රජුට උවමනාවක් නොවීය. සේවකයින් රජුට ආහාර පිළිගැන්වූයේ වෙව්ලන දෑතින් ය. හිමිදිරි පාන්දර පිසන ලද ආහාර රජු බලාපොරොත්තුවන තරමට උණුසුමට ඇති දැයි ඔවුන්ට සිතාගත නොහැකි විය.

රජු කිසිත් නොකියා කෑම කෑවේ ඒ සියල්ල ඔහුට අවශ්‍ය ලෙසින් තිබූ නිසාද නැතිනම් හිතේ ඇති සතුට නිසා ඒ ගැන තැකීමක් නොකළ නිසාද විය හැකිය. ඔහු බුලත් විටක් කෑමට ගත් පසු නිළධාරීහු කෑමට අවසර ඉල්ලා සිටියහ. ඔවුහු රජු වාඩිවී සිටි තැනින් මදක් පහලින් ගල් තලා මත හෝ ගස්මුල් මත හිඳ ආහාර ගත්හ. සේවකයින්ට නම් ආහාර ගැනීමට අවස්ථාව පැමැණියේ ඉන් පසුවය.

'හරියටම අවුරුද්දක් තියෙනව සැලැස්ම හදල මේ වැව ඉදිකරල අවසාන කරන්න. මගේ මීළඟ උපන් දිනයට මේ වැවේ ජලය පිරවීමට මට අවශ්‍යයි. මේ පූරාක මාහාවාපිය එතැන් සිට මගේ රටවැසියන්ට අවශ්‍ය ජලය හැමදාමත් සපයන්න ඕන'

'මහ ඇමති, මේ කටයුත්ත නිසිපරිදි නිමාකිරීම ඔබේ වගකීම', රජු ආසනයෙන් නැගිටිමින් පැවසීය.

රේටා ආපසු යන ගමන කිසි කෙනෙකුන් සමග කතා කළේ නැත. ඔහුගේ සිත යෙදී තිබුණේ මේ නව ව්‍යාපෘතිය ගැනය. ඒ සඳහා අවශ්‍ය මිනිස් බලය සොයා ගැනීම වඩාත්ම අසීරු කරුණ ලෙස ඔහුට සිතුනේය. වාරිතාක්ෂණවේදියා ගෙන් එතරම් සහයෝගයක් ලැබෙතැයි ඔහු විශ්වාස නොකළේය. ඒ අතරම මහ ඇමතිට වහාම අවශ්‍ය වූයේ මිනුම් කරුවන් හා තවත් පළපුරුදු වාරිතාක්ෂණවේදීන් කිහිප දෙනෙකි. අනිකුත් තාක්ෂණික නිලධාරීන් හා වැඩ පරීක්ෂකවරුන් සොයාගැනීමත් ඉදිකිරීම සඳහා අවශ්‍ය ගල්, වැලි, පස් සහ අනිකුත් ද්‍රව්‍ය සොයාගැනීම සඳහා නිලධාරියෙක්ද ඔහුට අවශ්‍ය වනු ඇත. හමුදා ප්‍රධානියා සහභාගි කරවා ගතහොත් මේ ප්‍රශ්න සියල්ලම පහසුවෙන් විසඳා ගත හැකි බව ඔහුට සිහි විය. මේ කටයුතු වලින් උපයා ගත හැකි ධනය නිසා හමුදා ප්‍රධානියා එක සිතින් මේ ව්‍යාපෘතියට සහයෝගය දක්වන්නට ඉදිරි පත් වන බව රේටා හොඳින් දැන සිටියේය.

නියමිත දිනට වැවේ සියලු ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතු බවත්, කිසිම හේතුවක් නිසා එය අසාර්ථක නොවිය යුතු බවත් ඔහු තීරණය කළේය. යම් හෙයකින් එය ඉටු කළ නොහැකි වුවහොත් සිය දිවි නසාගැනීම පමණක්ය ඔහුට

sinhalaebooks.com



ඉතිරි වන්නේ. රටේ ජනතාව ඉදිරියේ අපහාස විඳින්නටත්, රජුගේ නියමයෙන් වද හිංසා මැද මරණයට පත් වන්නටත් ඔහු සූදානම් නොවීය.

වැව ඉදිරීමට මුදල් ලබා ගැනීමත් ගැටලුවක් විය හැකි බව ඔහුට වැටහිණ. මාලිගාව සෑදීමට වැය වූ මුදල මෙන් දස ගුණයකටත් වඩා මේ සඳහා වැය විය හැකි බවත්, කඩිනම් වැඩපිළිවෙල නිසා එය තවත් කිහිප ගුණයකින් ඉහල යා හැකි බවත් ඔහු දැන සිටියේය. එතරම් විශාල ධනස්කන්ධයක් භාණ්ඩාගාරයේ නැති බව ඔහු දැන සිටියේය. එහෙයින් මේ මුදල සොයාගැනීමට සිදුවන්නේ තව තවත් රට වැසියාගේ බදු මුදල් වැඩි කිරීමෙන්ය.

ඔහු නිදහස් හා විවෘත මනසකින් මේ රාජකාරිය ඇරඹිය යුතු බව වටහා ගත්තේය. මෙතෙක් පැවති සම්ප්‍රදායන් සහ වාරි කර්මාන්ත වලදී මෙතෙක් අනුගමනය කළ ප්‍රතිපත්ති සහමුලින්ම අමතක කර දමා අලුත් ක්‍රම සොයා ගන්නට ඔහු තීරණය කළේය. ඒ සඳහා කාලසටහනක් ඔහු සිතා ගන්නට විය. පළමුවෙන්ම මේ ව්‍යාපෘතිය භාරව කෙනෙක් පත් කරගත යුතුය. ඔහුට අගනුවර සහ රජවාසලේ කටයුතු තිබියදී වැඩබිමේ කල්ගත කිරීමට හැකියාවක් නැත. එම නිසා ඔහු වෙනුවෙන් කෙනෙක් වැඩබිමේ රැඳී සිටිය යුතු විය. නිතිපතා ඔහුට ව්‍යාපෘතියේ වැඩකටයුතු කිසිවක් නොසඟවා වාර්තා කිරීමටත් ඔහුට පමණක් හිතවත් වූ අයෙක් ඔහුට මේ සඳහා අවශ්‍ය විය. ඔහුගේ ජීවිතය මේ පුද්ගලයා අතට දෙන්නට ඔහුට සිදුවේ.

'ප්‍රගති අන්වේෂක'[1]. මේ වගකිවයුතු තනතුරට සුදුසු නාමය ලෙස මහ ඇමති තීරණය කළේය.

ඊළඟ ගැටලුව වූයේ තනතුරට සුදුසු පුද්ගලයකු සොයා ගැනීමය. ඔහු දන්නා නිලධාරීන් එකිනෙකා ගැන ඔහු කල්පනා කළේය. ඔවුන්ගේ දක්ෂතා සහ පක්ෂපාතීත්වය ගැන තක්සේරු කළේය. ඒ රාජ්‍ය නිලධාරීන් අතරින් කිසිවෙකු මේ තනතුරට සුදුසු නැති බවය ඔහුට අවසානයේ තීරණය කරන්නට සිදුවූයේ.

එදින රාත්‍රී ඔහු මේ ගැන බිරිඳ සමග කතා කළේය. ඔහුගේ තනතුරත් ජීවිතයත් පිළිබඳ වූ ප්‍රශ්නයකදී ඔහුට විශ්වාසීවූ වෙන කිසිවෙක් සිටියේ නැත. ඔහුගේ තනතුරට ඇස ගසාගෙන සිටිනා ඇමතිවරුන් කිහිප දෙනෙක් ගැන ඔහු දැන සිටියේය. ඔහුගෙන් පලිගැනීමට අවස්ථාවක් බලා සිටි සතුරන්ද රට තුළ පමණක් නොව රාජ්‍ය සභාවේද වූහ. උසස් තනතුරු වල සිටි වෙනත් නිලධාරීන් මෙන් නොව මහ ඇමති සිය බිරිඳ ගැන විස්වාසයක් පමණක් නොව ඇගේ තීක්ෂණ බුද්ධියත් අගය කළේය. ඔහුගේ රාජකාරි කටයුතු ගැන රාත්‍රියේදී ඇය සමග කතා කිරීමටත්, සමහර අවස්ථාවල ඇගේ අදහස් විමසා ඒ අනුව කටයුතු කරන්නටත් ඔහු පුරුදු වී සිටියේය. රජ සභාවේ ඇමති වරුන් ට වඩා තැනට සුදුසු නුවනත් ප්‍රායෝගික අදහසුත් ඇය සතුවිය.

---

1

Progress Chaser (සුචරිත ගමලත් ශබ්දකෝෂය)

sinhalaebooks.com



'හොඳටම විශ්වාසද මේ ගැන සුදුසු හැම දෙනාම ගැන හිතුව කියල?' ඇය ඇසුවාය. එවැනි අවස්ථාවලදී ඇය ඔහු සමග කතා කළේ ඔහුගේ කීකරු බිරිඳ ලෙස වත්, දරුවන්ගේ අම්මා ලෙස වත් නොව ඔහුගේ සහකරුවා ලෙසය.

ooooo

'මං කිහිප වතාවක්ම හැම කෙනෙක් ගැනම හිතුව, හැම නිලධාරියෙක්ම, නගරයේ හැම වැඩිහිටියෙක් ම ගැන'

'අපේ වෙළඳ නායකයින් ගැන හිතුවද? සමහර විට තරුණ වෙළෙන්දො ඇති හොඳ දක්ෂකම් තියෙන'

'ඉන්න පුලුවන්. ඒ උනාට මට ඒ අය විශ්වාස කරන්න පුලුවන්ද? ඒ අය එක්කො මේ වැඩෙන් තමන්ට මුදලක් හොයා ගන්න බලාවි. නැත්නම් කවද හරි මාව අමාරුවෙ දාන්න බලාවි. මගේ හතුරෙක් එක්ක එකතු උනොත් මාව විනාස කරන්න පුලුවන් එහෙම කෙනෙකුට'

'මේ වෙළෙන්දො අතරෙ එක්කෙනෙක් වත් නැද්ද විශ්වාස කරන්න පුලුවන් කෙනෙක්'

'වෙළෙන්දො අතරෙ කොහොමටවත් ඉන්න බැහැ. අවංක මිනිහෙකුට කවදාවත් වෙළඳාම් කරල දියුණු වෙන්න පුලුවන් කියල මං හිතන්නෙ නැහැ'

'ඉතිං මොනවද කරන්න යන්නෙ?' ඔහු අසල පිල මත වාඩිවී සිටි බිරිඳ ඇසුවාය. රාත්‍රියට දරුවන් නින්දට ගිය පසු ඔවුන් දෙදෙනා මෙතැන වාඩිවී සිටීම පුරුද්ද වී ඇත. වැව මතුපිටින් හමා එන සිසිල් මද පවන ගෙවත්තේ පිපි මල් සුවඳ සමග ඔවුන්ගේ ගතටත් සිතටත් මහත් සැනසුමක් ගෙන දුන්නේය.

'විසඳුමක් සොයා ගන්න වෙනව කොහොම හරි'. ඔහු ටික වෙලාවක් නිහඬව සිට පැවසුවේය. 'මට එතන ඉන්න පුලුවන් උනානම් වෙන කවුරුවත් ඕන නැහැ. ඒත් එතකොට මෙහේ රාජකාරි බලාගන්නෙ කවුද? ඒ වැඩ නම් කාටවත් පවරන්න බැහැනෙ'

'මං දන්නව ඔයා හිතන දේ. අපට පුතෙක් හිටියා නම් මේ වගකීම ඔහුට පවරන්න පුලුවන් කියල නේද' ඇය පැවසුවේ මිදුලේ වූ මල් පඳුරු දෙස නෙත් යොමා ගෙනය. පුතෙක් ලබන්නට ඔහු කෙතරම් බලාපොරොත්තු අතිව සිටියා දැයි ඇය දැන සිටියාය. දූ වරුන් දෙදෙනා නිසා ඔහුගේ බලාපොරොත්තු කඩවීමක් සිදුවූ බවද ඇය දැන සිටියාය.

'අපේ දූ දෙදෙනා මට පන වගේ බව ඔයා දන්නවනේ. මං ඇත්තටම හරිම වාසනාවන්ත තාත්ත කෙනෙක් කියල මට හිතෙනව'

'ඔය රාජකාරියට හොඳම එක්කෙනා පූනා තමයි', ඇය හිටිවනම පවසා සිටියාය.

sinhalaebooks.com



'පූනා?' රේටා සිය බිරිඳ දෙස බැලුවේය. 'අපේ දූව? කොහොමද අපි ඒ පොඩි කෙල්ල එහෙම දුර බැහැර තැනකට යවන්නෙ?'

'ඇයි බැරි? ඒ දරුව පුතෙක් උනා නම් ඔයා යවනවනෙ'

'පුතෙක් වගේ නෙවෙයිනෙ. කොල්ලෙක් වගෙ නෙවෙයි නෙ. ඒ වගේ දුෂ්කර තැනක ඒ වගේ බරපතල වැඩක් බාරදෙන්නෙ කොහොමද'

'මට විශ්වාසයි අපේ දරුව ගැන. ඔය වගකීම බාර ගන්න පුලුවන් කියන එක. ඊටත් පූනට වඩා ඔයාට විශ්වාස කරන්න පුලුවන් කෙනෙක් කවුද මේ රටේ ඉන්නෙ?'

'කවදාවත් අහල වත් නැති දෙයක්. දූවගෙ තැන තියෙන්නෙ ගෙදර. ඊළඟට එයාගෙ ස්වාමියගෙ ගෙදර. දැන් කාලෙ හොඳයි මං හිතන්නෙ හොඳ තැනකින් තරුණයෙක් සොයාගන්න' ඔහු සම්ප්‍රදායානුකූල ඉහල පන්තියේ පිරිමියෙකු ලෙස සිතන්නට වූයේ යැයි බිරිඳට සිතුණේය.

ඇය නිහඬ වූවාය. ඔහුගේ සිතට ඇයගේ අදහස ඇය ඇතුල් කළාය. එය මෝරා වැඩෙන්නට කාලය අවශ්‍ය විය. මේ ව්‍යාපෘතිය සඳහා ඔවුන්ගේ වැඩිමහල් දියනියට වඩා සුදුසු කෙනෙක් සොයාගැනීමට සැමියාට නොහැකි බව ඇය දැන සිටියාය.

පසුදා උදය ප්‍රධාන වාරිතාක්ෂණවේදියා වූ **හගාර** මහ ඇමති හමුවීමට පැමිණියේය. **හගාර** ඇමතිගේ උපදෙස් වලට නිහඬව සවන් දීගෙන සිටියේය. මහ ඇමති විසින් යළි යළිත් අවධාරණය කරන ලද්දේ නියමිත දිනට ව්‍යාපෘතිය නිම කිරීම ගැනය.

පෙර දිනයේ සිටම **හගාරා** ගේ සිත තුළද මහත් බියක් පහල වී ඇත. ඔහුට මාලිගය ඉදිකළ ගෘහනිර්මාණ ශිල්පියා සිහිවිය. ඔහුගේ ඉතා සමීප මිතුරෙකු වූ සන්ධ මාලිගය ඉදිකරද්දී ඒ ගැන බොහෝවිට **හගාර** සමග කතා කළේය. එකල **හගාර** සිතුවේ ඔහු ගෘහනිර්මාන ශිල්පය ඉගෙන ගෙන සිටියා නම් ඔහුත් සන්ධ සිටි අවදානම් තත්වයට පත් වන්නට ඉඩ තිබූ බවය. ඔහුට එවැනි අනතුරුදායක රාජකාරියක් නොයෙදීම ගැන ඔහු දෙවියන්ට ස්තුති කළේය. මාලිගය නිම කළ විගසම සන්ධ ඔහුගේ දරු පවුලත් සමග රටින් පිටවී ගියේය. ඒ ගමන පිළිබඳව දැන සිටියේ **හගාර** සහ තවත් මිතුරන් දෙදෙනෙක් පමණය.

**හගාර**ට මේ වන විට සිතට ආවේ ගෘහනිර්මාන ශිල්පියා වඩා වාසනාවන්ත බවය. දැන් **හගාර**ට පැවරී ඇති රාජකාරිය අනුව බැලුවිට සන්ධට පැවරී තිබුණේ ඉතා පහසු කාර්යයකි. එය නිම කර ජීවිතයත් බේරාගෙන රටින් පිටවන්නට සන්ධට හැකි විය. **හගාර**ටත් එවැනි වාසනාවක් පහළ වේදැයි මහ ඇමතිට සවන් දෙන අතර ඔහු කල්පනා කළේය.

sinhalaebooks.com



'හෙටම මං මිනුම් කරුවන් එක්ක යන්නම්' **හගාර** කීවේය.

'අද හවසම පිටත් වෙන්න පුලුවන් නම් වඩා හොඳයි. එතකොට නවාතැනට මඩුවත් හදාගෙන රෑ විවේක අරගෙන උදේ පාන්දරම වැඩ පටන් ගන්න පුලුවන් වෙයි. නැත්නම් හෙට දවස ගමනටයි ඉන්න තැන පිලියෙල කර ගන්නයි ගතවේවි' මහ ඇමති කීවේය. 'හැම දවසක්ම, හැම පැයක්ම, හැම විනාඩියක්ම අපට හරියට වටිනව. අපේ ජීවිතය වගේ වටිනව'. ඔහු **හගාර**ට සිහිපත් ළේය.

**හගාර** නිහඬව සිටියේය.

'ඇයි ප්‍රශ්නයක් තියෙනවද'

'ප්‍රශ්නයක් නම් නැහැ'

'මං භාන්ඩාගාරෙට උපදෙස් දීලයි තියෙන්නෙ ගමනටත් එතැන නවාතැනටත් අවශ්‍ය සියලු පහසුකම් සලසා ගන්න අවශ්‍ය මුදල් දෙන්න කියල. හමුදා ප ධානියාට කියල තියෙන්නෙ වැඩටත් ආරක්‍ෂාවටත් අවශ්‍ය පිරිස ලැහැස්ති කරන්න කියල. තවත් සේවක පිරිස් අවශ්‍ය නම් අහල පහල ගම් වලින් ලබා ගන්න පුලුවන්'

එදින සිටම වැඩ අරඹන බව දැන ගත් රජු තරමක් සතුටට පත්විය.

'සැලැස්ම ඇඳ අවසන් වූ වහාම මට බලන්න අවශ්‍යයි' ඔහු පැවසීය.

පසුදා අලුයම රේටා මහාවාපි වැඩ බිම බලා පිටත් වීය. ඒ කඳු ගැටයටත් නිම්නයටත් ගැමියන් භාවිතා කළ නම් ඔහු දැන සිටියෙ නැත. කෙසේ වුවත් මෙතැන් සිට එය පුරාකවාපිය හෙවත් මහාවාපිය නම් විය යුතු බව ඔහු දැන සිටියේ. ඔහු මේ ගමනට බිරිඳත් දූන් දෙනොත් කැටිව ගියේය. මෙය දැරියන් දෙනොට මහත් පුදුමයක් වූයේ ඔවුන්ගේ පියා කිසි දිනක රාජකාරි ගමන් වලදී ඔවුන් කැටුව නොයන නිසාය. එහෙත් ඇය සැමියාගේ සිතට ඇතුල් කළ අදහස කෙමෙන් වැඩෙන බව බිරිඳට වැටහී ගියෙන් ඇය ඒ ගැන කිසිවක් සඳහන් කළේ නැත.

ඔවුන් යන මග දෙපස ඇති වැදගත් වූ හා සිත්ගන්නා වටපිටාව ගැන රේටා දියනියන් දෙදෙනාට විස්තර කළේය. දැරියන් දෙදෙනා බොහෝ කලකින් මේ මාවතේ ගමන් කර තිබුණේ නැත. ඔහු මව අසලින් හිඳ සිටි පූනා දෙස නෙත් යොමු කළේය. ඔහු ඇය තුළින් දුටුවේ තරුණ වයසේදී ඔහු දුටු ඔහුගේම බිරිඳය. පූනා ඒ වන විට හොඳින් වැඩුන ලස්සන තරුණියක වී ඇති බව ඔහුට සිහි විය. ඇය ඉතාමත් නැනවත් බවත් තීක්‍ෂණ බුද්ධියකින් යුතු බවත් ඇයගේ ආචාර්ය වරුන්ද කිහිප විටක පැවසූ බව ඒ සමගම ඔහුට සිහිවිය.

sinhalaebooks.com



මහාවාපිය ගැන රජුගේ සිහිනය රේටා දැරියන්ට පැහැදිළි කළේය.

'මං හිතා හිටියෙ අපට මේ පළාතට තවත් මහ වැව් අවශ්‍ය නැහැ කියලයි' පූනා පැවසුවාය.

'අපට අවශ්‍ය තරම් ජලය තියෙන බව ඇත්ත. ඒ උනත් වැඩිපුර රැස් කරන එකත් හොඳයි. බලාපොරොත්තු නැති විදිහට දිග නියඟයක් හෙම ආවොත්. අපට වැඩියෙන් වගා කරන්නත් පුලුවන් වෙනව එවැනි අවස්ථාවකට ගන්න ගබඩා කර තියාගන්න'

'එහෙනම් අපට හාල් අපනයනය කරන්නත් පුලුවන් වෙයි', බාල දියනිය අභි පැවසුවේ ඇය උගත් යමක් සිහිවීමෙන්ය.

'වැවක් ඉදිකරන්න අවශ්‍ය නම් ඒකට වඩා සුදුසු අගනුවරින් ඈත ප්‍රදේශයක කියලයි මට හිතෙන්නෙ. ඒ පළාත් වල මිනිස්සුන්ගෙත් ජීවන තත්ත්වය දියුණු කරන්න' පූනා එකතු කළාය.

'මේ වැව ඉදිකළාට පස්සෙ තවත් එහෙම වැව් ඉදිකරන්න තමයි රජතුමාගෙ අදහස'

කඳු මුදුනට නැග ගත් පසු පූනාත් අභිත් දෙදෙනාම අවට පරිසරයේ චමත්කාරත්වය ගැන විස්මයට පත්වූහ.

'මේ නිම්නය ජලයෙන් පිරුනාම මීටත් වඩා ලස්සන වෙයි' රේටා පැවසීය.

'මේ වැව තාත්තගෙ යෝජනාවක්ද?' පූනා ඇසුවාය.

'නැහැ. රජතුමා තමයි මෙතැන තෝරාගත්තෙ'

'මේ ලස්සන මිටියාවත සේරම ජලයෙන් යටවෙලා මේ ගහ කොල විනාස වෙන්නද යන්නෙ?', අභි ශොකාත්මක හඬකින් ඇසුවාය.

රේටා ඇය දෙස බැලුවේ පිළිතුරක් දී ගත නොහැකිවය.

'දැන් කාටත් බඩගිනි ඇතිනෙ. ඊටත් මේ උදේ පිළියෙල කළ කෑම. අපි කෑම කමුද', කතාව වෙනතකට යොමු කරන අදහසින් ඇයගේ මව දිවා ආහාරය ගැන සිහි පත් කළාය.

පූනා දිගින් දිගටම මේ වැව ගැනත් එය ඉදිරිකරනා සැලසුම් ගැනත් පියාගෙන් විස්තර ඇසුවාය. ඇයට මේ ව්‍යාපෘතියේ වැඩ කිරීමට හැකි බව පෙන්වන්නට

sinhalaebooks.com



ඇගේ මව විසින් ඇය පොළඹවන්නට ඇතැයි සියුම් සැකයක් මහ ඇමති තුළ ඇති වුවද දියනියගේ අහිංසක මුහුණ දුටුවිට ඇය එසේ යටි සිතේ කිසිවක් සඟවාගෙන කතා නොකරන බව ඔහුට සහතික විය.

'ලොකු දූවට සමහරවිට මට සහාය වෙන්න පුලුවන් කියල මට හිතෙනව. ඒත් ගෙදර ඉඳ කළ හැකි දෙයක් විතරයි. වැඩ බිමට ඇය යවන්නට බැහැ', එදින රාත්‍රී මහඇමති බිරිඳට පැසුවේය.

'එහෙම සීමා පනවන එක දූවට කරන අසාධාරනයක් වෙනවනෙ. දූවගෙන් සේවය අවශ්‍ය වෙනව නම් එයාට ඉඩ දෙන්න ඕන එයාගෙ උපරිම හැකියාවෙන් ඒ වැඩ කටයුතු කරන්න'

'ඒ උනාට කොහොමද මං ඒ දරුව ඒ වගේ තැනකට යවන්නෙ?'

'ඒක ප්‍රශ්නයක් කර ගන්නෙ ඇයි. දැන් පූනා ඔයාගෙ හුරතල් පොඩි දූව නෙවෙයි. දැන් එයාට තනියම හිතන්න තනියම වැඩ කරන්න පුලුවන්. අපට පුතෙක් හිටිය නම් ලැබෙන නිදහස දූවටත් ලැබෙන්න ඕන නේද' ඇය එසේ කියා නිහඬ වූයේ වැඩි දුර කතා කිරීම අවශ්‍ය නැති බව දැන සිටි නිසාය.

පාන්දර උණු කොලකැඳ කෝප්පයක් ගෙනැවිත් දුන් පූනා දෙස මහ ඇමති මොහොතක් බලා සිටියේය.

'දූව කැමතිද මහාවාපි ව්‍යාපෘතියෙ වැඩ කරන්න?' ඔහු එක් වරම ඇසුවේය.

පූනා අඩියක් පස්සට තැබුවේ පියා ගේ කතාව අදහා ගන්නට බැරුවා සේය. ඇය තාත්තා දෙස බලා සිටියේ ඒ ගැන වැඩි යමක් කියන තුරුය. ඇයගෙන් තාත්තා පිළිතුරක් බලාපොරොත්තු වූවාදැයි ඇය නොදත්තාය. ඇගේ මව ඒ සමගම ආලින්දයට ආවාය.

'මං දූවගෙන් ඇහුවෙ කැමතිද කියල මහාවාපියෙ වැඩ කරන්න' රේටා බිරිඳට කීවේය.

අම්මා දූව දෙස බැලුවාය.

'මං නං හරි ආසයි' පූනා සිනාසුනාය. 'ඒත්', ඇය මව දෙසට නෙත් යොමු කළාය.

'ඒත් මොකක්ද?'

'මොනවද මට කරන්න තියෙන වැඩ? මං වාරිතාක්ෂණය ඉගෙන ගෙන නැහැනෙ'

sinhalaebooks.com



'මට අවශ්‍ය වෙලා තියෙන්නෙ 'ප්‍රගති අන්වේෂක' යෙක්. ඒ කියන්නෙ මේ ව්‍යාපෘතියෙ ප්‍රගතිය මොහොතින් මොහොත ලුහුබඳින්න කෙනෙක්. නැතුව අවුරුද්දක් ඇතුළත මේ වැව ඉදිකරන්න බැහැ. දැනටම දවස් තුනක් ගෙවිල ගිහින්. මට ඕන මහන්සිවෙලා වැඩ කරන්න පුලුවන් මට විශ්වාසය තියන්න පුලුවන් කෙනෙක්. මට තාක්ෂණවේදීන් ඉන්නව. එත් මට ඕන කරන්නෙ හොඳ මොළයක් තියෙන, ඒ මොළෙන් හරියට වැඩ ගන්න පුලුවන්, මට සම්පූර්ණයෙන්ම පක්ෂපාති කෙනෙක්'

'මට මහන්සිවෙලා වැඩ කරන්න පුලුවන්. මගේ වයසෙ ඕනම කොල්ලෙකුට වඩා වැඩියෙන් උනත්' පූනා පැවසුවාය.

'වැඩ තරන්න පුලුවන් බව මං දන්නව දූව. ඒ උනාට මෙතන තව ප්‍රශ්නයක් තියෙනව. ගෙදර ඉඳල දිනපතා වැඩබිමට යන්න බැහැ. ඒ හින්ද එතැන නවතින්න වෙනව. සතියකට දින කිහිපයක් හරි'

'ඒක ප්‍රශ්නයක් වෙන්න බැහැනෙ තාත්තෙ. මට ඕනෑම තැනකට, වැඩකට හැඩගැහෙන්න පුලුවන් බව අම්මත් තාත්තත් දන්නවනෙ'

'අපි ඒක දන්නව, ඒ උනාට වැඩකඳවුරේ ගැහැණු දරුවෙකුට නවතින්න තරම් පහසුකම් නැහැනෙ. කඳවුරේ වෙන කිසිම ගැහැණු කෙනෙක් වත් නැහැ'

පියා විසින් දැන් ඇය වැඩුණු තරුණියක ලෙස පිළිගැනීම ගැන පූනා මහත් සතුටට පත්වූවාය.

'දූවට ගමේ ගෙදරක නවතින්න පුලුවන් ඇති. ගම්බාරයට කතා කළානම් හොඳ නැද්ද' මෙතෙක් නිහඬව සිටි අම්මා පැවසුවාය.

'ඉතින් මං මොනවද කරන්න ඕන. මං වැඩ පටන් ගන්න ලැහැස්තියි'

'දැන් ඉතින් තාත්තට සැනසිල්ලක් ලැබෙන එකක් නැහැ වැඩ ටික පවරන කම් මේ අලුත් ප්‍රගති නිලධාරිනියට' අම්මා සිනාසුනාය.

'මට අදත් වැඩබිමට යන්න තියෙනව. යමු මාත් එක්ක. මගදි මං විස්තර කියන්නම්'

ගමනට සැරසෙන්නට ඇය වහා ගෙතුළට දූව ගියාය.

පිටත්වන්නට පෙර පූනා තාත්තාටත් දෙවනුව අම්මාටත් වැඳ ඔවුන්ගෙ ආශීර්වාද ලබාගත්තාය. අභි දූවවිත් තාත්තාටත් වැඩිමහල් සොහොයුරියටත් වැන්දාය.

sinhalaebooks.com



'පොඩි දුවගෙ ඉගෙනීම අවසන් කළාම දුවටත් වාරය ඒවි' මහඇමති අහිගේ හිස පිරිමැද කරත්තයට නැංගේය.

# 5.

කඳවුර පිහිටුවා තිබුණේ ඔවුන් පෙරදා කඳු මුදුනට හැරුන තැනට මඳක් ඈතින් ගඟ අසලට වෙන්නටය. ඒ වනවිට වාහන ගමන පහසු කරන්නට වැඩබිම තෙක් පාරක් සාදා තිබුණේය. රජු යළිත් මෙහි පැමිණෙන විට ඔහුට වැඩි දුරක් පා ගමනින් යන්නට අවශ්‍ය නොවනු ඇත.

කඳවුරේ සිටියේ අරක්කැමියකු පමණය. අනිත් සියලු දෙනාම වැඩකටයුතු සඳහා පිටත්ව ගොසින්ය. පූනා තාත්තා පිටුපසින් කැලය මැදින් පාදා තිබූ මගක් ඔස්සේ මිනුම් කරුවන් සොයා ගමන් කළාය.

ඇය දකින්නට අසන්නට ලැබුන සියලු දෙයම සිත තුළ ගබඩාකර ගත්තේ ඉන් අවශ්‍ය දේ කුමක්ද නැද්ද කියා තීරණය කිරීමට අපහසු නිසාය. එහෙත් මේ සෑම දත්ත බිඳක්ම කවදා හෝ අවශ්‍ය වෙතැයි ඇය විශ්වාස කළාය.

මැදිවියේ පුද්ගලයෙක් මහඇමති ඉදිරියට පැමිණියේය. ඔහු ඒ අසල වූ දෙල්වට නම් ගමේ ප්‍රධානියා බව පවසා සිටියේය. ගමේ සියලු පිරිමි මේ වැඩබිමේ රාජකාරි සඳහා අනුයුක්ත කර තිබිණ.

'රාජකාරි කටයුතු අවසන් වූ විට අපේ ගමට යහපත් උනානම් දවල් ආහාර සඳහා' ඔහු හිස නමා ආරාධනා කළේය.

'ගමට කෙතරම් දුරද?'

'වැඩි දුරක් නැහැ. මේ කුඹුරු යායෙන් ඔබ්බෙ තමයි ගම්මණ්ඩිය'

'අපි ගෙදරින් දවල් කෑම අරගෙනයි ආවෙ', මහ ඇමති පැවසීය.

'ඒ උනාට අපේ ගමේ කෑම ටිකක් රස බලන්න පුලුවන් නම්'

'හොඳයි මේ වැඩ කටයුතු ඉවර උනාම බලමු'

මහඇමති ප්‍රධාන මිනුම්කරුටත් තාක්ෂණවේදියාටත් කතා කළේය. මිනුම් කටයුතු අවසන් කළ හැකි දිනයත්, පස පරීක්ෂාකර වැව් බැම්ම සෑදීමට යෝග්‍ය මග සලකුණු කිරීමටත් ගතවිය හැකි කාලයත්, වැඩ ඉක්මන් කර එම කාලය අඩු කරගැනීමට හැකි ක්‍රම ගැනත් ඔවුහු සාකච්චා කළහ. දැනටමත් සේවක පිරිස් හඳ

sinhalaebooks.com



ුනාගත් ස්ථාන වල පොළොව සිදුරුකර පස් පරීක්ෂාකරමින්, ගල්තට්ටුව මතුවන්නට ඇති ගැඹුර සොයමින් සිටියහ.

'අපට බැම්මේ වැඩ අරඹන්න කොයිතරම් දවසක් ගතවේද' රේටා ඇසුවේය. 'මට කාලසටහනක් අවශ්‍ය වෙනව. ඊළඟට අවශ්‍ය වෙනව ගල්, පස්, දැව කොයිතරම් උවමනා වෙයිද කියල අනුමාන වශයෙන් හරි'

'අපට ගල් කණුත් අවශ්‍ය වෙනව. ප්‍රමාණය තීරණය කරන්න පුලුවන් වෙන්නෙ පස් පරීක්ෂා කිරීමෙන් පසුවයි', **හගාරා** පැවසීය.

'මං අතිද්දා ආපසු එනව. වැඩ කරගෙන යන්න. රජතුමා කොයිවෙලාවෙ සැපත්වේද කියන්න අපහසුයි' ව්‍යාපෘතියේ සියලු දෙනා කඩිසරව තැබීමට ඔහු පවසා සිටියේය.

කුඹුරේ නියර දිගේ ගම්බාරයා පසු පස ගමන් කළ රේටා සහ පූනාට ටික වෙලාවකින් බල්ලන් බුරන හඬ ඇසෙන්නට විය. ගම ඇස ගැටෙත්ම කුඩා දරුවන්ගේ කෑ කෝ ගසනා හඬද එක්විය. ගම් ගොඩේ එක ගෙයක් අනිත් ඒවායෙන් කැපී පෙනුනේ එහි විශාලත්වයත් ගෙමිදුලේ දැකුම්කලු බවත් නිසාය.

ඒ ගම්බාරයාගේ නිවස විය.

පිල මත එලන ලද පැදුරක් මත ඔවුන් දෙදෙනාට වාඩිවෙන්න ආරාධනා කරනු ලැබීය. ගම්බාරයාගේ බිරිඳ බුලත් වට්ටියක් ගෙනැවිත් මහඇමති අසලින් තැබුවාය. ඉන් පසුව ඇය තැඹිලි ගෙඩි දෙකක් කපා ඔවුන්ට පිළිගැන්වූවාය.

'මේ ඇත්තන්ගෙ දරුවො?' මහඇමති ඇසුවේය.

'දැන් අපට ඉන්නෙ දුව විතරයි. අපේ පුතා නැතිඋනා දැනට අවුරුදු දෙකකට කලියෙන්'

මහඇමති වට පිට බැලුවේය. දෙවියන් ඔහු දෙස බලා ඇති බවක් ඔහුට සිතුණේය. පූනාට මේ නිවසේ නැවතිය හැකියැයි ඔහු සිතුවේය. ගෙදර තරුණිය දුටුවිට ඒ බව තීරණ කළ හැකිවනවා ඇත. වැඩබිමට මෙතරම් නුදුරින් මෙවැනි නිවසක් හමු වේයැයි ඔහු බලාපොරොත්තු නොවීය. ඔහු පුරුදුවී සිටියේ ප්‍රථම මුණගැසීමෙන් කෙනෙක් හඳුනාගෙන අවශ්‍ය තීරණ ගැනීමටය. මෙතෙක් කලකට ඔහුගේ තීරණ වැරදී නැත.

'මගේ දුවට මේ ව්‍යාපෘතියෙ රාජකාරි පැවරිලා තියෙනව' මහඇමති පැවසූවිට ගම්බාරයා පූනා දෙසට හැරී හිස පහත් කළේය.

sinhalaebooks.com



'නිතර මෙහි එන්නට වෙයිද'

'මේ මහාවාපිය ඉදිකිරීම් අවසාන වනතුරු හැමදාමත් රාජකාරි කරන්න වෙයි'

'අගනුවර ඉතා දුරයි දිනපතා ගමන් කරන්නට. කඳවුරේ නවතින්නත් පහසුකම් නැතුවා ඇති. අපේ මේ කුඩා නිවසේ නවතින්න පුලුවන්', ගම්බාරායා කිවේ බිරිඳ දෙස බලා ඇගේ කැමැත්ත දැනගෙනය.

'ඔබලාට එහෙම කරදර කරන්න මං කැමති නැහැ'

'කරදරයක් වෙන්නෙ නැහැ. අනික අපටත් විශාල නම්බුවක් මෙවැනි උත්තම පවුලක දරුවෙක් අපේ ගෙදර නවතින එකත්'

රේටා ඔහුගේ දියනිය දෙස බැලුවේය.

'මාත් කැමතියි මෙහේ ඉන්න ලැබෙනවනම්. නගරය දුර වැඩියි දිනපතා ගමනට'

'හොඳයි අපි අම්ම ගෙනුත් අහල බලමු'

ඔවුන් නිවසින් පිටත් වූයේ ගම්බාර හාමිනේ විසින් පිළියල කල කෑම වේලක් රස විඳීමෙන් පසුවය. ඔවුන් රැගෙන ආ ආහාර නිවසේ අයට තෑගි කරන ලදී.

ආපසු එන ගමනේදී පූනාට වැටහුනේ කඳවුර පිහිටුවන ලද තැන වැව් ජලයෙන් යට නොවන ලෙස වැව් බැම්මට පහලින් ඉදිකර ඇති බවයි. ගමද වැවට යට වන්නේ නැත.

'දැන් දුවට වැටහෙනවද බාරගත් රාජකාරියෙ බැරෑරුම් කම', ආපසු යන අතර මහ ඇමති ඇසුවේය.

'ඔව්. ඒ වගේම මට විශ්වාසයි මට ඒ වැඩ කොටස තාත්තා බලාපොරොත්තු වෙන අන්දමටම ඉටු කරන්න පුලුවන් කියල' ඇයි පිළිතුරු දුන්නාය. 'තාත්ත මට ඒකට අවස්ථාව දුන්නොත් තමයි'

'මං මුල ඉඳලම දැනගෙන හිටිය දුවට මේ වැඩේ කරන්න පුලුවන් බව' රේටා පැවසුවේ කුඩා කල සිටම පුරුදු ලෙසින් ඇයගේ හිසකෙස් අතරින් ඇඟිලි යවමිනි.

පූනා පසුදා උදය මහාවාපි වැඩබිම බලා පිටත් වූයේ ඇගේ මවත් සමගය. මහඇමතිට රජවාසලේ රාජකාරි සඳහා නවතින්නට සිදුවිය. පෙරදින සවස ආපසු එන අතර ඔහු විසින් නැවත නැවතත් පූනාට අවවාද කළේ ඉතා ප්‍රවේශමෙන් කටයුතු කරන ලෙසත්, හැකි තරම් සේවක පිරිස සමග ඇසුර මග හරින ලෙසත්, කිසිවෙකු සමග ගැටුම් ඇති කර නොගන්නා ලෙසත්ය. තනිවම ගමෙන් පිට

sinhalaebooks.com



ඇවිදීම නොකරන ලෙසත් ඔහු පැවසීය. ඇය විසින් නොකළ යුතු දෑ බොහෝ විය. පූනා නිහඬව ඒ සියල්ල අසා සිටියාය. ඇයට මේ වගකීම බාරදී තනිවම මෙහි නතර කිරීම පිළිබඳව තාත්තා බොහෝ සෙයින් කල්පනා කරනා බව ඇයට වැටහින.

වැඩබිමට යන අතරමගදී අම්මා ගෙන්ද ඇයට නොයෙකුත් අවවාද අසන්නට සිදුවිය. ඇයගේ පවුලේ තත්ත්වයත් ඇගේ දැනුමත් නිසා සෙසු අය පහත් කොට නොසලකන ලෙසත්, ඔවුන්ගේ දක්ෂතා සහ දැනුමට ගරු කරමින් ඒ අයගේ උපරිම සේවය ව්‍යාපෘතියට ලබාගැනීමට උත්සාහ කරන ලෙසත් අම්මා ඇයට කීවාය. ඔවුන්ගේ වරදක් දුටු විට වුවත් ඒ ගැන විවාද නොකරන ලෙසත් කිසි කෙනෙකුට විශේෂ සැලකිලි නොදක්වන ලෙසත් තවදුරටත් පූනාට උපදෙස් ලැබුනේය. පිරිමි පමණක් සේවයේ යෙදුණු වැඩබිමක එකම කරුණිය ලෙස ඇය සිටිනා තත්තවය සැම විටම සිහි තබා ගත යුතු බව අම්මා ඇයට පැහැදිලි කර දුන්නාය.

'ඉතාමත්ම වැදගත් දේ තමයි ඉවසීම. කලබල නොවීම. මතක තියාගන්න හැම ප ශ්නයක්ම වගේ කාලයා විසින්ම විසඳන බව. ඒ නිසා නියම වෙලාව එන තුරු ඉවසන්න. අනිත් අය දුව ගැහැනියක වූ නිසාම දුර්වලයි කියල හිතාගෙන ඒකෙන් ප්‍රයෝජන ගන්න උත්සාහ කරාවි. දුව ඒ වැඩි දෙනෙකුට වඩා හිතින් ශක්තිමත් බවත් මතක තියාගන්න ඕන'

'තාත්තගෙ ජීවිතය රැඳී තියෙන්නෙ දැන් දුව අතේ තමයි' ඇය කිහිප වරක් සිහිපත් කළාය.

ව්‍යාපෘතිය නියම වෙලාවට අවසාන කිරීමේ වැදගත් කම ගැන පූනාට මවගෙන් යළිත් අසන්නට ලැබින. කිසිම හේතුවක් නිසා එය ප්‍රමාද විය නොහැකිය. ප්‍රමාද වුවහොත් රජුගෙන් කිසිම කෙනෙකුට කිසිම සමාවක් නොලැබෙනු ඇත. මුලු වගකීම රැඳී ඇත්තේ ඇගේ පියා ගේ කර මතය. ඒ නිසා ඔවුන් හැමදෙනාම තාත්තාට දිය හැකි උපරිම සහයෝගය දිය යුතුව ඇත.

ගමේ නැතැයි සිතු බොහෝ ආහාර වර්ග විශාල ප්‍රමානයක් ගම්බාරයාගේ ගෙදරට ඔවුන් රැගෙන විත් තිබිණ. ගම්භාර හාමිනේ ඉතාමත් ලෙන්ගතු බවකින් මවත් දුවත් පිළිගත්තාය. ගම්බාර දියනිය වූ සුමනා පූනාගේ සම වයසේ විය. ඇය මඳ සිනහවක් පා පසෙකට වී සිටියේ මහඇමතිගේ දුව සමග ඇය කෙසේ හැසිරිය යුතු දැයි නොදත් නිසාය.

පූනා ඇය වෙත ගොස් ඇය සමග කතා කරන්නට වුවාය. මුලදී වචනයකින් දෙකකින් පිළිතුරු දුන්නද ක්‍රමයෙන් සුමනා ඇය හා කතාවට වැටුනාය. මව්වරුන් දෙදෙනා සුලු වේලාවකින් බොහෝ කලක සිට දැන හඳුනා සිට අය මෙන් කතා කරමින් සිටියහ.

sinhalaebooks.com



පූනා වහාම වැඩ අරඹීමට බලා සිටියත් දිවා ආහාර ගන්නා තෙක් ඇයට පිටවන්නට ඉඩ ලැබුනේ නැත. ගම්බාරයා සහ සුමනා ඇය සමග වැඩබිමට ගිය අතර අම්මා ආපසු නගරය බලා පිටත් වූයේ දියනිය බලා ගැනීමේ වගකීම ගම්බාර පවුල විසින් හොඳින් ඉටු කරතැයි ඇති විශ්වාසය සමගය.

පූනා ගේ සහායට සුමනා පත් කර ගැනීමට තීරණය කරගත්තද පූනා සිතුවේ ඒ හුදෙක් ඇයගේ ආරක්ෂාව සඳහා යොදන ලද වැඩ පිලිවෙලක් මිස සුමනාගෙන් ඇයට සහායක් ලැබෙතැයි ඇය බලාපොරොත්තු වූයේ නැත.

# 7.

වැඩබිම අසල වූ තවත් කුඩා ගම්මානයකි මායාහල. එය පිහිටියේ ඉදිකරන වැව් බැම්මට ඉහලින් වීම නිසා වැව් ජලයෙන් යටවීමට තිබූ බව ගම්වැසියන් දැන සිටියේ නැත.

ගම්වැසියන්ට මෙහි කඳවුරු බැඳගත් නිලධාරින් ගැන සැකයක් ඇතිවූයේ ඔවුන් ගමේ පන්සල මගහැර සිටීම නිසාය. ඒ වනවිටත් ගම්බාරයාගේ අනපරිදි ගම් වැසියන් කිහිප දෙනෙක් කඳවුරේ වැඩ කළ අතර නිලධාරින් කිහිප අවසුථාවක විවිධ අවශ්‍යතා නිසා ගමට පැමිනියත් පන්සලට ගොස් හාමුදුරුවන් බැහැදුටුවේ නැත.

ඒ පළාතේ පිහිටි ඉතාම පැරණිතම පන්සලක් වූයේ මායාහල පන්සලය. මුලින්ම බුදු දහම මෙරටට ගෙන ආ බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් මෙතැන පන්සලක් ඉදිකරන ලද බව සටහන් වී තිබිණ. ගමට පැමිනෙන ඕනෑම කෙනෙක පන්සලට ගොස් නායක හිමියන් මුනගැසී යාම පිලිගත් චාරිත්‍රයක් වීය. දූර බැහැර ගමන් යන අයට නවාතැන් ගැනීමටද ඒ පළාතටම තිබුණේ මේ පන්සලය.

රාජ නිලධාරින්ගේ සැකකටයුතු හැසිරීම පිළිබඳව නායක හාමුදුරුවන්ගේ සිත යොමු කරන ලද්දේ ගමේ වැඩිහිටියන් කිහිප දෙනෙකි. ගමේ ගම්බාරයා ඒ ගැන කිසි විස්තරයක් කිරීමට ඉදිරිපත් වූයේ නැති අතර නිලධාරින්ගේ කටයුතු ගැන විස්තර දැනගැනීමට උවමනාවක් කළ බවත් පෙනුනේත් නැත.

'නිලධාරි ඇත්තන් පන්සලට එන්න අකමැති නම් අප ඒ ගැන කලබල විය යුතු නැහැ. ඒක ඒ අය විසින් තීරණය කළ යුතු දෙයක්' නායක හාමුදුරුවෝ පවසා සිටියහ.

'සමහරවිට නිලධාරි ඇත්තන්ට ඔබ වහන්සේට මුහුණ දීමට බැරි හේතුවක් ඇති' එක් වැඩිහිටියෙක් කියා සිටියේය.

sinhalaebooks.com



'මට හිතාගන්න බැහැ ඇයි කාටවත් පන්සල මගහරින්න තියෙන උවමනාව කියල. මේ පන්සලටවත් මේ ගමටවත් කිසි හානියක් කරන්න කවුරුවත් ඉදිරිපත් වෙයි කියල මා හිතන්නෙත් නැහැ'

'ඔවුන්ගේ මේ රහසිගත වැඩපිළිවෙල ගැන අපට ඒත් සැකයි හාමුදුරුවනේ'

'අපි කලබල නොවී ඉඳිමු. හැංගි හැංගි වෙස් බැන්දත් නටන්න ඕන එළියෙ නෙව'

එසේ පැවසුවද ගම්මු ඒ ගැන සතුටක් පෙන්වූයේ නැත.

දිනක් පින්ඩපාතය වඩිද්දී අතරමගදී නායක හාමුදුරුවන්ට රාජ නිලධාරියෙක් හමුවිය. නිලධාරියා පහත්වී හාමුදුරුවන්ට වැඳ නමස්කාර කළේය.

'අපට සමාවෙන්න හමුදුරුවනේ මෙතෙක් දවසක් පන්සලට එන්න බැරිවීම ගැන. රජතුමා අපට පවරලා තියෙන්නෙ ඉතාම බාරදූර, ඒ වගේම හදිසි රාජකාරියක්. ඒ නිසයි අපට විවේකයක් ලැබුනෙ නැත්තේ'

නායක් ස්වාමීන්වහන්සේ නිහඬව සිටියහ. මේ රාජකාරිය කුමක් දැයි හාමුදුරුවන් ඔහුගෙන් අසන තෙක් නිලධාරියා බලා සිටියේය. ඔහු බලාපොරොත්තුවූයේ හාමුදුරුවන් මේ ව්‍යාපෘතිය පිළිබඳව අසනු ඇති බවයි.

'අප මේ පළාතෙ මිනුම් රාජකාරියක් කරගෙන යනව' ඊට වැඩි යමක් පැවසීමට නොහැකි නිසා නිලධාරියා මහත් අපහසුතාවයකට පත්වී ඇති බව හාමුදුරුවන්ට වැටහී ගියේය.

'හෙට අනිද්දම අපි පන්සලට එන්නයි බලාපොරොත්තුව'

'ඒක බොහොම හොඳයි'

'එහෙනම් අපට යන්න අවසර' ඔහු හාමුදුරුවන්ට යළිත් වැඳ එතනින් පිටත් විය.

මහඇමති පැමිණි විට **හගාර** ඔහු හමුවට පැමිණියේ බැරෑරුම් පෙනුමක් ඇතිවය.

'ප්‍රශ්නයක් තියෙනව'

'මොකක්ද'

sinhalaebooks.com



'අපි මේ බිමේ පිහිටීමත්, පසත්, ඊට යටින් පිහිටි ගල්තලාවත් ගැන සම්පූර්ණ අධ්‍යයනයක් කළා', **හගාර** මදකට නැවතුණේය. 'මේ තරම් දැවැන්ත බැම්මක් බඳින්න මෙතන සුදුසු නැහැ කියන එක තමයි අපට තීරණය කරන්න සිදු උනේ. මොන විදිහට හැදුවත් ජල කාන්දුව නවත්වන්න බැරිවෙයි. ඒ නිසාම වැව් බැම්ම කොයි මොහොතේ බිඳී යාවිද කියල කියන්නත් අපහසුයි'

'මේ බව රජතුමාට නම් කියන්න බැහැ'

'ඒ විතරක් නෙවෙයි. මේ තරම් විශාල වැවක් කවදාවත් පිරෙන්න තරම් ජලය එකතු කරන්න බැරිවෙයි. ඒ නිසා මේ මහන්සියත් වියදමත් මහා අපතේ යාමක් වෙනව'

කිසිත් පිළිතුරක් නොදී රේටා වැඩබිමෙන් පිටවී ගියේය.

'ඒ මිනිහට ඔය වැඩේ කරන්න බැරි නම් වහාම පුලුවන් කෙනෙක් සොයගන්න වෙනව. මං හිතුව මිනිහ වැඩක් කරන්න දන්නව ඇති කියල, එයාගෙ කතාවෙ හැටියට. ඒත් මට පොඩි සැකයක් ඇති උනා ඔය ස්ථානය ගැන කිසි දෙයක් දැන ගෙන නොසිටි වෙලාවෙ' පසුදා මේ පුවත සැලකළ විට රජු පැවසුවේය. රජු ඒ තරම් කලබල නොවීම ගැන මහඇමති පුදුම විය.

'ඒ මිනිහ මොනව කීවත් මං හොඳටම දන්නව අපේ රටේ මේවගේ මහා වැවක් ඉදිකරන්න තියෙන හොඳම තැන මෙතනය කියල'

'**හගාර** තමයි අපේ රටේ සිටින දක්‍ෂතම වාරිතාක්‍ෂණවේදියා. වැඩිම පළපුරුද්දක ඇත්තේත් ඔහුටයි. ඔහුගේ තාත්තා සමගත් කුඩා කල සිටම වාරිකර්මාන්තයේ යෙදුන කෙනෙක්. අපේ රටේ වෙන කෙනෙක් ගැන මා දන්නේ නැහැ මහරජතුමාණනි'

'එහෙමනම් වහාම අසල් වැසි රටකින් සුදුසු කෙනෙක් සොයාගත යුතුයි'

'කොහොමද අපි දන්නෙ මේ මිනිහ පැති මාරු කරලද කියල? අපේ සතුරො එක්ක එකතුවෙලා මේ ව්‍යාපෘතිය කඩාකප්පල් කරන්න හදනවද කියල' හමුදා ප්‍රධානියා ඇසුවේය.

'එයා ඒ වගේ කෙනෙක් නෙවෙයි'

'ඕනෑම කෙනෙක් මුදලට යටවෙනව', හමුදා ප්‍රධානියා යළිත් කීවේය. 'දකුණෙ ඉන්න අපේ හතුරො හැම විටම බලාගෙන ඉන්නෙ අපට කරදරයක් කරන්න මයි'

'දකුණෙ අයට එහෙම වියදම් කරන්න අරමුදල් නැහැ දැන්'

sinhalaebooks.com



'ඔබ දන්නෙ නැහැ තවමත් එවුන්ගෙ දේවාලවල මොනතරම් වස්තු කන්දරාවක් හංගල තියෙනවද කියල. අනිත් එක මට ආරංචි තියෙනව මේ අහල පහල රටවලිනුත් උන්ට ආධාර ලැබෙනව කියල'

'මෙතන කවුරුහරි කඩාකප්පල් කරන්න හදනව නම් වහාම ඒක නවත්වන්න ඕන. අදම යැවිය යුතුයි තවත් රහස් සේවා නිලධාරීන් කිහිප දෙනෙක් වැඩබිමට' රජු හමුදා ප්‍රධානියාට අණ කළේය.

වෙනත් රටකින් දක්ෂ පළපුරුදු තාක්ෂණවේදියෙක් සොයාගෙන මෙරටට ගෙන්වා ගැනීමට මාස කිහිපයක් ගතවිය හැකි බව මහඇමති දැන සිටියේය. කෙනෙක් සොයා ගත්තද **භගාර** තරම් දක්ෂ කෙනෙක් සොයාගත හැකි වේයැයි ඔහුට විශ්වාසයක් තිබුණේ නැත. ඒ අතරම **භගාර**ගේ ජීවිතය ඉතාම අනතුරු දායක තත්වයක ඇතැයි ඔහුට වැටහී ගියේය.

කෙසේවුවත් අවසානයේ රජු මේ ව්‍යාපෘතියේ සියලු වගකීම පටවා ඇත්තෙ ඔහුගේ හිස මත බවත් රේටා දැන සිටියේය. ඔහුගේ දියනිය ගැනද ඔහු ගේ සිතේ මහත් බියක් ඇති විය.

ඔහු රාජකීය පනිවිඩ කරුවන් රටවල් කිහිපයකටම පිටත් කර හැරියේය. ඒ අතරම ප්‍රධාන වාරිතාක්ෂණවේදියාට කෙසේ හෝ ඉදිකිරිම් කටයුතු නොකඩවා කරගෙන යාමට ඔහු පොළඹවා ගත යුතුය.

'කවදාවත් රජතුමාට මේ ව්‍යාපෘතිය වෙනස් කරන්නට කැමති කර ගන්නට බැහැ. ඒ නිසා මොනවා හරි විසඳුමක් සොයාගෙන මේ වැව් බැම්ම ඉදිකළ යුතුයි. ඉදි කළාට පසුව වැව පිරුනේ නැතිනම් ඒ ගැන ඒ වෙලාවට කල්පනා කළ හැකියි' මහඇමති **භගාර**ට කීවේය.

'අසාර්ථක වෙන බව දැන දැන මං කොහොමද මේ වැඩ කරගෙන යන්නෙ'

'ඒ තරම් දුරට හිතන්න අවශ්‍ය නැහැ. තව මාස කිහිපයකින් හෝ අවුරුදු කිහිපයකින් සිදුවිය හැකි දේ ගැන දැන් හිතන්න කාලයක් නැහැ. වැඩ අවසාන කළ විගසම වැව් බැම්ම නොබිඳෙන බව මට විශ්වාසයි' මහඇමති තවදුරටක් පැවසුවේය. 'ඔබ දන්නවා හොඳටම රජ අණ කඩකරන්න මේ සුදුසු වෙලාවක් නොවෙයි. එසේ කරන්නට තැත් කළොත් විය හැකි දේ මා විස්තර කළ යුතු නැහැ. මගේ අදහස මින් මතුවට මේ කාරනා ගැන කිසිම දෙයක් කතා නොකර ඔබේ වැඩ කරගෙන යාම වඩාත්ම සුදුසුයි කියලයි'

**භගාර**ට ඔහුගේ දරුවන් තිදෙනා ගැන සිහිවිය. ඔවුන්ට කිසිත් අනතුරක් සිදු නොවිය යුතුය. මහඇමතිගේ යෝජනාව පිළිගැනීම හැරෙන්නට ඔහුට අන් මගක් නැති බව ඔහුට වැටහී ගියේය.

sinhalaebooks.com



මහඇමති පූනා හමුවූයේ ඉන් පසුවය. ඇය මේ මතුවූ අර්බුධය ගැන කිසිවක් නොදත්තාය.

'මට හිතෙනව එහා ගමේ වැසියො මේ ව්‍යාපෘතිය ගැන සැකයක් ඇති කරගෙන කියල. ඒ අයට කියන එක හොඳ නැද්ද මේ ගැන විස්තර' ඇය ඇසුවාය.

'තවම ඒ සඳහා වෙලාව ආවෙ නැහැ. දැන් මේව දැන ගත්තොත් එක එක අනවශ්‍ය ඉල්ලීම් කරන්න පුලුවන්. අපට කරදර කරන්න පුලුවන්. මේ වගේ වැඩක් කරන කොට බොරුවට මිනිස්සු බය කරල රජතුමාට කරදර කරන්න බලාගෙන ඉන්න අයත් රටේ ඉන්නවනෙ. මේ ගම්වැසියන් ගෙ සිත් බිඳුනොත් අපේ වැඩට ඒක ලොකු බාධාවක් වෙනව'

'ඒ ගමේ ඉතාමත් පැරණි පන්සලක් තියෙනව. මම ඉඩ ඇති වෙලාවක ඒ පන්සල බලන්න ගියාට කමක් නැද්ද'

'කමක් නැහැ. සුමනා එක්ක යන්න'

'හාමුදුරුවො මගෙන් ඇහුවොත් මේ ව්‍යාපෘතිය ගැන?'

'මේ ප්‍රදේශය දියුණු කරන්න ගවේෂණයක් කරන බව කියන්න. ඒක බොරුවක් නෙවෙයි නෙ'

'එහෙම කියල ගැලවෙන්න බැරිවෙයි. මට බොරු කියන්නත් බැහැ. ඇත්ත කියන්න සුදුසු වෙලාව ආවම තාත්ත මට කියන්න. එතෙක් පන්සලට නොගිහින් ඉන්න පුලුවන්'

මේ වන විට තව තවත් මිනිසුන් සේවයට කැඳවා තිබිණ. අවට ගම් වල මිනිසුන් හට ඔවුන්ගේ කුඹුරු වල හේන් වල වැඩ අතරමග නවතා මෙහි එන්නට සිදු විය. ඔවුන් රැස් කිරීමට ගිය හමුදා භටයින් ගෙන් කිසිම සමාවක් ලැබුණේ නැත. සෑම ගමකම ඉතිරි වූයේ මහලුවූද රෝගී වූද අයත් සමග කුඩා දරුවන් පමණකි. ඒ කුඩා දරුවන්ට ගෙදර දොරේ සහ කුඹුරු වල වැඩ ගැහැණුන් සමග එකතු වී කෙසේ හෝ කරන්නට සිදුවිය. නැතිනම් ඔවුන්ට හාමතේ මැරෙන්නට සිදුවනු ඇත.

අගනුවරට සමීප ප්‍රදේශයක් නිසා යුද සමයේ දී වත් ඔවුන්ට මෙවැනි ප්‍රශ්න වලට මුහුණ දෙන්නට සිදුවූයේ නැත. හමුදාවට මිනිසුන් බඳවා ගනු ලැබුණේ ඈත ගම්මාන වලින්ය.

සේවයට කැඳවූ කිසිවෙක් මේ ව්‍යාපෘතියේ අරමුණ කුමක් දැයි දැන සිටියේ නැත. එකිනෙකාට පැවරී ඇති සුලු වැඩ කොටස නිසා ඔවුන්ට මුලු ව්‍යාපෘතිය ගැන කිසිම හැඟීමක් තිබුනේත් නැත. සමහරුන් යොදවා තිබුනේ තැනින් තැන කැලය

sinhalaebooks.com



කපා ඉවත් කිරීමටය. තවත් අයට ඈත සිට මහා ගල් ගොඩවල් ඇදගෙන ඒමටය. තවත් අයට සිදුවූයේ පස් කපා එකතු කිරීමටය.

කඳු ගැටයේ සිට විශාල කලුගල් අතුරා ඒ මතින් පස් පුරවමින් බැම්මක් ඇරඹියද ඒ කුමක් සඳහා වේදැයි ගැමියන්ට සිතා ගත නොහැකි විය. සමහර විට අලුත් මාවතක් ඉදිකරනවා ඇතැයි ඔවුන් සිතුවේ ඒ නිසාය.

බැම්මේ පස් තැලීම සඳහා ඔවුන්ට මී හරකුන්ගේ සේවය අවශ්‍යවිය. සියවස් ගණනාවක් තිස්සේ ලද අත්දැකීම් අනුව වාරිතාක්ෂණවේදීන් තහවුරු කරගෙන තිබුණේ, වැව් බැම්මක් වැනි ඉදිකිරීමකදී තැලීම සඳහා උපයෝගීකර ගත හැකි හොඳම යන්ත්‍රය මී හරකා බවයි. මේ හේතුව නිසා අවට ගම් වල සිටි සියලුම මී හරකුන් වැඩ බිමට ගෙන ඒමට අණ කරන ලදී. කුඹුරු වැඩ අත්හිටවා මී හරකුන් රාජ්‍ය සේවයට යවා ගොවීන්ට උඩ බලාගෙන ඉන්නට සිදුවිය. මී හරක් මෙහෙයවීම ඉතා අපහසු විය. මෙතරම් බර වැඩක් නොනවත්වා කරගෙන යාම මේ සතුන්ට දුෂ්කර විය. මෙතෙක් කලක් උන් පුරුදු වී සිටියේ කිසිදු කලබලයකින් තොරව, විටින් විට ලැබෙන විවේකයක් සමග නිවි සැනසිල්ලේ කුඹුරු වැඩ කිරීමය. එහෙත් මෙතැන දිවා රෑ නොබලා සේවය කිරීමට සිදුවිය. මේ සතුන් පමණක් නොව සතුන් හා සමග වැඩ කල මිනිසුන් පවා රෝගී වන්නට විය. එහෙත් මේ වැඩකටයුතු පාලනය කළ හමුදා නිලධාරීන්ට එය ප්‍රශ්නයක් නොවූයේ තව තවත් සතුන් හා මිනිසුන් ඈත ගම් වලින් හෝ ගෙන්වා ගත හැකි වූ හෙයින්ය.

පූනා අසල ගමක් හරහා කිසියම් කටයුත්තක සඳහා යන විට ඇයට සිහිවූයේ පසුගිය යුද සමයේද මුලු රට පුරාම මේ වැනි අසරණ තත්ත්වයක් පවතින්නට ඇති බවයි. පිරිමි සියලු දෙනා යුදබිමට රැගෙන ගොස් සිටි නිසා කාන්තාවන්ට හා දරුවන්ට, ගෙදරත් කඹුරේ සියලු වැඩ කටයුතු හැකි පමණින් කර ගන්නට සිදුවිය.

ප්‍රශ්න මතුවන්නට වූයේ මෙසේ බලහත්කාරයෙන් සේවයට යොදා සිටි ගැමියන්ට මේ ව්‍යාපෘතිය කුමක් දැයි අවබෝධ වන්නට වූ පසුවය. මේ වැව් බැම්ම නිසා ඔවුන්ගේ නිවාස සහ ගොවිපල සදහටම ජලයෙන් යටවන බව වැටහී ගිය විටය. සවස සේවයෙන් මුදාහළ පසු මේ ගැමියන් පන්සලට රැස් වූයේ සිදුවන්නට යන ව්‍යසනය ගැන භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් පතාගෙනය.

මේ පිළිබඳව විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට කාලය පැමින ඇතැයි මහායල පන්සලේ නායක ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කර සිටියේය.

ඒ අනුව පසුදා උදයේම තිසගුත තෙරුන්වහන්සේ වැඩබිමේ නිලධාරීන් මුනගැසෙන්නට පිටත් වී ගියසේක. ගම්වැසියන්ගේ සිත්තුළ ඇතිවූ බිය සැක ගැන උන්වහන්සේ නිලධාරීන්ට පහදා දුන් සේක. ඔවුන්ගේ නිවාස දේපල, වතුපිටි පමණක් නොව ඔවුන්ගේ ජීවිතයට ඍජුවම හා වක්‍රව පිහිටවූ වනාන්තරයද විනාශ වී යනබවත් පෙන්වා දෙන ලදී.

sinhalaebooks.com



'මේ මිනිසුන්ට වෙන යන්න තැනක් නැහැ. වෙන ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ. මේ ගම්වල තියෙන්නේ ඉතාම පැරණි පන්සල්. ඒවා විනාශ වී යනව මේ වැඩකටයුතු නිසා. ඒ අපේ ජාතියටම උරුම වූ වස්තු'

**භගාර** නිහඬව තිසගුත හිමියන්ගේ කතාව අසා සිටියේය. ඉන් පසු ඔහු රජුගේ තීරණය ගැනත් ඔහු පත්වී සිටි තත්ත්වය ගැනත් පැහැදිළි කරන්නට උත්සාහ කළේය.

'මා මේ රාජකාරියෙන් ඉවත් වුනොත්, නැත්නම් විරුද්ධ වුනොත් මට අත්වෙන්නෙ මරණය තමයි. මා මැරුනත් මගේ දරුවන්ට මොන හිංසාවක් අත්වෙදැයි කියන සැකයත් තියෙනව. ඒ හැරත් මා වෙනුවට වෙන කෙනෙක් යොදවා මේ වැඩකටයුතු කරගෙන යාවි'

'එහෙම කියල තමුන්ගෙන් රටට විය යුතු යුතුම් පැහැර හරින්න බැහැ නේද'

'මට වැටහෙන අන්දමට මගේ යුතුකම ඉෂ්ට කරන්නට තමා මේ උත්සාහ කරන්නෙ, හාමුදුරුවනේ. රජතුමා මෙතැන වැවක් හදන තීරණය වෙනස් කරන්නෙ නැහැ. එයාට මිනිස් ජීවිත වල වටිනාකමක් නැහැ. මගේ ජීවිතය විතරක් නෙවෙයි මේ ගම්වැසියන්ගෙ ජීවිත උනත් එයාට ප්‍රශ්නයක් නෙවෙයි. මේ වැව හදල ඒකට එයාගෙ නම දමා ගැනීම විතරයි එයාට අවශ්‍ය. ඉතින් මං උත්සාහ කරන්නෙ පුලුවන් තරම් හොඳින් මේ වැව ඉදිකිරීමයි'

'එවිට සාර්ථක වෙන්නෙ රජුගෙ අරමුන විතරයි නේද'

'නැහැ හාමුදුරුවනේ, මං උත්සාහ කරන්නෙ පුලුවන් තරම් ආරක්ෂිත විදිහට වැව් බැම්ම ඉදි කරන්නයි. වැවේ ජලය පිරුනාට පසුව බැම්ම කැඩී ගියොත් මහත් විනාසයක් වෙන්න පුලුවන්. ඒක වලක්වා ගත යුතුයි. ඒ වගේම ජලයෙන් යටවී විනාශ වන ගම්මාන වලින් කිහිපයක් හෝ බේරා ගැනීමයි මගේ බලාපොරොත්තුව'

පූනා පසෙක හිඳ නිහඬව මේ කතාවට සවන්දීගෙන සිටියාය. මේ වැව නිසා සිදුවන පරිසර විනාශයත් අහිංසක මිනිසුන් දහස් ගනනකට වන පාඩුවත් ඇයට තරමක් දුරට මේ වන විට අවබෝධ වී තිබිණ. එහෙත් රජතුමාටත් ඇගේ පියාටත් වඩා ඇයට ඒ ගැන වැටහීමක් නැතිවිය හැකි බවත් ඒ අතරම ඇයට සිහිවීය. ඇය අවට සිදුවන සියල්ල ගැන වඩා අවධානයකින් සිටිය යුතු බව ඇය තීරණය කළාය. පියා සමග මේ පිළිබඳව කතා කිරීමට පෙර හැකි තරම් දුරට මේ ගැටලුව ගැන කරුණු රැස් කර ගත යුතු විය.

තිසගුත තෙරුන් ආපසු ගමට වඩින්නට පෙර එහා ගමේ පන්සල වෙත ගමන් කළේ ඒ පන්සලේ වැඩ සිටි නායක හිමියන් සමගත් මේ ගැන සාකච්චා කිරීම සඳ හාය.

sinhalaebooks.com



'මේ ගමේ අයත් බොහොම බය වෙලා කලබල වෙලා ඉන්නෙ. මටත් අදහසක් නැහැ මේ සම්බන්ධව මොනවා කරන්නද කියල', නායක හිමි පැවසූවේය.

'මා පැමිණියේ ඒ නිසයි. මේ පළාතෙ ඉන්න වැඩිහිටි හාමුදුරුවරු ලෙස අපට තමයි මේ ගැන අනිත් අයට කරුණු පැහැදිලි කරන්න වෙන්නෙ'

'මේ වැව නිසා බලපෑම් සිදුවන සියලුම ගම්මාන වලත්, පන්සල් වලත් භික්ෂූන් වහන්සේලා එක ස්ථානයකට කැඳවලා මේ ප්‍රශ්නය ගැන පුලුල් සාකච්චාවක් කරන එක හොඳයි'

'ඒ අදහස හොඳයි. අදම පනිවිඩ යවමු හැම පන්සලකටම'

භික්ෂූ රැස්වීම පිළිබඳ පුවත **භගාර** වෙත ගෙන ආවේ හමුදා නිලධාරියෙකි. ඔහු වහාම මේ ගැන මහ ඇමතිට දන්වා යැවීය.

'ඔබේ වැඩ කටයුතු නොනවත්වා කර ගෙන යන්න. හාමුදුරුවරු එකතුවෙලා ඕන දෙයක් ගැන කතා කළාට අපට කමක් නැහැ. ඒ ගොල්ලන්ට උනත් මේ ගැන කරන්න දෙයක් නැහැ' රේටා තාක්ෂණවේදියාට එසේ පවසා පූනා සමග ප්‍රගතිය පිළිබඳ කතා කරන්නට වීය.

සංඝ සභාවට සෑම පන්සලකම නායක හාමුදුරුවන් හෝ වැඩිහිටි හාමුදුරුකෙනෙක් පැමිණ සිටි බව තිසගුත තෙරුන් දුටුවේය. ඔහු සභාව අමතා කතා කළේය.

'අප අද පත්වී ඇති භයානක අනතුර ගැන මේ රැස්වීමට සහභාගි වන ස්වාමීන්වහන්සේලා සියලු දෙනාටම වැටහී ඇති බව මා දන්නවා. එහෙත් අප මේ ගැන ගන්නා ඉදිරි පියවර ඉතාමත් ප්‍රවේශමෙන් කළ යුතු වෙනව. මෙය රටේ මහරජ තුමාගෙ ව්‍යාපෘතියක්. රජතුමාගේ විශෙෂ උවමනාවට ඉදි කෙරන එකක්'

'අප පළමුවෙන් කල්පනා කළ යුත්තේ මෙතැන වැවක් ඉදිකිරීමට රජතුමා ගත් තීරණය වෙනස් කළ හැකිද යන්නයි. මීට වඩා ඒ සඳහා සුදුසු ස්ථානයක් අපට යෝජනා කළ හැකි නම් අපට ඒ ගැන උත්සාහ කර බැලිය හැකි වෙනවා. එහෙත් පරිසරයටත් මිනිසාටත් සතා සිවුපාවාටත් අවම හානියක් වන ස්ථානයක් සොයා ගැනීමත් පහසු වෙන්නේ නැහැ. මහා වාරි ව්‍යාපෘතියක් කොතැනක ඉදිකළත් එයින් අත්වන යහපතට වඩා විශාල හානියක් එයින් සිදුවෙනවා. ඒක වළක්වන්න බැහැ.

'ඒ නිසා ඇති වන ගැටලුව තමයි අප කෙසේ හෝ මේ වැව ඉදිකිරීම වලක්වාගෙන රජතුමාට වෙනත් ස්ථානයක් යෝජනා කිරීමෙන් සිදුවෙන්නෙ

sinhalaebooks.com



අපේ ගම්වැසියන් බේරගෙන අප තවත් ප්‍රදේශයක ගම් වැසියන් බිල්ලට දීමක් වෙනව'

'කොහොමත් අපේ රජතුමා තීරණයක් ගත් පසු එය වෙනස් කිරීමත් කවදාවත් කරන්න බැහැ' එක් වයෝවෘද්ධ හිමි නමක් පවසා සිටියේය.

'ඒ උනත් උත්සාහ කිරීමේ වරදක් නැහැ නේද'

'හිත වෙනස් කරන්න බැරි උනොත්?'

'අපට මේ ව්‍යාපෘතියෙන් සිදු වෙන්නට යන හානිය අවම කර ගැනීමට ක්‍රම සොයන්නට සිදු වෙනව'

'මා ප්‍රධාන වාරිතාක්ෂණවේදියා සමග කතා කළා. ඔවුන්ගේ සැලැස්ම ගැන හොඳින් සොයා බැලුවා. අපට කිසිම විකල්පයක් ගැන හිතාගන්න බැහැ' තවත් හිමි නමක් ප්‍රකාශ කර සිටියේය. භික්ෂුවක වීමට පෙර මුලු රටම පිළිගත් වාරිතාක්ෂණවේදියෙකුව සිටි උන්වහන්සේගේ ප්‍රකාශයේ බරපතල බව අන් අයටද වැටහුණේ එවිටය. ඒ නිසාමය තිසගුත තෙරුන් විසින් උන්වහන්සේට ආරාධනා කර තිබුනේ.

'අප මේ ගැන ඉතා හොඳින් කරුණු අවබෝධ කරගෙන අපේ ක්‍රියා මාර්ගය තීරණය කළ යුතු වෙනවා. අපේ අදහස් ප්‍රකාශ කිරීමට අපට එක් අවස්ථාවකට වඩා ලැබෙන එකක් නැහැ'

දවල් දානය සඳහා ගත කළ කාලය හැරෙන්නට මුලු දවසම මේ සාකච්චාව සඳහා ගතවීය. අවසානයේ තීරණය වූයේ පසුදින මායහල පන්සලට මහ ඇමති කැඳවා මේ ගැන ඔහු සමග කතා කිරීමටය.

මහඇමති පන්සලට පැමිණියේ අටපිරිකර පූජාවස්තූද රැගෙනය. ඔහු සමග ප්‍රධාන වාරිතාක්ෂණවේදියාද ඔහුගේ ප්‍රගති අන්වේෂක ද පැමින සිටියේය. පූනාට ඒ ගමනට එන්නට පියාගේ අනුමැතිය ලැබුණේ සියලු කතාබහට සවන් දෙනු විනා ඇය විසින් කිසිම අදහසක් ප්‍රකාශ නොකරන බවට එකග වූ පසුවය.

රේටා විසින් මහාවාපි ව්‍යාපෘතිය පිළිබඳව විස්තර සංසයා ඉදිරියේ තැබුවේය. එයින් රටටත් මහජනතාවටත් ලැබෙන ලාභ ප්‍රයෝජන ගැන ඔහු වැඩි අවධානයක් යොමු කළේය.

'මේ ව්‍යාපෘතිය නිසා රටේ සශ්‍රීකම, සැම අතින්ම පොහොසත්ම වූත් ප්‍රදේශය වෙනවා. ඒ සමගම මේ රටේ විතරක් නෙවෙයි, මුලු ලෝකයේම මිනිසා විසින් ඉදිකළ විශාලතම වැව ඇති පළාත ලෙසත් ලෝක ප්‍රසිද්ධ වෙනවා'

sinhalaebooks.com



'අපේ ගම් වැසියන් මේ කතා හැම දෙයක්ම අසා තියෙනවා. ඉතිහාසය පුරාම රජවරු බලයට ආ විට රටවැසියන්ගේ යහපතට කියා බොහෝ දේ කරනවා. රජ්ජුවටේ ඉන්න සමහර නිලදාරීන් තමන්ට ලැබෙන ලාභ ප්‍රයෝජන බලාගෙන ඒවාට රජ්ජුරුවන්ට උල් පන්දම් දෙනව. ඒත් ඒවායෙන් සාමාන්‍ය ජනතාවට ඇති වන සෙතක් නැහැ කියන එකයි අපේ අත්දැකීම'

'දැන් මේ ඉදිරිපත් කලේ මේ වැව සම්බන්ධ හොඳ පැත්ත විතරනෙව. මේ නිසා වන හානිය ගැනත් කතා කරන්න ඕන නේද?' තිසගුත හිමි පවසා සිටියේය.

'ඇතිවිය හැකි කිසිම හානියක් ගැන අපේ ගවේෂණයේදී මතුවෙලා නැහැ හාමුදුරුවනේ'

'මේ මිනිසුන්ගෙ ගෙවල් දෙරවල් වතුපිටි විනාශවෙලා යාම. මේ තරම් පැරණි මේ පන්සල විනාශ වීම. මේ පරිසරය විනාශ වීම. මේවා රජතුමාට වැදගත් දේ නෙවෙයිද මහඇමති තුමනි'

'මා එහෙම දෙයක් අදහස් කළේ නැහැ හාමුදුරුවනේ. ඒ සියලු කරුණු අප විසින් සැලකිල්ලට අරගෙන තියෙනවා. දැනටමත් මේ සියලුම ගම් වැසියන්ට සුදුසු ඉඩම් සොයාගෙන වෙන්කරලයි තියෙන්නෙ. මේ වැව නිසා අත්වන ප්‍රතිලාභ මේ සියල ප්‍රශ්න වලට වඩා විශාලයි'

'එතකොට මේ පන්සල'

'අපට පුලුවන් මේ ගොඩනැගිලි ගඩොලින් ගඩොල ඉවත් කර වෙනත් තැනක ඉදි කරන්නට'

'ඊට වඩා නරකද මේ සියලු දේ මේ පවතින අන්දමට පවතින්න අරින එක, මේ ගම් වැසියන්ට අවට තියෙන කුඩා වැව් හොඳටම ප්‍රමානවත් ගොවිතැන් වැඩ වලට. මේ කුඩා වැව් සියල්ල යට කරගෙන මහ වැවක් ඉදිකරන්න අවශ්‍ය නැහැ'

'මේක රජතුමාගේ තිරණය හාමුදුරුවනේ'

'එහෙනම් පුලුවන්ද අපට රජතුමා මුනගැසෙන්න අවස්ථාවක් ලබා දෙන්න වැඩිය ප්‍රමාද නොකර'

'මා උත්සාහ කරන්නම්, අපෙ හාමුදුරුවනෙ'

'අපි අගනුවරට පැමිණෙනව තව දවස් තුනකින්. රජතුමා මුනගැසෙන තුරු අපි ආයිත් ගමට එන්නෙ නැහැ' භික්ෂූන් ගේ තීරණය අසාගෙන රේටාත් **භගාරත්** පූනාත් වැඳ අවසර ගෙන පන්සලින් පිටත්ව ගියහ.

sinhalaebooks.com



රජු භික්ෂූන් හමුවීම ප්‍රතික්ෂේප කළේය.

'මහාවාපිය එතැනම ඉදිකළ යුතුයි. ඒ තීරණය වෙනස් වෙන්නෙ නැහැ. ඒ නිසා මට ඔය හාමුදුරුවරු හමුවෙන්න අවශ්‍ය නැහැ'

'උන්වහන්සේලා නගරයෙන් පිට නොවන බව කියා සිටිනවා රජ තුමනි, ඔබ වහන්සේ මුනගැසෙන තුරු'

'කියන්න ඒ අයට පන්සල් වෙනත් තැන් වල පිහිටුවන්න මුදල් ප්‍රමාණය වැඩි කරනා බව'

'එයට ඔවුන් කැමති නැහැ දේවයන් වහන්ස'

'එසේ නම් අගනුවර පන්සල් වල නායක හාමුදුරුවරුන්ට කියල මේ ඇත්තන්ට මොනව හරි තනතුරු ටිකක් පිරිනමන්න බලන්න, හොඳ ස්ථිර ආදායමක් ලබා ගන්න පුලුවන් විදිහට. අඩුම වශයෙන් අර තිසගුත කියන එක්කෙනාට වත්'

'අප ඔවුන්ට අල්ලසක් දෙන්න තැත් කළා කියල හිතයි'

'එයාල මොනව හිතුවහම මොකද, එහෙම හරි කටවල් වහන්න පුලුවන් නම්'

මහඇමති නගරය තුළ කුඩා පන්සලක නැවතී සිටි භික්ෂූන් වහන්සේලා හමුවීමට ගියේ රජතුමාගේ පනිවිඩයත් රැගෙනය.

'අපේ කිසිම අදහසක් නැහැ පන්සල් වෙන ස්ථාන වල ඉදිකරන යෝජනාවට. පන්සල් කියන්නෙ රජවරුන්ට හිතෙන හිතෙන තැන් වලට ගෙනියන දේවල් නෙවෙයි. ඒවා අපේ පූජනීය ස්ථාන' එක් භික්ෂුවක් පැවසුවේය.

'මහඇමති සිතනවාද කුඩාරමක් එක තැනකින් ගලවලා තව තැනක ඉදිකරනවා වගේ පන්සලක් ගෙනියන්න පුලුවන් කියල' කිසගුත හිමි අසා සිටියේය.

'මා මෙතන රජතුමාගේ පනිවිඩ කරුවෙක් පමණයි හමුදුරුවනේ. මා හැකි තරම් උත්සාහ කළා රජතුමාගෙ අවසර ලබාගන්න ඔබවහන්සේලා මුණගැසෙන්න' රෝටා බිමට දෑස් යොමාගෙන පැවසුවේ තිසගුත හිමියන් සහ අනිත් හිමිවරුන් දෙස බලන්නට ශක්තියක් නැතිවූ නිසාය.

## 8.

sinhalaebooks.com



පූනාට ඇගේ සිතිවිලි සහ සිතට පැනනැගි ප්‍රශ්න කතා කරන්නට බෙදාගන්නට කිසිවෙක් කඳවුරේවත් ගමේවත් සිටියේ නැත. නුවනැත්තියක වුවත් ගමේ හැදුණු වැඩුණු සුමනාට ඇගේ ගැටලු වටහා ගත නොහැකි වෙතැයි පූනා සිතුවාය. ගම්බාරයා සමග එතරම් සමීප ඇසුරක් නොවූ නිසාත්, ඔහුගේ අදහස් නොදත් නිසාත් ඔහු සමග ද කතා කිරීම පූනාට අපහසු විය. පන්සලට ගොස් තිසගුත හිමියන් හමුවීමටද ඇයට යා නොහැක. තාත්තා සමග මේ ගැන කතා කළ යුතු යැයි ඇය සිතා සිටියත් තාත්තා වැඩබිමට පැමිණි හැම අවස්ථාවකම තනිවම ඔහු සමග කතා කිරීමට අවස්ථාවක් ඇයට ලැබුනේ නැත. හැරත් ඔහු සැම විටම සිටියේ කෝපයෙන් හො කනස්සල්ලෙන් යැයි ඇයට සිතුණේය.

දිනක් මහඇමති වැඩබිමට ආ දිනක ඇය දින දෙක තුනකට ගෙදර යාමට අවශය බව පැවසුවාය.

'මට ටිකක් ඇඟට සනීප මදි වගෙයි'

'එහෙනම් දැන් වහාම පිටත් වෙමු', රේටා කලබල වූයේය.

'නැහැ. එහෙම හදිසියක් නැහැ. තාත්තාගේ වැඩකටයුතු අවසන් උනාම යන්න පුලුවනි'

'ඇයි අපට මේ වගක් නොකීවෙ' ගම්බාර හාමිනේ ඇසුවේ අමනාප හඬකිනි.

'අක්කා මට වත් කීවෙ නැහැනෙ' සුමනාද පැවසුවාය.

'එහෙම කියන්න තරම් අසනීපයක් නැහැ නැන්දෙ. මට අම්මයි නංගියි බලන්න යන්න හිතුන', පූනා ඔවුන් දෙදෙනා අස්වැසීය.

'ඒක මිසක්'

ආපසු යන අතරමග පූනා නිහඬව සිටියාය. රථයේ රියැදුරාට ඇසෙන්නට ඇගේ සිතේ පැසවන අදහස් ප්‍රකාශ කිරීමට ඇයට නොහැකි විය. ඇය නිහඬව සිටින්නේ රෝගී තත්තවය නිසායැයි සිතූ රේටා ද ඇගෙන් කිසිවක් විමසුවේ නැත.

ගෙදරට පැමිණි විගස රේටා ඇයට ඇඳට වී විවේක ගන්නට උපදෙස් දී වෙද ඇදුරන් ට වහාම පැමිණෙන්නට පනිවිඩයක් යැවීය.

'මට පේන හැටියට මේ දැරිවිට කිසිම අසනීප තත්ත්වයක් නැහැ. සාංකාව වෙන්න පුලුවන් අම්මා නොදැක'. වෙදානන්ගේ තීරණය වීය. 'කොයි එකටත් දින දෙක තුනක් විවේක ගන්න එක වරදක් නැහැ, වැඩබිමේ වැඩ අධික කම නිසා වෙහෙසත් ඇතිනෙ'

sinhalaebooks.com



වෙදුන්ගේ බස් ඇසූ රේටා සැනසුම් සුසුමක් හෙලුවේ මෙතෙක් සිතේ වූ මහා බරකින් නිදහස් වූ නිසාය. ඔහු බියපත්ව සිටියේ වැඩබිමේදී කිසියම් දරුනු රෝගයක් ඇයට බෝවන්නට ඇතැයි සිතීමෙන්ය. ඒ අතරම මේ වන විට ඔහුට පූනා නැතිවම බැරි තත්ත්වයක් වැඩබිමේ ඇතිවූයේ ඔහු බලාපොරොත්තු වූවාටත් වඩා සාර්ථක ලෙසින් ඇය ඇගේ වැඩ කොටස ඉටු කරන හෙයින්ය.

අම්මා සමග තනිවූ සැනින් පූනා ඇගේ සිත තුළ තෙරපෙමින් තිබූ සියලු දේ ඇය සමග පවසන්නට වූවාය. අම්මා කිසිත් නොකියා ඇගේ සිතේ බර සැහැල්ලු කර ගැනීමට ඉඩ දුන්නාය.

'මට තවත් එතන වැඩ කරන්න බැහැ අම්මේ. අපි කරන්නෙ මහා පවුකාර වැඩක්. ඒ වැඩ නිසා මහා විනාශයක් වෙයි මුලු පළාතටම'

'දැන් තාත්තාට දූව නැතුව ඒ වැඩ කටයුතු කරගෙන යන්න බැරි තත්ත්වයක් ඇති වෙලා. ඉතින් තාත්තව මේ වෙලාවෙ අතරමං කරන්න බැහැනෙ දූව'

'අපි කොහොම හරි තාත්තට තේරුම් කරල දෙමු මේ වැඩේ වැරදියි කියල'

'මං හිතන්නෙ තාත්ත හොඳටම දන්නව. ඒත් තාත්තට රජ අනට වරුද්ධව යන්න පුලුවන් කමක් නැහැ'

'රජ අන කියල වැරදි වැඩ අපරාද කරන්න බැහැනෙ. ඒ වැඩ වලින් හානියක් වෙනව නම්'

'තාත්ත එක්ක ඔය කතා කියන්න එපා. තාත්ත දැන් දූව ගැන හරිම පැහැදීමකින් ඉන්නෙ. හරිම විශ්වාසයක් තියාගෙන දූව නිසා තමයි මේ ව්‍යාපෘතිය මේ තරම් හොඳින් කෙරීගෙන යන්නෙ කියලයි තාත්ත නිතරම කියන්නෙ'

'සමහර වෙලාවට ඇත්ත කතා කළහම හිත රිදෙනව. ඒත් ඇත්ත හංගාගෙන හිටියාම, නැත්නම් බොරු කීවාම, එයින් ඇතිවන වේදනාව ජීවිත කාලයක් තියෙන්න පුලුවන් නේ අම්මෙ'

'දූව වැඩබිමට ගියාට පස්සෙ දාර්ශනිකයෙක් වෙලානෙ. දූවට මේ තරම් ඉගැන්වීම නිසා තමයි දූව මෙහෙම පැහිච්ච කතා කියන්නෙ'

'මෙහේ ආචාර්යවරුන්ගෙන් අවුරුදු ගණනාවක් ඉගෙන ගත් දේට වඩා මේ ටික දවසට මං ඉගෙන ගත්තා වැඩබිමේදී, ජීවිතය ගැන. ලෝකය ගැන, දියුණුව, සංවර්ධනය කිය කිය අපි අපේ පරිසරයට කරන විනාශය ගැන' පූනාගේ පිළිතුර විය.

sinhalaebooks.com



පූනා මහාවාපි වැඩබිම අවට පරිසරයත්, ගම් වැසියන් ගැනත් විස්තර අම්මා සමග පැවසුවාය. ඔවුන්ගේ අගහිග කම්, අසරනකම, ඔවුන්ගේ නිවාස වල තත්ත්වය ගැන ඇය දුටු දේ කීවාය.

'එක ගමක මිනිස්සු ජීවත් උනේ පොලොව හාරා සදාගත් වලවල් වල. එවගේ ගෙයක් දකින්නම ඕන ඒවායෙ තත්ත්වය දැන ගන්න. මං හිතන්නෙ ඒ තනි කාමරය පාවිච්චි කරන්න ඇත්තෙ අම්මත් දරුවනුත් නිදාගන්න විතරක් වෙන්න ඇති. දවාලටත් ඇතුළ කලුවරයි. වාතාශ්‍රයක් නැහැ'

'හිතාගන්නත් අමාරුයි තවමත් ඒ තරම් දුප්පත් අසරණ අය අපේ රටේ ඉන්නව කියල. මං අහල තිබුනේ මීට අවුරුදු සිය ගණනකට ඉස්සෙල්ල නම් ඒ වගේ ගෙවල් තිබුණ කියල'

'ඉතින් අපි ඒ වගේ අය තාමත් ඉන්න පලාතක් තමයි වතුරට යට කරල විනාශ කරන්න යන්නෙ'

'ඉතින් ඒ අයටත් වෙනත් තැනක ඉඩම් ලැබෙයි. ගෙයක් හදාගන්න මුදල් ලැබෙයි නෙ. ඔය ඉන්නවට වඩා හොඳ ගෙවල් හදාගන්න පුලුවන් වෙයිනෙ'

'මං හිතන්නෙ නැහැ ඔය දෙන පොරොන්දු එකක් වත් ඒ විදිහට කෙරෙයි කියල. වැව බැන්දට පස්සෙ ඒ සේරම අමතක වෙලා යයි. රජතුමා වෙන මොකක් හරි පිස්සු වැඩක් පටන් ගනීවි'

'ඔහොම කතා විහිලුවට වත් කියන්න එපා. තාත්ත ගැන ටිකක් හිතන්න. තාත්ගෙ ජීවිතේ අනතුරට දාන්න දේවල් කියන්න එපා'

'අම්ම කැමතිද මේ ගෙවල් දෙරවල් අත් හැරල නන්නාඳුනන පලාතක ආයිත් මුල ඉඳල ගෙයක් හදාගෙන යන්න'

'සමහර විට රට වෙනුවෙන් අපට පරිත්‍යාග කරන්න වෙනව'

'රටට යහපතක් වෙන දේකට නම් මං එක පයින් ඕන දෙයක් පරිත්‍යාග කරන්න ලැහැස්තියි. ඒත් මෙතන මොකක්ද රටට වෙන යහපත'

'දූවට මහන්සියි. දැන් ටිකක විවේක ගන්න. හවසට අපි යමු පන්සල් ගිහින් එන්න'

අම්මාත් දූවරුන් දෙදෙනාත් පන්සලේ බොහෝ වෙලාවක් ගත කළහ. මල් පහන් පූජා කර බෝධි මලුව තුළ සුදු වැලි තලාවේ වාඩිවී පැයක් පමණ භාවනාවේ නියැලී සිටින්නට හැකි වූයේ එදින පන්සලේ වැඩි සෙනගක් ගැවසුනේ නැති නිසාය. ඔවුන් ආපසු එන විට හිරු බැස ගොස් අඳුරු වැටී තිබුනේය. රේටා ගෙමිදුලේ සක්මන් කරමින් සිටියේය.

sinhalaebooks.com



'දූව ගෙදර ආවෙ විවේක ගන්න. ඉතින් ගෙදරට වෙලා විවේක ගන්න ඕන' ඔහු කීවේ මදක් නොසන්සුන් හඬකිනි.

'තාත්තෙ අපි පන්සල් ගියෙ හිතට විවේකයක් ගන්න. මං ටිකක භාවනා කළා බෝධිය යට ඉඳගෙන. වැඩබිමේ හිටි කාලෙ මට එක දවසක් වත් පන්සලකට යන්න බැරි උනා'

රාත්‍රී ආහාරයෙන් පසු පූනාද දෙමාපියන් සමග ගෙපිලේ වාඩි වූවාය.

'තාත්තා ඇත්තටම මේ ව්‍යාපෘතිය ගැන මොනවද හිතන්නෙ'

'මට හිතන්න තියෙන්නෙ නියමිත දිනයට කොහොමහරි මේ වැඩ නිම කිරීම විතරයි. අනිත් සේරම දෙවනුව සිතන්න පුලුවන්'

'ඒ අහිසංක මිනිසුන්ගෙ ජීවිත ගැනවත් හිතන්නෙ නැද්ද'

'ඒ මිනිසුන්ට කිසිම කරදරයක් වෙන්න මං ඉඩ තියන්නෙ නැහැ. ඒ අයට යහපතක් වෙන බව මට විශ්වාසයි'

'එහෙනම් ඇයි ඒ මිනිස්සු මේ තරම් මේකට විරුද්ද වෙන්නෙ'

'ඉතිහාසය පුරාම මිනිස්සු හැමදාම අලුත් වැඩක් කරන කොට විරුද්ධ වෙලා තියෙනව. දූව ඒ ගැන ඉගෙනගෙන ඇතිනෙ. ඒක මිනිස් ස්වභාවය වෙන්න පුලුවන්. අලුත් අදහස්, අලුත් ව්‍යාපෘති අරඹන හැම වෙලාවෙම ටික දෙනෙකුගෙ විරුද්ධ වීම නිසා ඒ වැඩපිළිවෙල නවතා දැමුවා නම් එහෙනම් අපි තාමත් ජීවත් වෙන්නෙ ගල්ගුහා වල කැලේ සත්තු වගේ. අපේ අද මේ තියෙන දියුණුව අපට ලබා ගත්තෙ අපේ මුතුන් මිත්තන් අලුත් අදහස් ක්‍රියාත්මක කරන්න බය නොවුන නිසයි. අත්හදා බැලීම් කරන්න ඉදිරිපත් උන නිසයි. අලුත් විදිහට හිතන්න පුලුවන් වුන නිසයි. වැඩි දෙනාගෙ කැමැත්ත ගැන හිතන්නෙ නැතුව ඒ උනාට වැඩි දෙනාගෙ යහපත වෙනුවෙන් වැඩ කළ නිසයි' රේටා නොනවත්වාම කියාගෙන ගියේය.

තාත්තා මෙසේ කතා කරන්නේ ඔහුගේම සිත රවටා ගැනීමට දැයි පූනා ට සිතුනේය. ඇය නිහඬව ඈතින් පෙනෙන ස්ථූපයේ කොත් කැරැල්ල සඳ එළිය වැටී බැබලෙන දෙස බලා සිටියාය. ඇගේ සිත තුළ නළියන අදහස් තාත්තා ඉදිරියේ කියන්නට ඇයට නොහැකිය. ඔහුගේ සිත පාරන්නට ඇයට නොහැකිය. ඔහු මේ සියල්ල ඉවසාගෙන සිටින්නේ අම්මාත් නංගීත් ඇයත් ආරක්ෂා කර ගැනීමට බව ඇයට වැටහී තිබුණේය.

'දූව දැන් ගිහිල්ල නිදා ගන්න. අපි හෙට කතා කරමු' අම්මා ඇයගේ හිස පිරිමදිමින් කීවාය.

sinhalaebooks.com



'ඇත්තටම මේ දරුවට තියෙන ප්‍රශ්නය මට නම් තේරෙන්නෙ නැහැ', රේවා පැවසුයේ පූනා ගෙතුළට ගිය පසුවය. 'වෙනද කවදාවත් මෙහෙම වාද කරන්නෙ නැහැ'

'එයාට වැඩකිරීමේදි ඔය දේවල් කතා කරන්න කවුරුත් නැහැ. සේරම හිත ඇතුළෙ හිර කරගෙන ඉඳල ගෙදර ආ නිසා හැම දෙයක්ම අපි එක්ක කියනව'

'මට හිතෙනව මේ වැඩේ දරුවට බාර දුන්න එක වැරදියි කියල. මේ තරම් පොඩි වයසේදි මෙහෙම ප්‍රශ්න වලට මුහුණ දෙන්නෙ කොහොමද කියල අපට හිතන්න තිබුණ'

'එහෙම හිතන්න හොඳ නැහැ. මේ රාජකාරියට හිටි සුදුසුම එක්කෙනා මයි ඔයා තෝර ගත්තෙ. ඒ තීරණය හරි. අපට තියෙන්න ඒ දරුවට මග පෙන්වන එක තමයි'

පසුදින ඇය පැමිණ සිටිනා බව දැනගත් ඇගේ යෙහෙළියන් කිහිප දෙනෙක් ඇය දකින්නට ආ හෙයින් පූනාට මහාවාපිය ගැන මඳකට අමතක කිරීමට හැකිවිය. එහෙත් පෙරදින වල මෙන් නොව දැන් ඒ දැරියන් හා ඇය අතර කෙමෙන් ඇතිවන දුරස්ථ භාවයක් ගැන ඇයට දැණුනේය. එයට හේතුවක් ඇයට වටහා ගැනීමට නොහැකිවිය. මහාවාපි ව්‍යාපෘතියේ සේවයට ගිය පසු ඇය වෙනස් වී ඇතැයි ඇයට සිතුණේ යෙහෙළියන් තුළ වෙනස් වීමක් ඇති වීමට කිසි දෙයක් අගනුවර තුළ සිදු නොවූ බව ඇය දැන සිටි නිසාය.

වෙනදා මෙන්ම මේ යුවතියන් කතා කළේ ඔවුන්ගේ සම වයසේ තරුණ ගැටව් ගැනය. නගරයේ සියලු තොරතුරු ඔවුහු පූනා සමග පැවූසුහ. ඇය නැවතී සිටි පෙදෙසේ තරුණයින් ගැන ඇගෙන් තොරතුරු විමසුවත් පූනාට ඒ ගැන කිසිවක් පැවසීමට තිබුණේ නැත.

'එහේදි වැඩිය කොල්ලො හමු උනේ නැහැ'

'ඉන්න අය ලස්සනද'

'උන් ළග මඩ ගඳ ඇති. හරක් එක්ක ඉඳල උන්ගෙ ගඳත් ඇති' එක කෙල්ලක් කීවේ නහය හකුලුවා ගනිමින්ය.

'උන් ඉන්නෙ අමුඩ ගහ ගෙනද, නැත්නම් නිකම් මද'

'මේ මං ඉන්නෙ ඔයාල හිතන විදිහෙ කැළේක නෙවෙයි. සත්තු එක්ක නෙවෙයි', ඒ මිනිස්සු මේ නගරෙ ඉන්න අයට වඩා ශීලාචාරයි. අහිංසකයි'

'ඔය දැන්ම ඉඳල ඒ පැත්තට හිත ගිහිල්ල තියෙන්නෙ'

sinhalaebooks.com



'ඔව් ඉතින් ඒකට හේතුවක් තියෙන්නත් එපාය'

'කවද හරි අපට කියන්න වෙයිනෙ දැන් හංගන්න හැදුවට'

එහෙත් මේ කතාබහ පෙරදින වල මෙන් ප්‍රීතිදායක නොවීය. ඇගේ මිතුරන් සිතුවේ පූනාගේ රෝගී තත්ත්වය නිසා ඇය අසහනයකින් පසුවන බවයි. ඇය විවේක ගත යුතු බව පවසමින් ඔවුන් හිතුවාට වඩා කලින් සමුගෙන ගියේ ඒ නිසා විය හැකිය.

පූනා සැබවින්ම විවේක ගැනීමට උත්සාහ කළේ ආපසු ගිය විට අතපසු වූ වැඩත් සමග ඇයට කිසිම විවේකයක් ලද නොහැකි වන බව සිහි වූ හෙයින්ය. ඇය අම්මා සමග යළිත් කතා කරන්නට තැත් කළාය. අභි ඇය සමග සුමනා ගැනත් ඇය නැවතී සිටිනා ගෙදර ගැනත් ඇගේ වැඩ කටයුතු ගැනත් කතා කරන්නට උත්සාහ කළාය. පූනා ටද සිය නැගනිය සමග මේ සියලු විස්තර පමණක් නොව ඇගේ සිතේ ඇති ප්‍රශ්නය ගැනද කතා කිරීමට උවමනා වුවද ඒ බර ඇය මත පටවන්නට ඇයි අකමැති වූවාය.

පූනා මුහුණ දී සිටි ප්‍රශ්නය ඇය විසින්ම විසඳා ගත යුතුවිය. ඇය විසින්ම ඒ ප්‍රශ්න සඳහා පිළිතුරු සොයා ගත යුතුය. වෙන කිසිවෙකුට එය කළ නොහැකි බව ඇය දැන සිටියාය.

පසුදින තාත්තා සමග ඇය වැඩ බිම වෙත පිටත්වූවාය.

## 9.

එක් දිනක් මහඇමති කාර්යාලයෙන් නිලධාරින් තුන් දෙනෙක් සමග අගනුවර ප ්‍රධාන පන්සලක භික්ෂූන් දෙනමක්ද වැඩබිමට පැමිණියහ. ඔවුන් **භගාර**ට පවසා සිටියේ අගනුවර ප්‍රධාන සංඝනායක විසින් ඔවුන් එවන ලද්දේ ගමේ පන්සල් වල භික්ෂූන්ට සහ ගම්වැසියන්ට මේ ව්‍යාපෘතිය පිළිබඳ කරුණු පහදා දෙන්නට බවය. මහාවාපියෙන් ගම්වැසියන්ට අත්වන ලාබ ප්‍රයෝජන ගැන පැහැදිලි කිරීමටය. මේ භික්ෂූන් දෙනමට නවාතැන් පිලියෙල කර තිබුනේ වැඩබිමින් මඳක් දුර බැහැර වූ අගනුවර පන්සල හා සම්බන්දකම් පැවැත් වූ පන්සලකය. වැඩබිමේ හෝ අසල පන්සලක නැවතීමට ඔවුන් කැමති වූයේ නැත.

නගරයෙන් ආ නියොජිත පිරිස ගමින් ගමට යමින් හැකි තරම් ගැමියන් හමුවී කතා කළහ. පන්සල් වලට ගොස් භික්ෂූන් මුනගැසුනහ. ඒ කිසිවෙක් ඔවුන් පිළිගත්තේ එතරම් සතුටකින් නොවන බව පෙන්වා සිටි අතර සමහරු එළිපිටම ඔවුන්ගේ විරුද්ධත්වය ප්‍රකාශ කළහ.

sinhalaebooks.com



ගමේ කාන්තාවන් හමුවී ඔවුන්ට මේ ව්‍යාපෘතිය නිසා අත්වන වාසි පැහැදිළි කරන්නට මේ පිරිස තව දුරටත් උත්සාහ කළහ. මීට වඩා පහසුකම් ඇති, වඩා සශ්‍රීක ප්‍රදේශයකින් ඔවුන්ට ඉඩම් ලැබෙන බවත්, නිවාස ඉදිකර ගැනීමට මුදල් ලැබෙන බවත් කියා සිටියහ. හැම අතින්ම ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය යහපත් වන බව ඔවුහු අවධාරණය කළහ.

කෙතරම් දරුණු නියඟයක් පැමිණියත් මේ වැව ඉදිකිරීමෙන් පසු ඔවුන්ට ජල හිඟයක් ඇති නොවන බවත්, හැමදාමත් ඇති තරම් ජලය පවතින බවත්, තවත් වැඩිපුර කන්නයක් ගොවිතැන් කළ හැකි බවත් ඔවුහු යළි යළිත් කියා සිටියහ.

'ඇත්තටම කෘෂි භෝග වගාවට වඩාත් යෝග්‍ය වෙන්නේ වියළි කාලය බව දැන් අපේ කෘෂිවිද්‍යාඥයින් සොයාගෙන තියෙනව', එක් නිලධාරියෙක් පැහැදිළි කළේය. 'ඒ කාලයේ වගා කිරීමෙන් වැඩි අස්වැන්නක් ලබා ගත හැකි වෙනවා. වල්පැලෑටි සහ කෘමී උවදුරු අවම වෙන්නේත් මේ කාලයදි තමයි. අලුත් භෝග වගාවටත් මේ කාලය තමයි වැඩියෙන්ම හොඳ. ඒ සඳහා අවශ්‍ය බීජ ලබා දිමටත් කෘෂිකාර්මික උපදෙස් ලබා දීමටත් අපේ නිලධාරීන් සූදානමින් ඉන්නවා'

'මේ ප්‍රදේශය ප්‍රධාන වරායට නුදුරින් පිහිටලා ඇති නිසා අපනයන භෝග වගාවටත් අවස්ථාවක් ලැබෙනවා. ඒ මගින් මුදල් උපයා ගැනීමට හැකි වෙනවා. අපනයනය නිසා ලැබෙන්නේ රන් කාසි. රිදී කාසි. මේ හැම ගමක්ම වැඩි කාලයක් යන්නට කළින් නගර බවට පත් වෙන බව සිකුරුයි.

'මේ ප්‍රදේශය ආසියාවේ සහල් ගබඩාව වෙනවා ඇති' එක් අයෙක් කළ කතාව ගැමියන්ට වටහාගත හැකි වූවාදැයි ඔහු කල්පනා නොකළේය.

'රජතුමාගේ අදහස මේ පළාත අපනයන ගම්මානයක් කිරීමයි. මෙතන ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයක් පිහිට වීමටයි. විදේශීය වෙළඳුන් මේ ගම් වලට ඇවිත් ඔබලාගේ අස්වැන්න කෙළින්ම මෙහිදී ම මිළයට ගනීවි'

නිලධාරීන්ගේ දේශන වලින් පසු භික්ෂූන් දෙදෙනා ගේ අනුශාසනා පවත් වන ලදී. මෙවැනි ව්‍යාපෘතියකට සම්මාදම් වීමෙන් අත්වන පින් සම්භාරය ගැන සිහිපත් කෙරුනේය. අතමිට සරු වන විට පන්සල් වලට ආධාර කිරීමටත්, වැඩි වැඩියෙන් පූජ්‍ය කර්ම වළට සහභාගි වීමටත් ලැබෙන අවස්ථාව පිළිබඳව සිහිපත් කළහ. රජතුමා විසින් තීරණය කර ඇත්තේ මේ වැව් බැම්ම අසල පන්සලක් ඉදි කිරීමටය. එය ලෝකයේ විශාලතම හා උසම ස්තූපය වනවා ඇත.

'මේ ස්තූපය ඉදිකිරීමට දායක වීමෙන් ඉමහත් පින් සම්භාරයත් අත් කර ගැනීමට මේ සියලු දෙනාට වාසනාව අත් වන්නේය'

'අප මෙතෙක් කතා කළේ මේ ගම්වැසියන්ට ලැබෙන ලාභ ප්‍රයෝජන ගැනයි. ඊට අමතරව රටේ විශාල ජන කොටසකට ද මෙයින් ඉමහත් ප්‍රයෝජන හිමිවනවා ඇති. බැම්මෙන් පහල ගං නිම්නයේ වැසි සමයට දැනට මුහුණ

sinhalaebooks.com



පානා ගංවතුර තර්ජනය මින් පසු ඇති නොවේ. මින් පසු ජලය මුදා හැරීම පාලනය කළ හැකි නිසා අවුරුද්ද පුරාම ජලය නිකුත් කිරීමට හැකි වනවා ඇත. ඒ ප්‍රදේශ වල අවුරුදු පතා සිදුවන විනාසය මින් පසු වළකිනවා ඇත.

පූනා මේ අය සමග මේ වැඩසටහන් වලට සහභාගි නොවූවත් සිදුවූ සියල්ල අසා දැන ගත්තාය.

මේ රාජ්‍ය නියෝජිත පිරිස පැවැත්වූ දේශන සහ අනුශාසනා ඉතා සාවධානව අසා සිටි ගැමි පිරිස ඔවුන් පිටත්ව ගිය පසු ගමේ පන්සලේ හාමුදුරුවන්ගෙන් උපදෙස් පතා සිටියහ.

තිසගුත තෙරණුවෝ මෙහි මූලිකත්වයට පත්වූයේ කාගේත් කැමැත්ත මතය. උන් වහන්සේ විසින් මේ සියලු ගම්වල වැසියන් හා පන්සල් වල භික්ෂූන් එකම කණ්ඩායමක් ලෙස එකම අරමුනක් සඳහා යොමු කිරීමට සමත් වූහ.

'මේ ව්‍යාපෘතියෙන් ලැබෙන ලාබ ප්‍රයොජනවලට වඩා ඉන් ඇතිවිය හැකි විනාසය අති විශාලයි. මගේ පුද්ගලික අදහස නම් මෙයින් කිසිම යහපත් ඇති නොවන බවයි' තිසගුත හිමියෝ රැස්වූ පිරිසට පැහැදිළි කළෝය. 'මේ අවට වනාන්තර වල ඇති මහා වනස්පතීන් අපේ ජාතික වස්තු ලෙසයි අප සැලකිය යුත්තේ. අවුරුදු ලක්ෂ ගණනාවත් තිස්සේ පවතින මේ වනාන්තර රැක ගැනීම අපේ යුතුකමක්. අපේ අනාගත පරම්පරාවන් වෙනුවෙන් අප එය කළ යුතු වෙනවා.

'ස්වභාවධර්මයා විසින් අපට ලබාදී ඇති දේ විනාශ කිරීමට කිසිම කෙනෙකුට අයිතියක් නැහැ. ඒවා පොදු වස්තුව. රජතුමාටවත් අපටවත් නොවෙයිල මුලු මහත් ලෝක වාසී සිලුම ජීවීන්ට අයිති වස්තුවක් මේ තියෙන්නෙ. අපටමේ වනාන්තර විනාශ කිරීමෙන් ඒ තුළින් තමන්ගේ ආහාර සපයා ගන්නා මිනිසා පමණක් නොව සතුන් ද පිඩාවට පත් වෙනවා. රජතුමාට හැකිවෙයි ඔබලාට වෙනත් විකල්ප ඉඩම් ලබා දෙන්න. ඒත් රජතුමාට පුලුවන්ද මේ වැනි මහා වනාන්තරයක් බිහි කරන්න? මේ වනාන්තරයේ ජීවත්වන සතුන්ට පක්ෂීන්ට ජීවත් වීමට ස්ථාන සොයා දෙන්න?'

'මේ වගේ වනාන්තරයක් බිහි වෙන්න අවුරුදු දහස් ගණනක් යාවි'

'අපට ලබා දෙන්න යන භූමිය මේ තරම් සශ්‍රීක නැහැ. ගල් තලා වලින් ගහනයි. පස සාරවත් නැහැ' එක් වැඩිහිටි ගොවියෙක් කියා සිටියේය.

'මේ වැව නිසා ජලයට යටවන භූමි ප්‍රමානය ඒ නිසා වගා කළ හැකි භූමි ප ්‍රමානයට වඩා කිහිප ගුනයකින් වැඩියි' ගිහි ජීවිතයේදී වාරිතාක්ෂණවේදියකුව සිටි දන්ත හිමි කියා සිටියේය.

'ඉතින් හමුදුරුවනේ අපට දැන් මොනවද කරන්නට ඉතිරි වෙලා තියෙන්නෙ'

'අපි කලබල නොවී සිතා බලමු'

sinhalaebooks.com



පූනා ඇතින් සිට මේ සියලු කටයුතු බලා සිටියාය. තිසගුත හිමි කැඳවූ රැස්වීමට යාමට ඇයට උවමනාව තිබුනත් එයින් පියාට සිදුවිය හැකි කරදර ගැන සිතා ඇය ඉවසාගෙන සිටියාය. ඇයට මේ ප්‍රශ්නයේ දෙපැත්තේම තර්ක හා අදහස් දැන ගැනීමට අවශ්‍ය විය. මෙහි පැමිණි මුල් දින වල්දී ව්‍යාපෘතියේ සේවය කරනා අයගේත් පියාගේත් උනන්දුව නිසා ඇයගේ සිත තුළත් ඇති වී තිබුණේ ඉමහත් උද්යෝගයකි. එසේම මේ අවස්ථාවේ ගැමියන් හා භික්ෂූන්ගේ අදහස් අනුව ඒ දෙසට ඇදි යාමට පෙර ඇය විසින් ඒ විරෝධය සාධාරන බවට සෑහීමට පත් විය යුතුය.

මේ ප්‍රශ්නය පිළිබඳව දෙල්විට ගම්බාරයාට කිසිදු අදහසක් ඇති ලෙස නොවේ ඔහු හැසිරුණේ. සමහරවිට ඒ ඔහුගේ ගම මේ වැවට යට නොවන නිසා විය හැකිය. එසේ නැතිනම් ඔහුගේ රාජපාක්ෂික භාවය නිසා විය හැකිය. මහඇමති වෙතත් ඔහුගේ පක්ෂපාතිත්වය ඇති වූයේ වැඩබිමට සේවකයින් තෝරා ගැනීමේදී ඔහුගේ ගමට මුල්තැන දීමත්, මහඇමතිගේ දුව ඔහුගේ නිවසේ නැවැත්වීමත් නිසාය. පරම්පරා ගනනාවක් යන තුරු අවට ගම් වල ජනයා පවා ඒ ගැන කතා කරනවා ඇත. ගම්බාරයාගේ ගෙදර කියන්නා සේම මහඇමතියාගේ දුව නැවතී සිටි ගෙදර ලෙසත් එය හඳුන්වනවා ඇත.

සුමනාද මේ විරෝධතා ව්‍යාපාරය ගැන කිසි හැඟීමක් පළ කළේ නැත. ඇය දැන සිටියේ ඔවුන්ගේ ගමේ පන්සලේ හාමුදුරුවන්ද තිසගුත හාමුදුරුවන් හා එක්වී ඇති බව පමණය.

භික්ෂූන් වහන්සේලා අනිත් පළාත් වල පන්සල් කරා ගොස් ඒවායේ වැඩවසන භික්ෂූන් දැනුවත් කිරීමේ කටයුතු ආරම්භ කළෝය. නායක හාමුදුරුවන් විසින් උපදෙස් දී තිබුනේ විශේෂයෙන් අගනුවර වාසී භික්ෂූන් දැනුවත් කිරීමටය. රජු සහ රජයේ නිලධාරීන් සමග ඔවුන්ගේ සමීප සමබන්දතා ඇති නිසා ඔවුන්ගේ ව්‍යාපාරයට එය වැදගත් වන බව ඔවුහු දැන සිටියහ. මේ පන්සල් වෙත ගියේ වැඩිහිටි හාමුදුරුවරු ය.

අගනුවර හාමුදුරුවරු මේ ගැන එතරම් උන්නදුවක් දැක්වූයේ නැත. මේ පන්සල සෑම විටම ඉතාමත් කාර්ය බහුල විය. නොයෙක් අවශ්‍යතා සඳහා පැමිණෙන අයගෙන් පන්සල් පිරී තිබුණේය. මේ පන්සල් වල භික්ෂූන්ට ඔවුන් නොදන්නා ප ,දේශයක වැවක් ඉදිකිරීම ගැන කලපනා කරන්නට කාලයක් හෝ උවමනාවක් තිබුණේ නැත.

අගනුවර පන්සල් වලට ගිය භික්ෂූන්ට දානය සඳහා පින්ඩපාතය වඩින්නට අවශ්‍ය නොවීය. සෑම දිනකම රජයේ නිලධාරියෙකුගේ හෝ ධනවත් ව්‍යාපාරිකයෙකුගේ නිවසක දානය සඳහා ඔවුන්ට ආරධනා ලැබුන අතර, හීල් දානයට නගරයේ නිවසකින්, සමහර දින වල නිවාස කිහිපයකින් ගෙන එන ලදී. ගමෙන් ගිය හාමුරුවරුන් වඩාත් පුදුමයට පත්වූයේ මේ අගනුවර පන්සල් වල රාත්‍රී ආහාර

sinhalaebooks.com



පිලියෙල කිරීමත් සෑම භික්ෂුවක්ම කිසිම පැකිලීමක් නැතිව රාත්‍රී ආහාර වැළඳ මත්ය.

අගනුවර විශාල පිරිවෙන් ආයතන වල ශිෂ්‍ය භික්ෂූන් දහස් ගණනක් සිටි නිසා ආහාර පිළියෙල කිරීමට වෙනම ගොඩනැගිලි සහ සේවක පිරිස් සිටි අතර අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිති පතා පිරිවෙනට ලැබුණේය. මේ පිරිවෙන් වල සිටි භික්ෂූන් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු මිස බාහිර වෙන කිසිම දෙයක් ගැන සිතන්නට කාලය ගත කලේ නැත. මේ භික්ෂූන් කිසිවෙක් පිඩුසිඟා වැඩියේ නැත. ඒ සඳහා අවශ්‍යතාවයක් තිබුණේත් නැත. එහෙත් ඒ තරුණ භික්ෂූන් හට නියම කරුණු පහදා දුනහොත් ඔවුන්ගේ සහයෝගය ලබාගත හැකියැයි තිසගුත හිමියන් තුළ විශ්වාසයක් තිබුණේය.

මේ තත්ත්වය දැනගත් පසු තිසගුත හිමියන් ඒ පිරිවෙන් වෙත ගමේ පන්සල් හි සිටි තරුණ හාමුදුරුවරුන් පිටත් කර යැවීය. පිට පළාත් වලින්, විශේෂයෙන් ඔවුන්ගේ පළාතෙන් පැමින සිටි හාමුදුරුවරුන් ප්‍රථමයෙන් හඳුනාගෙන මේ මතුවී ඇති තත්ත්වය හා එහි බැරෑරුම්කම වටහා දීම මේ තරුණ භික්ෂූන්ගේ වගකීම විය. මේ තරුණ ශිෂ්‍ය භික්ෂූන් හරහා වැඩිහිටි භික්ෂූන් වෙත සමීප වන්නට තිසගුත හිමි බලාපොරොත්තු විය.

ශිෂ්‍ය භික්ෂූන් මේ ප්‍රශ්නය පිළිබඳ උන්නඳුවක් දක්වන්නට වූයෙන් කුඩා කන්ඩායම් ලෙස ඔවුන් එකතු කරගෙන මේ ගැන කරුණු පැහිදිලි කිරීම සිදුකරන ලදී.

විරොධතා ව්‍යාපාරයට සම්බන්ද භික්ෂූන් නගරයේ පන්සල් සහ පිරිවෙන් වලට ඇතුලු වී ඇති බව හමුදා ප්‍රධානියාට සැලවිය. ඔහු වහාම හමුදා භටයින් කිහිප දෙනෙක් භික්ෂූන් ලෙස වෙස් ගන්වා පිරිවෙන් වලට යැවීය. මේ භටයින් මගින් හමුදා ප්‍රධානියාට දැන ගන්නට ලැබුනේ පිරිවෙන් ශිෂ්‍යයින් මහවාපියට වරුද්ධව නැගී එන උද්ඝෝෂනයට එකතු විය හැකි බවය. ඔහු වහාම මේ බව රජුට දන්වා සිටියේය.

'මේ කටයුතු වහාම නවත්වන්න ඔබට සියලු බලතල තියෙනව. නවත්වන්නේ කෙසේද කියා මට විස්තර අවශ්‍ය නැහැ' රජු ගේ තීරණය විය.

ටික දිනකින් අගනුවර ප්‍රචාරක කටයුතු සඳහා පිටත් ව ගොස් සිටි සියලුම භික්ෂූන් ආපසු ගමට පැමිණි බව පූනාට දැන ගන්නට ලැබින. ඒ තරම් ඉක්මනට ඔවුන් ආපසු ආවේ ඇයිද යන්න පූනාට දැනගත නොහැකි විය. සුමනා හෝ ගැමියන් ඒ ගැන නොදැන සිටියා විය හැකිය. සුමනා ඇයගෙන් ඒ ගැන තොරතුරු වසන් නොකරන බව පූනා විශ්වාස කළාය. ගමෙන් ගිය හාමුදුරුවන් බලෙන් නගරයෙන් පිටමන් කරන්නට ඇති බවටත්, සමහර විට ඇගේ පියාද ඒ ක්‍රියාවට සම්බන්ද වන්නට ඇති බවටත් පූනාට සැකයක් ඇති විය. පියාගෙන් ඒ ගැන අසන්නට ඇය අකමැති වූයේ එයින් ඔහු අපහසුතාවයකට පත්විය හැකි නිසාය. ඔහු කිසි දිනක ඇයට බොරු නොකියන බව ඇය දැන සිටියාය.

sinhalaebooks.com



ඇගේ මුලු ජීවිතයම ව්‍යාකූල වෙමින් පැවතුණේය. ඒ නිසා ඇගේ රාජකාරි කටයුතු වල යෙදීම ද ඇයට යම් තරමකට අපහසු විය. සමහර විට වැදගත් තොරතුරු වාර්තා ගත කිරීමට හෝ ඉදිරියට කළ යුතු දෑ සිහි කැඳවීමට ඇයට අමතක වන්නට විය.
අගනුවරින් පිට සෑම පළාතකම විරෝධතා ව්‍යාපාරය සාර්තක ලෙසින් පැතිරෙමින් තිබුණේය.

මහාවාපි යේ ඉදිකිරීම් වැඩද නොනවත්වාම සිදුවිය.

## 10.

මේ අතර පිට රටක සිට පැමිණි වාරිතාක්‍ෂණවේදියා ඔහුගේ රාජකාරි බාරගෙන තිබුණේය. ඔහු පැමිණියේ හදිසියේම **හගාර** වැඩබිමේ සිට අගනුවරට කැඳවූ දිනට පසු දිනය. ඉන් පසු **හගාර** ගැන කිසිම තොරතුරක් ව්‍යාපෘතියේ කිසි කෙනෙකුට දැන ගන්නට ලැබුණේ නැත. අලුත් නිලධාරියා හැකි තරම් වැඩ කටයුතු ඉක්මන් කිරීමට තැත් කළේය. ඔහු ප්‍රකාශ කළේ නියමිත දිනට වැඩ අවසාන කිරීම ඔහුගේ එකම අරමුන බවත් ඒ සඳහා මුදල් හෝ ඉදිකිරීම් ද්‍රව්‍ය හෝ මිනිස්බලය කෙතරම් වැය වුනත් ඔහුට ප්‍රශ්නයක් නොවන බවත්ය.

අවස්ථාවක් ලද සෑම විටම ඔහු කලින් සිටි තාක්‍ෂණවේදියා සමච්චලයට ලක් කළේය. ඔහු වැඩබිමේ සිටි වෙනත් කිසි කෙනෙකුගේ අදහස් කිසි විටකවත් විමසුවේ නැත. කිසිවෙකු දෙන අදහස් වලට සවන් දුන්නේ නැත. ඔහු බලාපොරොත්තු වූයේ ඒ සියලු දෙනාම ඔහුගේ අණ පිළිපැදීමය.

**හගාර** පිළිබඳව විවිධ කතා ඒ අතර පැතිරෙන්නට විය. රජුගේ අනින් ඔහුගේ හිස ගසා දමන ලද බව, නගරයෙන් පිටුවහල් කරන ලද බව, සිරබාරයට පත්කළ බව, ඔහුගේ බිරිඳ සහ දරුවන් හමුදා ප්‍රධානියාගේ වහලුන් ලෙස යොදගත් බව මේ කතා අතර විය. මහඇමති ගෙන් පූනා මේ ගැන විමසූ විට ඔහු පිළිතුරු දීමෙන් වැළකී සිටියේය.

පූනාට වැටහුනේ **හගාර** ඉවත් කිරීම සැලසුම් සහගතව කරන ලද්දක් බවයි. **හගාර** නුවරට කැඳවූයේ අලුත් තාක්‍ෂණවේදියා මෙරටට පැමිණි පසුව විය යුතුය. ඔහු ගෙන්වා ගන්නට මාස කිහිපයක සිට සුදුසු අයකු සොයා බලා තෝරා ගත යුතු විය.

මේ පුද්ගලයාට ඔවුන්ගේ භාෂාව තරමක් දුරට කතා කළ හැකි විය. වැඩබිමේ කතාවට ලක්වූයේ ඔහු තාක්‍ෂණවේදියෙක් නොව පුහුණු කම්කරුවෙක් බවත් මේ තනතුරට ඔහු පත් කර ඇත්තේ ඔහුට මෙරට භාෂාව කතා කළ හැකි වූ

sinhalaebooks.com


නිසාත්, රජ අණ පිළිපැදීමට ඔහුට මෙරට ප්‍රශ්න වලින් බලපෑමක් නොවිය හැකි නිසාත් බවය.

මේ සියලු කටයුතු වලට තාත්තා සම්බන්ධව ඇතැයි යන සැකය දිනෙන් දින වර්ධනය වීමත් සමග පූනා ඔහුගෙන් ටිකෙන් ටික ඇය නොදැනුවත්වම ඈත් වන්නට වූවාය. පූනාට මේ ව්‍යාපෘතියෙන් ඉවත් වන්නට උවමනා විය. මේ වන විට මහාවාපිය ගැන ඇය බොහෝ සෙයින් කලකිරී සිටියාය. එයින් කිසිදු යහපතක් නොවන බවත් ඇති වන්නේ මහා පරිසර විනාශයක් බවත්, මේ ගම්වැසියන් ගේ ජීවිත අඳුරේ දැමීමක් බවත් ඇයට වැටහී තිබිණ. එහෙත් ඇගේ සිතේ ඇති දේ පියා සමග කියන්නට ඇයට සිත් දුන්නේ නැත.

වැව් බැම්ම ඉදිකිරීම් නොනවත්වාම කෙරීගෙන ගියේය. මිනිසුන් වහලුන් මෙන් දිවා රෑ නොබලා වැඩට යොදවනු ලැබීය. තව තවත් මිනිසුන් වහල් සේවයට ගෙන්වා ගන්නා ලදී. රටේ අනිත් සෑම පෙදෙසකම වැව් හා ඇල මාර්ග නඩත්තු කිරීම් සහ අලුත්වැඩියා කිරීම් සියල්ල අත්හිටුවා ඒ සියලුම පුහුණු ශ්‍රමිකයින් මෙහි ගෙන්වා ගන්නා ලදී.

කලින් සිටි තාක්ෂණවේදියාට අත්වූ ඉරනම කුමක් වුවත් එය යහපත් දෙයක් විය නොහැකි බව ඇයට වැටහීමත්, අලුත් තාක්ෂණවේදියාගේ අමානුෂික ක්‍රියාකලාපයත් නිසාත් පූනා තීරණයක් ගැනීමට පෙළඹුණේය.

රේටා වැඩබිමට පැමිණි අවස්ථාවක, දින කිහිපයකට ගෙදර යාමට අවශ්‍ය බව පවසා පූනා ඔහු සමග අගනුවරට ගියාය. ගෙදර ගිය පසු ඇය අම්මාට කීවේ තව දුරටත් ඇයට මහාවාපි ව්‍යාපෘතියේ වැඩ කළ නොහැකි බවයි. හිතට එකඟව නොකලහැකි රාජකාරියකට ඇයට බල නොකරන ලෙස පියාට කියන්නැයි ඇය අම්මාගෙන් අයැද සිටියාය. අම්මාද ඇයගෙන් ඒ ගැන වැඩි විස්තර නොඇසුවේ ඇගේ සිතිවිලි ඇය දැන සිටි නිසාය. සිය සැමියාට මේ ගැන කෙසේ කියන්නදැයි ඇය කල්පනා කළාය.

මහඇමති සිය දියණියගේ තීරණය කිසිදු කතාවක් නැතිව පිළිගත්තේ ඔහු එය බලාපොරොත්තුවෙන් සිට ලෙසය.

'දරුවා අකමැති දෙයක් කරන්න කියල බල කරන්න මට බැහැ', ඔහුගේ පිළිතුර විය.

'ඒ වෙනුවට කවුරුවත් ඉන්නවද පත් කර ගන්න' බිරිඳ ඇසුවාය.

'පූනාගෙ තැන ගන්න කෙනෙක් නම් කවදාවත් සොයාගන්න බැරිවෙයි. මෙතෙක් කල් මට හිතට බයක් නැතුව හිටියෙ දුව එතැන ඉතා හොඳින් වැඩ කටයුතු බලාගත් නිසයි. ඒත් දැන් පිටරට මිනිහ ඇවිත් නිසා වැඩ කටයුතු නම් ඉක්මනට කෙරීගෙන යනව. මට අවශ්‍ය දැන් ඒ සියලු වැඩ සම්බන්ධීකරනය කරන්න කෙනෙක් තමයි'

sinhalaebooks.com



මහඇමති යළිත් වරක් මේ තනතුරට සුදුසු කෙනෙක් සොයා ඔහුගේ මතකය අවුස්සන්නට විය. මේවර ඔහුට එය තරමක් පහසු වූයේ භාරදූර වැඩ කොටස අවසන් වී තිබීමත් අලුත් තාක්ෂණවේදියා ගැන තිබූ පැහැදීමත් නිසාය. ඔහු දැන සිටි තරුණයින් ගැන යළි සිතන විට එක් මුහුණක් වෙත ඔහුගේ සිත නැවතුණේය. ඒ බටහිර පළාතේ වරායේ අධිකාරි ලෙස සේවය කළ තරුණයාගේ මුහුණය. ඔහු දින කිහිපයක් එක දිගටම දිවා රෑ සේවය කිරීමට තරම් ශක්තිය හා උනන්දුව ඇති තරුණයෙකු බව රේටා ට සිහිවිය. ඔහු ප්‍රශ්න මතුවූ විට කරදර අභියෝග මතුවූවිට වඩා කාර්යක්ෂම වන, වඩා උද්යෝගිමත් වන කෙනෙකි. ඒ තරුණයාගේ නම මතක් කර ගැනීමට මහඇමතිට සුලු වෙලාවක් ගතවිය. ඔහුගේ නම තබා ය. කඳුකරයේ උපත ලැබූ තරුණයෙකි.

එදිනම මහඇමති තබා වෙත පනිවිඩයක් යවමින් ඔහුගේ රාජකාරි සියල්ල සහකාර අධිකාරිට පවරා වහාම අගනුවරට එන ලෙස ඔහු දන්වා සිටියේය.

තබා මහාවාපි වැඩබිමට පැමින ව්‍යාපෘති කළමනාකරු ලෙස පසුදින වැඩ බාර ගත්තේය.

ඉදිකිරීම් කටයුතු ඉතා සීග්‍රයෙන් කෙරීගෙන ගියේය. එහෙත් ඒ තිසගුත හාමුදුරුවන් වැව් බැමීම පාමුල උපවාසය අරඹන තුරුය.

## 11.

තිසගුත තෙරණුවන්ගේ අති ශොචනීය වූත්, කෲර තර වූත් අවසානයෙන් පසු විතා විසින් ඉදිරියට ගෙනයන ලද විරෝධතා ව්‍යාපාරයද ක්‍රමයෙන් වර්ධනය විය. රජු හා රජුගේ නිලධාරින් විසින් කිසිවක් නොදන්නා මෝඩ ගැමියන් ලෙස සැලකූ මේ ගම්වැසියන් ස්වභාවධර්මය හා පරිසර පද්ධතිය ගැන ඉතා හොඳ අවබෝධයකින් ජීවත් වූයේ ඒ ඔවුන්ගේ ජීවිතයේ කොටසක් වූ හෙයිනි. මේ පරිසර පද්ධතියේ සමතුලිතභාවය රැඳී තිබුණේ ඉතා සියුම් සංවේදී තත්ත්වයක බවත්, ඉතා සුලු වෙනස්වීමකින් හෝ බාහිර බලපෑමකින් එය භයානක ලෙස වෙනස් විය හැකි බවත් ඔවුහු දැන සිටියහ. ඒ ගැන තවත් කෙනෙකුට විස්තර කිරීමට අපොහොසත් වූ නිසාම ඔවුන් ඒ ගැන කිසි අවබෝධයකින් තොර අය ලෙස සිතා සිටීම රජය විසින් කරන ලද බරපතල අවතක්සේරුවක් විය.

වැව් බැමීමට උඩින් වූ ප්‍රදේශයේ ගහ කොල වලට සිදුවන හානියත්, එහි ජීවත්වන සතුන්ට හා කුරුල්ලන්ට සිදුවන විපතත් සුමනාටද වැටහුණේය. කුඹුරු වල සිටි කුඩා කෘමීන් ගෙන වුවද සිදුවන යහපත ඇය පූනා ට කියා දුන්නාය.

sinhalaebooks.com



'බලන්න මේ මකුලුවා දිහා' දිනක් ගොයම් ගස් කිහිපයක් අතර බැඳ තිබූ මකුලු දැලක් ඇය පූනාට පෙන්වූවාය. දැල මත රන්වන් පාට මකුලුවෙක් සිටියේය.

'ඉතින් මේ කෘමීන් ගෙන් ගොයමට හානි වෙන්නෙ නැද්ද'

'ඒ සතුන් අපේ හිතවත්තු. උන් මේ ගොයමට එන හානිකර කෘමීන් ගොදුරු කරගෙන අපේ ගොයම ආරක්‍ෂා කර දෙනවා මිසක හානියක් කරන්නෙ නැහැ'

ඇය අවට සිටි කුරුල්ලන් පමණක් නොව කුඹුරේ සිටි කූඹීන් පවා ඔවුන්ට පිහිට වන සැටි පෙන්වූවාය.

'මේ කූඹි ගොයමට හානිකරන කෘමීන්ගෙ බිත්තර විනාස කරනව. මේ වතුරෙ ඉන්න මාලු, මඩුරුවන්ගෙ පිලාවුන් කා දමනව. ඒ හින්දයි අපට රෑට හොඳට නිදාගන්න පුලුවන් වෙන්නෙ'

ආදි මුතුන් මිත්තන්ගේ සිට ඔවුන්ට උරුම වූ මේ මහා දැනුම් සම්භාරය කොතෙක් දැයි කිව නොහැකි වුවත්, මේ සිදුවන හානිය පිලිබඳව ඉතා හොඳින් අවබෝධ කරගෙන තිබුණත්, විරෝධතාවට එකතුවීමට සමහරු බිය වූහ. තමාට විරුද්දව එන කිසිවෙකුට කිසිම සමාවක් රජුගෙන් නොලැබෙන බව ඔවුහු දැන සිටියහ. ස්වභාවධර්මය රජුට වඩා කරුනාවන්ත බවත් ඔවුහු දැන සිටියහ. ඒ නිසා රජුගෙන් අත්විය හැකි දරුණු පලවිපාක වලට වඩා ස්වභාවධර්මයාගේ පිහිට පතාගෙන, සිදුවන හානිය ඉවසා සිටීමට වැඩි දෙනෙක් තීරණය කර තිබුණේය.

තිසගුත හාමුදුරුවන්ගේ අපවත්වීමෙන් පසු අනිත් භික්‍ෂූන් වහන්සේ අතරද මද පසුබෑමක් සිදුවිය. පසුබා සිටි ගම්වැසියන්ගෙන්ද මේ භික්‍ෂූන්ට බලපෑමක් ඇති විය.

විරෝධතාව ගමේ පන්සල් වලට සිමාවිය. පෝය දින වල ගමේ පන්සලට රැස්වූ සියලු ගැමියන් නිහඬව බාවනා කරමින් සාමකාමී විරෝධතාවක නියැලුනහ. අගනුවර දක්වා විරෝධතා පා ගමනක යෙදෙන්නට වඩා ක්‍රියාකාරී තරුණ පිරිස් නිතරම කතා වුවත් එය ක්‍රියාත්මක වූයේ නැත. එය දීර්ග සාකච්චාවලටත් සමහර විට උනුසුම් වාද වලටත් පමණක් සීමා විය.

චිතා මුල සිටම භික්‍ෂූන් වහන්සේලා අතර මේ සිදුවන්නට යන විනාශය පිළිබඳ සාකච්චා අසා සිටියාය. තිසගුත හිමියන්ගේ අපවත්වීමෙන් පසු ඇය මේ ගැන තව තවත් කරුණු හදාරන්නට වූවාය. මේ ව්‍යාපාරයට නායකත්වය දීමට වෙන කිසිවෙකු ඉදිරිපත් නොවන බව වැටහී ගිය දින සිට ඇය ඒ වගකීම බාරගන්නට තීරණය කළාය. ගිහි ජීවිතයේදී චාරිතාක්‍ෂණවේදියකුවූ හාමුදුරුවන් හමුවී ඇය මේ අර්බුදයේ තාක්‍ෂණික ප්‍රශ්න ගැන අසා දැනගත්තාය.

දන්ත හිමියන් වැඩසිටියේ ඇය සිටි ගමේ සිට දින දෙකක් පමණ දුරින් අත්හැරදමන ලද පිරිවෙනක නටබුන් වූ කුටියකය. වාරිකර්මාන්තය පිළිබඳව

sinhalaebooks.com



මෙරට පමණක් නොව අසල්වැසි රටවලද ඉතා ප්‍රසිද්ධියක් ලබා සිටි මේ භික්ෂුව චිතාට ඉතා සරල භාෂාවෙන් මේ ව්‍යාපෘතිය හා එයින් වන හානිය ගැන කරුණු පැහැදිලි කළේය. වැවක් ඉදිකිරීමට තැනක් සොයා ගැනීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු ගැනත් ඒ සඳහා සුදුසු නොවන ස්ථාන ගැනත් උන්වහන්සේ කියා දුන් සේක.

මේ අනුව චිතාට ආපසු ගැමියන් හමුවූ විට මහාවාපි වැව් බැම්මෙන් ඇති වන තර්ජන ගැන පැහැදිලි කරන්නට හැකි විය. රජුගේ නිලධාරීන් විසින් කරනා ප්‍රචාර වලට පිළිතුරු සපයන්නට ඇයට හැකි විය. ගම්වාසීන්ට අලුතින් ලබා දෙන බිම් වගාවට නුසුදුසු වූත් වාරිපහසුකම් අවම වූත් ප්‍රදේශයක් බව ඇය පැහැදිලි කළාය.

'මේ නිලධාරීන් පෙන්වන ලස්සන අනාගතයක් අපට ලැබෙන්නෙ නැහැ. මේ අපට අලුතින් ලැබෙන ඉඩම් සේරම කන්න තුනක් වැඩ කරන්න ජලය ලැබෙන බව මේ අය කියන්නෙ බොරු. අපේ රටේ ඉන්න මේ ගැන වඩාත් හොඳම දැනුමක් තියෙන අපේ ස්වාමීන් වහන්සේ කෙනෙක් මට තේරුම් කරල දුන්නා මේ වැව හැදුවට පස්සෙ ඒකෙන් වගා කරන්න පුලුවන් කුඹුරු ප්‍රමාණය දැනට අප වගා කරන කුඹුරු ප්‍රමාණයට වඩා හුඟක් අඩුවෙයි කියල. මහ කන්නය විතරක් යම්තම් වගා කරගන්න පුලුවන් වෙයි කියල

'ඒ කියන්නෙ අපේ අස්වැන්න අඩුවෙනව. අපට කෑම හිඟ වෙනව. නියඟක් ආවොත් අපේ දරුවන්ට හාමතේ මැරෙන්න වෙනව' මේ කතාව අසා සිටි ගම්වැසියන්ට තමන් පත්ව සිටිනා අසරණ තත්ත්වය පැහැදිළි වන්නට විය. 'මේ පළාතෙ තියෙන හොඳම වගා බිම් සේරම මේ වැවට යට වෙනව'

මුලදී චිතා ගේ කතාව අසා සිටින්නට වැඩි දෙනෙක් එතරම් උනන්දුවක් දැක්වූයේ නැත. ඇය මේ ගමේ සිටි තවත් එක තරුණියක් පමණක් විය. වාරි කර්මාන්තය ගැනත්, පරිසරවිද්‍යාව ගැනත් ඇය දන්නේ මොනවාදැයි ඔවුහු සිත හ. තිසගුත හාමුදුරුවන්ගේ නැඟණිය වූ නිසාම ඇයට මේ ප්‍රශ්නය ගැන ඔවුන්ට කියා දෙන්නට හැකියාවක් ඇතැයි කිසිවෙක් මුලදී විශ්වාස කළේ නැත.

එහෙත් ඒ අතරම හාමුදුරුවන්ට අත් වූ භයානක කෲර මරණය නිසා කෝප වී සිටි ජනතාව ඒ පිලිබඳව නිහඬව සිටීමට ද කැමති වූයේ නැත. උන්වහන්සේ ජීවිතය කැප කළේ ඔවුන් වෙනුවෙන් බව කාටත් සිතට තදින් දැණුනේය.

'මේ වැව් බැම්ම නිසා අපට එක පාරටම පේන්නෙ නැති හුඟක් විනාශ සිද්ද වෙනවා. ගඟේ වතුර ගලාගෙන යාම වෙනස් වීම ගඟේ ඉන්න මාලුන්ට බලපානව. අපට මේ ගඟේ ඉන්න මාලු අවශ්‍යයි. අපේ දරුවන්ට පෝශ්‍යදායී ආහාරයක් හැටියට විතරක් නෙවෙයි අපේ පරිසර පද්ධතියෙ ඒ මාලුන්ටත් තැනක් තියෙන නිසා' ඇය වට පිට බැලුවේ රැස්ව සිටි අය ඇගේ කතාව අසා සිටිනවාදැයි දැනගන්නටය. ඇය මේ ගැන වඩ වඩාත් කතා කරන්නට තැත් කළොත් ගම්වැසියන් අසා නොසිටිනු ඇතැයි ඇය සිතුවාය. ඒ අතරම මේ සියලු

sinhalaebooks.com



කරුණු ඔවුන් දැන ගත්තේ නැතිනම් මෙයට විරුද්ධව නැගී සිටින්නට ඔවුන් උනන්දු නොවන බවත් ඇය දැන සිටියාය.

'මෙ ගඟ අවුරුදු දහස් ගණනාවක් තිස්සෙ ගලා බැස්සෙ මේ විදිහටමයි. කිසිම වෙනසක් සිදුඋනේ නැතුව. මේ අවට ගහකොලත් සත්තුත් ජීවත් උනේත් කිසිම හිරිහැරයක් බාධාවක් නැතුව. ගහකොලත්, සත්තුත්, කුරුල්ලොත් අපිත් එක්ක කිසිම ගැටීමක් නැතුව, කිසිම කරදරයක් නැතුව සාමකාමීව ජීවත් උනා. කාටවත් කාගෙන්වත් තර්ජනයක් ඇති උනේ නැහැ. මේ ගඟත් ඒ අවට ඇති කුඩා වැව් පද්ධතියත්, මේ නිම්නයේ ජීවත් වෙන අප හැමෝටම නිදහසේ සතුටින් සාමයෙන් ඉන්න පුලුවන් උනා. කාටවත් හිරිහැරයක් නොකර, කාටවත් අත පාන්නේ නැතුව අපට ඉන්න පුලුවන් උනා.

'එත් දැන් ඒ සේරම දේවල් වෙනස් වෙන්නයි යන්නෙ. අපේ මේ කුඹුරු ටිකත්, හේන් ටිකත්, ටික දවසකින් වතුරට යට උනාම අපට කන්න දෙයක් නැති වෙනව. අපට රජයෙන් දෙන දෙයක් ලබාගෙන හිඟන්නො වගේ ඉන්න වෙනව ආයිත් හේනක් කුඹුරක් කොටල ඒකෙ අස්වැන්න නෙලා ගන්න කම්' ඇය මොහොතකට කතාව නැවැත්වූයේ මේ බරපතල තත්ත්වය ගම්වැසියන්ට හිතට කාවදින තෙක්ය.

'මේ වනාන්තර, කුඹුරු, කුඩා වැව් සියල්ල යට කරගෙන එක මහා විශාල ජල කඳ ක් හැදුනාම ඒ නිසා මේ මුලු මහත් පරිසරයම වෙනස් වෙන්න පුලුවන්. මේ මහා වැවක වතුර වාෂ්ප වෙලා ඉහලට ගියාම ඒ නිසා අවට වාතයේ තෙතමනය වෙනස් වෙයි. වලාකුලු හැදුනට බොහෝවිට ඒ වැස්ස අපට ලැබෙන එකක් නැහැ. හුළඟට ගසාගෙන ගිහින් වෙන පළාතකට ඒ වැසි ලැබෙයි. සමහර විට වෙන රටකට. අපේ දේශගුනය වෙනස් වෙයි. වැසි ලැබෙන කාලය වෙනස් වෙයි. එහෙම උනාම අපට අපේ වගාවන් හරියට සැලැස්මකට කර ගන්න බැරි වෙනව. අකාලෙට වැසි ආවොත්, එහෙම නැත්නම් නියම කාලට වැසි නොලැබුනොත් අපේ වගාව විනාස වෙනව. එතකොට අපේ දරුවො විතරක් නොවයි සත්තු උනත් බඩගින්නෙ.

'ඒ අතර මේ වැව් බැම්ම බිඳුනොත්, මේ මහා ජල කඳක් එක පාරටම අපේ ගම්මාන හරහා ගලාගෙන ආවොත් වෙන විනාසය හිතා ගන්නවත් බැරි වෙයි. මෙතන මේ තරම් විශාල වැව් බැම්මක් හදන්න තරම් මේ පොළාව සුදුසු නැහැ කියල අපේ හාමුදුරුවො විතරක් නෙවෙයි මෙතන කලින් වැඩ කළ වාරිතාක්ෂණවේදියත් සැක කළා'

විතා විශ්වාස කලේ මේ සියලු විස්තර ගම්වැසියන් හට ඉදිරිපත් කළ විට ඔවුන් මුහුණ පා ඇති තර්ජනය වඩා හොඳින් වැටහීම නිසා වඩා උද්යෝගයකින් මෙයට විරුද්ද වෙනවා ඇති බවයි.

ඇගේ කතාවෙන් පසු භික්ෂුවක් පන්සල් වලට සිදුවන විනාශය ගැන කතා කළහ.

sinhalaebooks.com



'අපට අවශ්‍ය තරම් මුදල් හා ගොඩනැගිලි ද්‍රව්‍ය ඇත්නම් මේ හැම දෙනාටම අලුත් ගෙවල් හදාගන්න පුලුවන් වෙනත් ස්ථානයක, සමහර විට දැන් ඉන්න ඒවාට වඩා අලුත් පන්නයට. ඒ උනාට අපේ පන්සල් විනාශ උනාම ඒවා අලුත් පන්නයට හැදුවත් මේ පැරණි පන්සලේ වටිනාකම තියෙනවද? සමහර විට මේ අවුරුදු දහසකට වඩා පැරණි බෝධීන් වහන්සේ වතුරට යටවෙලා අපවත් වෙන්න ඉඩ හැරල අපට අලුත් බෝධීන් වහන්සේලා ඇති කර ගන්න පුලුවන් ද අපට?

'මේ මහායාල පන්සලේ බෝධීන් වහන්සේ පැවත එන්නෙ බුදුරජානන් වහන්සේ බුදුවන අවස්ථාවෙ සෙවන දුන් බෝධීන්වහන්සේගෙ පැලයකින්. මේ ශ්‍රී මහා බෝධියත් අපට විනාස වෙන්නට ඉඩ දීල බලා ඉන්න පුලුවන්ද?

'මේ රටේ පැවැත්මත් සුභසිද්ධියත් මේ බෝධීන් වහන්සේ සමග බැඳී තියෙනව කියලයි අපේ පරන පොත්පත් වල සඳහන් වෙන්නෙ. මේ බෝධීන්වහන්සේ යහතින් පවතින තාක් කල් පමණයි අපේ රටත් යහතින් පවතින්නෙ, තිස්තුන් කෝටියක් දෙවි දේවතාවන්ගෙ ආරක්ෂාව අපේ රටට ලැබෙන්නෙ.

'අපේ රටේ ඇති ඉතාම පැරණි පන්සලක් මේ. ඉතින් අපි මේ පන්සල් ගොඩනැගිලි ගඩොලින් ගඩොල ගලවලා වෙන තැනක ගිහින් ආයිත් ඉදි කරත් මේ පන්සලම වෙයිද එතන තියෙන්නෙ? ඊටත් වඩා මේ වැව හදන්න තියෙන හදිසිය අතරෙ අපට පුලුවන් ද මේ ගඩොල් ටික ගලවලා වෙන තැනකට ගෙනියන් වතුරට යට වෙන්න කලින්?

'මේ ඇත්තන්ට සැකයක් ඇති වෙන්නෙ නැද්ද ඇයි මේ තරම් හදිසියක් මේ වැව හදල ඉවර කරන්න හදන කොට? හොඳ සැලැස්මක් ඇතුව සියලු කරුණු සලකා බලා මේ වැව හදන්න ගත්තා නම් මෙතන තියෙන සේරම අඩුපාඩු කාටත් පෙනෙන නිසයි මේක පුලුවන් තරම් ඉක්මනට හදල ඉවර කරන්න හදන්නෙ'

මේ ඉදිරිපත් කරන ලද කරුණු වලට කිසිවෙක් විරුද්ද මත ප්‍රකාශ කළේ නැත.

මේ සියලු විරෝධතා පන්සල් තුළට පමණක් සීමාවී ඇති තෙක් රජ ඒ ගැන කලබල වූයේ නැත. ඔහුගේ ඔත්තුකරුවන් මේ ව්‍යාපාරය තුලට ඇතුලුවී සිටි නිසා විරෝධතාව වැඩිවන්නට ගියහොත් එය කඩාකප්පල් කිරීමට ඔත්තු කරුවන්ට උපදෙස් දි තිබිණ. මහඇමතිගේත් හමුදා ප්‍රධානියාගේත් වාර්තා ඔහුට නොකඩවා ලැබුණේය. ඉදිකිරීම් කටයුතු කිසිම බාධාවකින් තොරව කෙරීගන යන බවත්, නියමිත දිනට පෙර අවසාන වන බවත්, කිසිවෙකුට එය නැවැත්විය නොහැකි බවත් මේ දෙදෙනාම අවධාරනය කළහ.

විතා ටද මේ බව වැටෙහෙන්නට වීය. වැව් බැම්මේ ඉදිකිරීම් අවසාන අදියරට පැමිණ ඇති නිසා එය වළක්වා ලීමට නොහැකි බව ඇය තේරුම් ගත්තාය. තිසගුත හිමියන් මේ බව දැන සිටින්නට ඇති බවත්, එසේ නම්

sinhalaebooks.com



උන්වහන්සේ ජීවිතය පූජා කළේ ඇයිද කියාත් ඇගේ සිත තුළ ප්‍රශ්නයක් ඇති විය. ඇගේ සොහොයුරා වැරදි තීරණයක් ගත්තේයැයි සිතන්නට ඇය අකමැති විය. බුදු දහමට අනුව අවිහිංසාවාදීව ජීවත්වූ භික්ෂුවකට රජුගේ සහ රාජ නිලධාරින්ගේ මානසික තත්ත්වය වත් ඔවුන්ගේ සට කපට කම් වත් වටහා ගැනීමට නොහැකිවීම මෙයට හේතුවක් විය හැකි යැයි ඇය සිතුවාය.

එහෙත් මේ සටන නවත්වන්නට ඇය අකමැති වූවාය. ඇගේ සොහොයුරා වෙනුවෙන් පමණක් නොව, මේ ගම්වැසියන් සඳහාත් ඔවුන්ගේ අනාගත දරු පරම්පරාවන් වෙනුවෙනුත් සටන දිගටම ගෙනයා යුතුයැයි ඇය තීරණය කළාය.

## 12.

රජු බලාපොරොත්තු වූ ලෙසටත්, රාජ නිලධාරින් සැලසුම් කළ ලෙසටත් නියමිත දිනය වන විට වැව් බැම්මේ ඉදිකිරීම් කටයුතු අවසාන කළ හැකි විය. වැසි සමය ඇරඹෙන්නට පෙර වැඩ අවසාන කළ හැකි වීම නිලධාරින්ගේ සතුටට හේතු විය.

රජුගේ උපන් දිනය දා රටේ ඉතිහාසයේ කිසි දිනක නොවූ අන්දමෙ රාජ්‍ය උත්සවයක් වැව් බැම්ම අසල පැවැත්වීමට සැලසුම් යොදා තිබුණේය. මුලු රට පුරාම ඒ පිළිබඳව ප්‍රචාරක වැඩ පිළිවෙලක් දියත් කරන ලදී.

පුරාකවාපිය ඉදිකිරීම සටහන් කළ ටැම් ලිපි ප්‍රධාන නගර සියල්ලේම පිහිටවන ලද අතර, සෑම ගමකම, පන්සලකම ඒ වැවේ චිත්‍රයක් රජුගේ චිත්‍රයත් රැගත් කොඩි එල්ලන ලදී.

වැඩ අවසාන වීම ගැන සතුටු නොවූයේ චිතා පමණක් නොවේ. රජු ද අවසන් වූ වැව බැලීමට පැමිණි මොහොතේ මහත් සේ කෝපයට පත් විය.

'වැවේ මීට වඩා ජලය තිබිය යුතුයි. මීට වඩා ජලය රැස් වෙච්ච කුඩා වැව් මා දැක තිබෙණවා' රජ මහ ඇමතියා දෙස බලා කෑ ගැසුවේය.

'මේ ගඟෙන් එකතු වන සම්පූරණ ජල ප්‍රමාණය තමා මේ ස්වාමීන් වහන්ස. දැන් වැව් බැම්මෙන් පහළ ගඟ මුලුමණින්ම හිඳී ගිහින්. දැන් පහල ජීවත්වන මිනිසුන්ට වතුර පොදක් වත් නැහැ'

'වැවේ මීට වඩා ජලය තියෙන්න ඕන' රජු නැවත පැවසුවේ ගඟ පහල මිනිසුන්ගේ ප්‍රශ්නය නොඇසුනා සේය. 'මේ ගැන වෙන මොනවාද කළ හැක්කේ? කෝ අර පිටරටින් ගෙනා මිනිහ?'

sinhalaebooks.com



ඌවි ඉදිරියට පැමිණියේය.

'මා ඒ ගැන හැම අතින්ම සොයා බැලුවා ස්වාමීනි. විසඳුමක් හැටියට ඇත්තේ ගඟේ මීට ඉහලින් තනා ඇති බැම්ම කඩා දැමීමයි'

'ඉතින් ඇයි තවත් බලා ඉන්නෙ? වැව හැදුවෙ වතුර නැතුව වේලෙන්නද? වැව හැදුවෙ වතුර පිරිලා තියෙන්න. ඒක මැද්දෙ හරක් ලගින්න නෙවෙයි' රජුගේ කෝපය තවත් වැඩි විය. 'වහාම ඒ බැම්ම කඩා දැමිය යුතුයි'

'ඒ බැම්ම සාදා ඇත්තේ අවුරුදු සිය ගණනකට පෙරදියි ස්වාමීනි. අගනුවර අවට වැව් වලට ජලය සැපයෙන්නේ මේ බැම්ම නිසායි. බැම්ම කඩා දැමුවොත් අගනුවර අවට වැව් සිඳී යන්න පුලුවන්' මහඇමති කීවේය.

'මට කමක් නැහැ අනිත් වැව් වලට ජලය ලැබෙනවද නැද්ද කියන එක. මට අවශ්‍ය මේ වැව පිරිල තියෙනවා දකින්නයි. මේ තමා අපේ රටේ ඇති විශාලතම වැව. එය පිරී තිබිය යුතුයි'

'වැව පිරෙන්නට අවශ්‍යයි වැව විවෘත කිරීමේ උත්සවයට කළින්. වතුර නැති වැවක් විවෘත කරන්න පුලුවන්ද'

රජු මෙසේ කෝප වී සිටියදී මේ ගැන තවදුරටත් කතා කිරීමට කිසිවෙක් ඉදිරිපත් වූයේ නැත. රජුගේ ප්‍රශංසා බලාපොරොත්තුවෙන් සිටි අය මේ මොහොතේ රජු මග ඇර සිටින්නට තැත් කළේ තවත් රාජ උදහසට ලක් නොවී සිටීමටය.

ඉහල වැව් බැම්ම කඩා දැමීමෙන් අගනුවර ජිවත් වන දසලක්ෂයක් පමණ ජනතාවට වතුර නැති වන බව රජතුමාට සිහිපත් කිරීමට ඒ නිසා කිසිවෙක් ඉදිරිපත් වූයේ නැත.

ඌවි වහාම තබා මගින් සේවක පිරිසක් රැස් කරගෙන, හමුදා ආරක්ෂාව යටතේ ගඟ ඉහල ඉදිකර තිබූ වේල්ල වෙත ගමන් කළේය. මේ කාර්යය මොහොතක් හෝ පමා කිරීමට ඔහු අකමැති වූයේ මේ ගැන මිනිසුන්ට ඉඟියක් හෝ දැනුනොත් එය වලක්වා ගැනීමට සෙනග රැස් විය හැකි නිසාය. මේ වේල්ල මගින් ගඟේ ජලය කොටසක් ඇළ මාර්ගයක් දිගේ නගරයේ වැව් පොෂණය කිරීම සඳහා හරවා යැවීම සිදුවිය. වේල්ල බිඳ දැමීමෙන් නගරයේ වැව් වලට ජලය ලැබෙන එකම මාර්ගය නැතිව යන්නේය.

ඌවි ඒ ගැන කල්පනා කළේ නැත. ඔහු බාරගත් රාජකාරිය ඔහු පොරොන්දු වූ ලෙසම අවසාන කිරීමට ඔහුට හැකි විය. ඔහුගේ වැටුප් සියල්ල සමග විශාල සන්තෝසම් මුදලකුත් ඔහුට දැනටමත් ලැබී තිබුණේය. ආපසු සිය රට යාමටත් මහඇමති සියලු කටයුතු යෙදා ඇති බව ඔහු දැන සිටියේය. උත්සවයට සහභාගි වීමට ඔහුට උනන්දුවක් නොවිය.

sinhalaebooks.com



මේ අවසාන රාජකාරිය ඔහු විසින් ඉටු කළ යුත්තේ ඔහු විසින් තනා අවසාන කළ වැව ජලයෙන් පිරී තිබෙණු දැකීමට තිබුණු ආශාවය.

වේල්ලක් කඩා බිඳ දැමීම වේල්ලක් ඉදිකිරීමට වඩා කෙතරම් පහසු දැයි මිනිසුන්ට වැටහුණේ එතැනදීය. මෙයින් වන පල විපාක මේ සේවක පිරිසට එතරම් වැටහීමක් ඒ වන විටත් ඔවුන්ට තිබුණේ නැත. තිබුණත් හමුදා භටයින් ඉදිරියේ ඒ කටයුතු ප්‍රතික්ෂේප කිරීමට ඔවුන්ට ශක්තියක් තිබුණේ නැත.

ඌවට් වැව් බැඳීමට පමණක් නොව වැව් බැමි බිඳීමටත් එකසේ දක්ෂයකු බව පෙන්වමින් සේවකයින් හට ඔහු උපදෙස් දුන්නේය. බැම්ම බිඳිය යුතු තැන් ඔහු ඉතා සුලු වේලාවකින් සටහන් කර ඒ සිථාන වල ගල් සහ පස් බුරුල් කරනා අන්දමත් කියා දුන්නේය.

ඉන් පසු ඔහු ගං ඉවුරට වී කුඩා දරුවෙකු මෙන් සිනාසෙමින් වේල්ල කොටසින් කොටස බිඳී යන සැටි බලා සිටියේය. පස් සේදී යමින් මහා ගල් කුලු කිහිපයක් සහ ගල් කනු පමණක් අවසානයේ ඉතිරි විය.

වේල්ල බිඳීම නිසා එක් වහම මහාවිපියේ වත් අගනුවර වැව් වලත් දැකිය යුතු තරම් වෙනසක් සිදු නොවීම නිසා අගනුවර වැසියන් හට මේ බව දැන ගන්නට ලැබුණේ නැත.

ඌවට් මේ බවත් දැනසිටි අතර ඔහුට කිසිම කරදරයක් හිරිහැරයක් නැතිව ඔහු විසින් උපයා ගත් වස්තුවත් රැගෙන රටින් පිටවී යන්නට හැකිවිය.

මේ අතර ටබා කඳවුරු සහ බඩු බාහිරාදිය ඉවත් කිරීමේ කටයුතු වල නියැලුණේ සිදුවන්නට යන දෙබිඩි විනාශය ගැන සිත යොමු කරන්නේ නැතිවය.

ඔහු අවසාන වරටත් තිසගුත හිමියන් පනපිටින්ම වැළලී ගිය ස්ථානය දෙස බලා දිග සුසුමක් හෙළුවේ ඒ දරුණු අපරාධයට ඔහුද තරමක් දුරට හෝ වගකිව යුතු බව සිතමින්ය. ඔහු එන්නට පෙර මේ අවාසනාවන්ත සිද්ධිය වූවානම් එයට මුහුණ දෙන්නට වන්නේ පූනාටය. එසේ වූවා නම් ටබාට ඒ පාපකර්මයෙන් ගැළවෙන්නට ඉඩ තිබුණ බව ඔහුට සිහිවිය. ඒ සමගම වාගේ සිතට ආවේ, එවැනි ලාබාල තරුණියකට එවැන්නක් විඳ දරා ගන්නට නොහැකි වනු ඇති බව නිසා, ඇය එයින් මිදීම ගැන ඇය වෙනුවෙන් ඔහුගේ සිතට සතුටක් ඇති විය.

තිසගුත හිමියන් උපවාසයෙන් මුදවා ගැනීමට ආයාචනා කිරීමට මහායාල පන්සලට ගිය අන්දම ඔහුට සිහිවිය. ඒ යන විට පන්සලේ සිටියේ එක් සාමනේර භික්ෂුවක් පමණය. සෙසු භික්ෂූන් වහන්සේලා එහා ගමේ රැසිවීමකට සහභාගිවන බව අසා ඔහු එහි ගියේය. එතැන භික්ෂූන් සිය නමකට වඩා රැස්වී සිටියහ.

sinhalaebooks.com



'ඔබ පැමිණි එක හොඳයි' නායක ස්වාමීන් වහන්සේ පැවසීය. 'අපේ තිසගුත ස්වාමීන්වහන්සේගෙ ජීවිතේ දැන් තියෙන්නෙ ඔබ අතේ'

'මට මේ ගැන කිසිම දෙයක් කරන්න බලතල නැහැ හාමුදුරුවනේ. සියලු තීරණ ගන්නෙ රජ වාසලෙන්. ඒ තීරණ ක්‍රියාත්මක කරන්න යුද හමුදාව ඉන්නව'

'ඔබ කළ යුත්තේ නිවැරදි දේ මිසක ඔබට ලැබෙණ අණ අනුව නෙවෙයි'

'අප කවුරුත් රාජ නීතියට යටත් වෙනවා'

'ඒත් අපට කල්පනා කරන්නට මොළයක් ලැබී තිබෙනවා. හොඳ නරක තෝරා බේරා ගන්න උගත් කම තියෙනවා'

'මගේ බිරිඳත් දරුවනුත් ඉන්නෙ අගනුවර. ඒ අයගෙ ආරක්ෂාව ගැනත් මට සිතන්න සිදුවී තිබෙනවා හාමුදුරුවනේ'

'මේ ගමේ කාටත් දරුවන් ඉන්නව'

'මං ඒ හැම දෙයක්ම දන්නවා. මට පුලුවන් හැම විදිහකටම මේ ප්‍රශ්නය විසඳ න්නත් උත්සාහ කරනවා. ඒත් අපේ හාමුදුරුවන් මේ උපවාසය අත්හරින්න වෙනවා. රජතුමා උදහස් උනොත් මොන විනාසයක් වෙයිද කියා වත් සිතාගන්න බැහැ'

'උන්වහන්සේ විශ්වාසකරනව උපවාසය හැරෙන්නට මේ වැව නවත්වන්න ක්‍රමයක් නැහැ කියල. අපට ඒ තීරණයට ගරු කරන්න වෙනවා'

'ඒත් උන් වහන්සේට කිසි අනතුරක් සිදු උනොත් ඒක වලක්වන්න කාටවත් බැරි වෙනව'

'එහෙම අනතුරක් වෙන්න බැහැනේ. උන්වහන්සේ ගඟ අයිනෙ වැඩඉඳගෙන භාවනා කරනවා. කාටවත් කරදරයක් කරන්නෙ නැහැ නෙ. ඒ නිසා කවුරුවත් උන්වහන්සේට කිසිම කරදරයක් කරන්න බැහැ'

ටබා ඒ අවස්ථාවේ දුටුවේ රැස්ව සිටි ගම්වාසීන්ගේ මුහුණේ රැඳී තිබූ කෝපයයි. තරුණ භික්ෂූන්වහන්සේලාගේ මුහුණේ රැඳී තිබූ කලකිරීමයි. නායක හිමිවරුන්ගේ මුහුණේ කිසිම හැඟීමක් පෙනෙන්ට තිබුණේ නැත.

ඔහු වැඳ අවසර ගෙන පන්සල් භූමියෙන් පිටතට ගියේය.

එදින රාත්‍රී මහඇමති වෙත යැවීමට ඇති පණිවිඩය ටබාට මහත් වෙහෙසකර විය. ඒ පනිවිඩය ලද සැනින් රජු තුළ ඇතිවන කෝපය ඔහුට සිතා ගත හැකි විය.

sinhalaebooks.com



කලින් සිටි වාරිතක්ෂණවේදියාට අත්වූ ඉරනම කුමක් දැයි නිශ්චිත වශයෙන් ටබා දැන නොසිටියත් කිසියම් විපතක් සිදුවන්නට ඇති බව ඔහු දැන සිටියේය. ටබා හට ඔහුගේ අඹු දරුවන් ගැන සිතිය යුතු විය. ඔහුගේ පුතාගේ වයස අවුරුදු තුනක් විය. බිරිඳ දෙවෙනි දරුවා බලාපොරොත්තුවෙන් සිටියාය. ටබාට තමා මහා බියගුල්ලෙකැයි සිතුනත්, සත්‍යයට මුහුණ දීමට ශක්තියක් නැතැයි සිතුනත්, වෙනත් විකල්පයක් ද ඔහුට සිතාගත නොහැකි විය.

ඔහු වැඩබිමට පැමිනි පසුය ඔහුට දැන ගන්නට ලැබුනේ ඔහුට පෙර මෙහි වැඩකටයුතු කලේ මහඇමතිගේ දියනිය බව. මුලදී ඔහුට සිතුනේ ගැහැනියක විසින්, ලාබාල කෙල්ලක විසින් කරනා ලද වැඩ කොටසක් පැවරීමෙන් මහඇමති ඔහුට මදි කමක් කළ බවයි. එහෙත් ටික දවසකින් ඔහු සිත තුළ පූනා කෙරෙහි ගෞරවයක් ඇති වූයේ ඇය විසින් කර ඇති භාරදූර වැඩ කොටස වටහා ගැනීමෙන් පසුවය. ඇය කෙරෙහි ඇති ගෞරවය තවත් වැඩිවූයේ ඇය ව්‍යාපෘතියෙන් ඉවත් වන්නට හේතුව අනුමාන කරගැනීමට සමත් වීමත් සමගය. පූනාට ඔහුට වඩා ආත්ම ශක්තියක් තිබෙන්නට ඇති බව ඔහු සිතුවේය.

ඔහුට භික්ෂුවගේ ජීවිතය ආරක්ෂා කරගැනීමට නොහැකි විය.

ඔහු මහාවාපිය නිමකිරීමට හවුල් කරුවෙකු විය. මේ ලස්සන පරිසරයත්, සරුසාර පොළාවත්, ගැමියන්ගේ ජීවිතත් නැතිකිරීමට ඔහුද හවුල් කරුවෙකු විය. ඔහුට ජීවත්වන තාක් කල් මේ බර උසාලාගෙන සිටීමට සිදුවනු ඇත.

කඳවුරු අකුලාගෙන සියලු දෙනාම ඉවත්ව ගිය පසු චිතා වැව් බැම්ම උඩට පැමිණියාය. ව්‍යාපෘතියේ වැඩ අවසාන වී ඇත. ඇගේ සටනත් අවසාන වී ඇත. තිසගුත හාමුදුරුවන් පරාජය විය. උන්වහන්සේගේ වටිනා ජීවිතය අකාලයේ විනාශ විය. එසේ කැප කළ ජීවිතය වෙනුවෙන් කිසිවක් කරන්නට චිතා අසමත් වූවාය.

ගැමියන් තවමත් ගම් වල රැඳී සිටියත් ජල මට්ටම නගිත්ම ඔවුන්ට ගම හැරදා යන්නට සිදුවනු ඇත. වැව් කණ්ඩිය මතට ගම් කිහිපයක් පෙනේනට තිබුනේය. ගෙවල් අසල සෙල්ලම් කරන දරුවන්ද, අවට සිටි ගවයින් සහ මී හරකුන්ද ඇයට පෙනින. ඇය වැව් බැම්මෙන් ඉහල ගඟ දෙස බැලුවාය. තවමත් නිසලව ගලා යන ගඟ සෙමෙන් ඉදිමෙන බව ඇය දුටුවාය. එය ටිකින් ටික කුඹුරු වසා ගෙන පැතිරෙමින් තිබුණේය. තව ටික දිනකින් ජල කඳ ගමට ඇතුලුවී ගෙවල් සහ වතුපිටි යට කර ගිල ගන්නවා ඇත. ඊට පෙර ගම්වැසියන්ට ඔවුන්ගේ ජීවිත කාලයක් තිස්සේ, සමහර විට පරම්පරා ගණනාවක් තිස්සේ, එක්රැස් කර ගත් දේපල වස්තුව පොදිබැඳගෙන නන්නාඳුනනා පළාතක පදිංචියට යාමට සිදුවනවා ඇත. එහි රජයෙන් ලැබෙන කුඩා බිම් කඩක අතු පැලක් අටවා ගෙන යළිත් මුල සිටම සිය ජීවිත ගොඩනගා ගැනීමට සිදුවනවා ඇත.

sinhalaebooks.com



විරෝධතා ව්‍යාපාරයට හවුල් නොවූ ගැමියන්ට හොඳම ඉඩම් කැබලි ලැබුණ අතර විරෝධතාවයට මූලික වූ අයට ලැබුණේ ඉතාම නිසරුවූත් පහසුවෙන් යා නොහැකි වූත් බිම්ය. තිසගුත හිමියන්ගේ පවුලේ ඉතිරිව සිටියේ චිතා පමණය. ඇය ඉඩම් කොටසක් ඉල්ලුම් කළේ නැත.

ඇය තිසගුත හිමියන් මිහිදන් වූ තැනට ගමන් කළාය. එතැන බෝ පැලයක් හෝ නුග පැලයක් සිටුවිය යුතු යැයි ඇය සිතුවාය. මෙරට ජනතාව උන්වහන්සේ කිසිදාක අමතක නොකළ යුතුවිය. උන් වහන්සේ ජීවිතය කැප කළේ ඇයි ද යන්නත් අමතක නොකළ යුතුය.

ඇගේ ජීවිතයේ අරමුන කුමක් විය යුතුදැයි වැව් කණ්ඩිය මත වාඩිවී ඇය කල්පනා කළාය. අලුත් ගම්මානයකට යන්නට ඇය තුළ කැමැත්තක් නොවීය. ඇගේ පැරණි නිවසේ හැකිතාක් කල් නවතින්නට ඇය සිතුවාය.

ආපසු ගමට යන්නට පෙර ඇය ගඟ ඉහළට ගමන් කළේ පැරණි වේල්ල තිබූ ස්ථානයටය. අගනුවර වැව් කිහිපයට ජලය ගෙන ගිය ඇළ මාර්ගය හිඳී ගොස් තිබුණේය. ගඟේ ගලාගෙන ආ ජලය සියල්ල අලුත් වේල්ල තුළ එකතු වෙමින් තිබුණේය. නොදැනුවත්වම චිතා වියළී ගිය ඇළේ කන්ඩිය දිගේ නගරය දෙසට පා නැගුවාය.

වාරිතාක්ෂණවේදියකුව සිටි දන්ත හිමියන් ඇයට මේ ඇළ මාර්ගය ගැන කියන ලද විස්තර චිතාට සිහිවිය. එය සැලසුම් කිරීමටත් ඉදිකිරීමට වැය කිරීමට සිදුවූ කාලය සහ ශ්‍රමය උන් වහන්සේ ඇයට විස්තර කරන ලදී. මිනුම් කරුවන් තීරණය කර තිබුණේ මේ ගඟේ ජලය කිසිම ලෙසකින් නගරය වෙත ගෙනයාමට නොහැකි බවයි. ගඟත් නුවරත් අතර භූමිය එතරම් පැතලි වූ තැනිතලාවක් බවයි. ජලය ගලා ගියේ උස් බිමක සිට පහත් බිමකටය. ඒ ස්වභාවධර්මයේ සැලැස්ම විය. එහෙත් මේ තාක්ෂණවේදියා උත්සාහය අත්හළේ නැත. ඔහු දන්ත හිමියන්ගේ මී මුත්තාය. තවත් වරක් මිනුම් කරුවන් සමග ඔහුද එකතු වී මැන බැලීමේදී අගනුවර ගඟට වඩා ඉතා සුලු වශයෙන් පහත මට්ටමක පිහිටා ඇති බව ඔහුට වැටහුණේය. ඒ බැවුම ගැන සෑහීමකට පත් වී ඔහු ඇළ මාර්ගය තැනීමේ අභියෝගය බාර ගත්තේය. යළි යළිත් බිම මට්ටම මණිමින් ඔහු ඇළේ ගමන් මාර්ගය සළකුණු කර බෑවුම තීරණය කළේය. ඇළ සෑදීමේදී ඔහු අඩියෙන් අඩිය එය පරීක්ෂා කළේ සුලු වෙනස් වීමක් පවා ඔහුගේ උත්සාහය අසාර්ථක කිරීමට හේතු විය හැකි නිසාය. එසේ ඉදිකළ ඇළ මගින් මෙතෙක් කලක් අගනුවරට ජලය සපයන ලදී.

මේ වියළී ගිය ඇළ දිගේ ගමන් කරනා චිතාට එක් වරම සිතට ආවේ ඇගේ සටන අවසන් වී නැති බවයි. අගනුවර වැසියන්ගේ දෑස් පාදන්නට අවස්ථාව එළඹී තිබුණේය. ඔවුන්ට ජලය නැති වූ විට අගනුවර පන්සල් වල සුඛෝපභෝගී ජීවිත ගත කරනා භික්ෂූන් පවා අරගලයට එක්වනවා ඇතැයි ඇය සිතුවාය. තිසගුත හිමියන්ගේ මරණයට පත් කිරීම ගැන වත් කම්පා නොවූ මේ භික්ෂූන් ඔවුන්ට කරදරයක් වූ විට නිහඬ නොවනවා ඇත.

sinhalaebooks.com



තනිවම නගර වැසියන් හමුවී මේ ප්‍රශ්නය කතා කිරීමට චිතා බිය නොවීය. ආපසු ගමට ගොස් වඩා ක්‍රියාකාරීවූ භික්ෂූන් වහන්සේලා කිහිප නමක් සහ තරුණයින් පිරිසක් කැටුව ආ යුතු යැයි ඇයට සිතට ආවේ නැත.

චිතා මුලින්ම ගියේ වෙළඳ පොළටයි. එතැන මඳ වෙලාවක් වට පිට බලා වඩාත් ප බල වෙළඳුන් හඳුනා ගෙන ඔවුන් අතරින් කරුණාවන්ත පෙනුමක් ඇති වැඩිහිටි වෙළෙන්දෙක් වෙත ගියාය.

'මං පැමිණියේ අලුත් වැව නිසා ජලයෙන් යටවන ගමක සිටයි'. ඇය පැවසූ විට වෙළෙන්දා ඇය දෙස බැලුවේ මඳ සැකයකින්, ඇය පැමිණ ඇත්තේ ආධාරයක් ඉල්ලා ගැනීමට යැයි සිතාය.

'මං ආවෙ අපේ ගම ගැන නෙවෙයි. ඔබලාට සිදුවෙන්න යන අනතුරක් ගැන කියන්න. මේ නගරයටම අනතුරක්'

'මොන විදිහෙ අනතුරක්ද?' මෙවර ඔහු චිතා දෙස වඩා හොඳින් බැලුවේය. මුලදී ඔහු දුටුවේ රූමත්, එහෙත් තරමක් පැරණි වූ ඇඳුමක් ඇඳ සිටි ගැමි කෙල්ලකි. මෙවර ඔහු ඇගේ දෑස තුළ දුටුවේ නිර්භීති වූත් බුද්ධිමත් වූත් ලක්ෂණය.

'මහාවාපියට ගලා එන වතුර මදි නිසා ගඟ ඉහල වේල්ල කඩා දැමුවා. දැන් ගඟේ වතුර සේරම ගලා යන්නෙ මහාවාපියට. මෙ නගරයේ වැව් වලට මින් පස්සෙ වතුර නැති වෙනවා. දැනටමත් ඇල හිඳිල ගිහින්' ඔහුගේ මුහුණ දෙස සෘජුවම බලාගෙන ඇය පැවසුවේ ඇගේ කීම නොතකා ඉන්නට අභියෝග කරන්නා සේය. මුලු නුවරම වැසියන් මහාවාපිය පිලිබඳ ප්‍රශ්නයේදී හැසිරුනේ එලෙසය. එවිට නුවර වැසියෝ පරිසරය සහ දුප්පත් ගම්වැසියන් ගැන නොතැකුවෝය. එවිට ඔවුන්ට මුදල් ඉපැයීමත් රජු සමග හොඳින් සිටීමත් වඩා වැදගත් විය.

වෙළෙන්දා චිතාද කැටුව ඒ අසල වූ තවත් වෙළඳ සලකට ඇතුලු විය. එහි සිටියේත් ඔහුගේම වයසේ වෙළෙන්දෙකි. චිතා ගෙන ආ ආරංචිය ඔහුට පවසා තවත් වෙළඳුන් හට එතැනට එන්නට පණිවිඩ යවන ලදී. කිහිප දෙනෙක් ර ස්වූ පසු චිතා යළිත් සිදුවී ඇති දේ පැහැදිළි කළාය. තව තවත් වෙළඳුන් එතැනට රැස් වන්නට වූ අතර මේ පුවත මුලු වෙළඳ මධ්‍යස්ථානය පුරාත් ඉන් පසු අගනුවර සෑම අස්සක් මුල්ලකටත් පැතිරෙන්නට විය. එසේ කටකින් කට යන හැම විටකම සිද්ධිය පිලිබඳ යමක් අලුතින් එකතු වීමක්ද සිදුවිය.

මාහාවාපියට විරුද්ධ සටන පරාජය වුවත්, අගනුවරට ජලය සපයන ඇළට යළිත් දිය පහර හරවන්නට හැකි වුවොත් වැවට යට වන්නට ගිය මිටියාවතින් කොටසක් හෝ බේරාගත හැකි යැයි චිතා ගේ සිත තුළ උද්යෝගයක් ඇති විය. තිසගුත හිමියන් ජීවතුන් අතර සිටියානම් මේ අවස්ථාවේ ඔවුන්ගේ ගම් වැසියන්ද මෙතැනට රැස් කර ගන්නට තිබුණේ යැයි ඇයට සිතුනේය. ඒ සමගම ඇගේ මුවට මඳ සිනහවක් මතුවී ආවේය.

sinhalaebooks.com



සිඳී ගිය ඇළ සම්බන්ධ වූ අගනුවර ප්‍රධාන වැව අසලට සෙනග රැස්වන බව දුටු විතා ද ඒ අසලට ගමන් කළාය. වියළී ඇළ මාර්ගය දකින නුවර වැසියන්ට තවත් මේ ගැන කිසිවක් පැවසීම අවශ්‍ය වූයේ නැත. පුවත අසන්නට ලැබුණ සියලු දෙනාම මේ පිට්ටනියට රැස් වෙන බව විතා දුටුවාය. අගනුවර අවට ගම් වල වැසියන්ද මෙතැනට එක්වන්නට වූයේ මේ වැව් සිඳී ගියහොත් ඔවුන්ගේද ජීවිත වලට එයින් මහත් බලපෑමක් වන නිසාය. මෙතරම් විශාල සෙනගක් එක් තැනක රැස්වී සිටිනවා ඇය මින් පෙර කිසි දිනක දැක තිබුනේ නැත. ඔවුන්ට එදා මෙවැනි සෙනගක් රැස් කර ගැනීමට හැකිවූයේ නම් තිසගුත හිමියන්ට ජීවිතය පරිත්‍යාග නොකරම ඔවුන්ගේ සටන දිනා ගන්නට තිබුණා නොවේදැයි ආ සිතිවිල්ලත් සමග සිනහව අතරින් ඇගේ දෙනෙතට කඳුලු ගලා ආවේය.

විතාට මුළින්ම හමුවූ වෙළෙන්දා ඇය සෙනග ඉදිරියට කැඳවූ අතර, මින් පෙර අරගලයේදී ඇය දැන හඳුනා ගෙන සිටි කිහිප දෙනෙක් ඇයට ඉදිරියට යන්නට උනන්දු කළෝය.

සෙනග ඇමතීමට විතාට ඇළ කන්ද මතට නගින්නට සිදුවිය. එතැන ඇය සමග ප්‍රධාන වෙළඳුන් කිහිප දෙනෙක්ද වැඩිහිටි භික්ෂූන් කිහිප නමක්ද සිටියහ. තරුණ ගැමි කෙල්ලකගේ කතාවක් අසා සිටීමට අවශ්‍ය දැයි සෙනග අතරින් මොහොතකට පැන නැගෙන බව ඇයට දැනුනේය. ඇය ක්‍රමයෙන් වැඩි වන සෙනග දෙස බැලුවාය. ඇය මෙවැනි විශාල පිරිසකට කිසිදාක මුහුණ දී තිබුණේ නැත. සෙනග වටා ආයුධ අමෝරා ගත් හමුදා භටයින් දුටු විට ඇය සිත තුළ චකිතය වැඩි විය.

විතා මොහොතකට දෑස් පියා ගත්තාය. එවිට ඇය ඉදිරියේ පෙනුනේ වැව් බැම්ම අසල නිසලව වාඩිවී සිටි තිසගුත හිමියන් ය. ඊළඟට ඇය දුටුවේ මහා ගල් කැබලි උන්වහන්සේගේ හිස මග පතිත වන අන්දමයි. අන්තිමේ උන් වහන්සේගේ ශරීරය වසාගත් ඒ මහා පස්ගොඩ මත සෙමෙන් තැන්පත් වන දූවිල්ලයි.

විතා ඇගේ කතාව ඇරඹුවාය. මාහාවාපිය ආරම්භ කළ දින සිට අද දක්වා සිදුවී ඇති දේ ඇය කෙටියෙන් විස්තර කළාය. ඔවුන්ගේ ගම් බිම්, ගෙවල් දොරවල්, වතුපිටි පමණක් නොව මුලු මිටියාවතේම සිදුවන විනාශය ගැනත් ඉන් ඉදිරියට විය හැකි කාලගුණ විපර්යාසයන් ගැනත් ඇය කතා කළාය. තිසගුත හිමියන් මරා දැමූ ආකාරයත් විස්තර කළාය.

'අපි බොහොම උත්සාහ කළා මේ රටේ ජනතාව දැනුවත් කරන්න මේ සිදුවෙන්න යන විනාශය ගැන. තිසගුත හාමුදුරුවන් අමානුෂික විදිහට මරා දැමුවේ ගම්වැසියන් සිය ගණනක් ඉදිරියේ උන්වහන්සේගේ ඇඟ මතට විශාල ගල් පෙරලලා, පනපිටින් මිහිදන් කරලා' ඇය පවසන විට සෙනග නිහඬවී ඇයට සවන් දුන්හ.

sinhalaebooks.com



'එදා මහාවාපි වැව් බැම්ම ඉදිකිරීම නවත්වාගන්න පුලුවන් උනා නම් අද මේ අගනුවරට ජල ප්‍රශ්නයක් ඇති වෙන්නෙ නැහැ. මේ ඇළ මාර්ගයට වතුර හරවන වේල්ල කඩා දමන්න අවශ්‍ය වෙන්නෙ නැහැ'

'අපි ආපහු වේල්ල බඳින්න ඕන' සෙනග අතරින් කෙනෙක් කෑ ගසා කීවේය. සෙසු පිරිසද ඒ වදන් වැලම කෑ ගසන්නට වූහ. ඒ හඬ අගනුවර පුරා දෝංකාර දෙන්නට විය.

'වේල්ල බඳිමු'.

'වේල්ල බඳිමු'.

තමන්ට වතුර නැතිවීම භික්ෂුවකගේ ජීවිතයට වඩා, ගම් කිහිපයක විනාශයට වඩා, පරිසරයට සිදුවන හානියට වඩා, මේ නුවර වැස්සන්ට වැදගත් බව චිත්‍රාට වැටහිණ. වේල්ල යළි ඉදිවෙනු ඇතැයි ඇයගේ සිතට ආ සතුට ඒ සිතිවිල්ලත් සමග යළිත් බොඳවී ගියේය.

රැස්වූ ජනතාව ගඟ වෙත යන්නට සැරසෙත්ම නුවර තුළින් තරුණයින් පිරිසක් එතැනට පැමිනෙන බව චිත්‍රා දුටුවාය. ඒ බව දුටු සෙනගද මොහොතකට නැවතී බලා සිටින්නට වූහ. එක්වරම කාටත් සිතුණේ රජුට පක්ෂපාතී දාමරිකයින් පිරිසක් මේ විරෝධතාව කඩාකප්පල් කිරීමට පැමිනෙතැයි කියාය. ඉදිරියෙන් පැමිනෙන්නේ රජුගේම පුතා බව සුලු මොහොතකින් හඳුනාගැනීමට නුවර වැසියන්ට හැකි විය. පිරිස මේ එන කණ්ඩායම සමග සටන් කිරීමට වුවද සැරසෙන බව වැව් කන්ද උඩ සිටි අයට පෙනී ගියේය.

එහෙත් රාජ පුත්‍රයා ඉක්මන් ගමනින් සෙනග දෙපසට කරමින් වැව් කන්ද මුදුනට නැංගේය. ඔහු චිත්‍රා අසලින්ම සිටගත් විට චිත්‍රා ඔහු දෙස හොඳින් බැලුවාය. ඔහුගේ ඇඳුම නගරයේ අනිත් තරුණයින්ගේ ඇඳුමට වඩා වෙනසක් නැති බව ඇය දුටුවාය. සුදු රෙදි කඩක් ඉනෙහි දවටා ගෙන දෙකකුල් අතරින් පිටුපසට ගෙන ගැටගසා ගැනීමෙන් ඉතා පහසුවෙන් ගමන් කළ හැකි සේ ඇඳුම සකස් වී තිබිණ. නුවර සියලු වැසියන්ගේ මෙන් ඔහුගේද උඩු කය නිරාවරණ වූ අතර වෙනසක් ලෙස ඇය දුටුවේ ගෙළ බැඳි මාලය වඩා අගනා එකක් විය යුතු බවය. අන් තරුණයින්ට වඩා උස මහත සිරුරේ මස් ගොබ දහඩිය බිඳු වලින් වැසී තිබුණේය.

රැස්ව සිටි පිරිස නිහඬව බලා සිටියහ. රාජපුත්‍රයා කුමක් කියන්නේ දැයි ඔවුහු බලා සිටියහ. පියරජුගේ ක්‍රියාවන් යුක්ති සාධනය කිරීම සඳහා ඔහු කවර නම් හේතු දක්වන්නට යන්නේදැයි චිත්‍රා බලා සිටියාය. ඔහු ගෙන එන තර්ක වලට පිළිතුරු දෙන්නට ඇය සිතින් සැරසුනාය.

'මා අද මෙතෙන්ට ආවේ ඔබ සැමගේම කෙනෙක් විදිහටයි. රජ වාසලේ ඔටුන්න හිමි රාජ පුත්‍රයා හැටියට නොවෙයි' ඔහු මඳකට නැවතුණේය. ඔටුන්න හිමි ඔහුට

sinhalaebooks.com



නොවන බව අගනුවර වැසියන් දැන සිටි නිසා ඔහුගේ ප්‍රකාශයට කිසියම් ප තිචාරයක් ලැබේදැයි කියා විය හැකිය.

'ප්‍රමාද වෙලා හරි මට තේරුම් ගියා මේ වැව බැඳපු එක වැරදියි කියල. මේ වේල්ල බිඳ දමපු එක වැරදියි කියල. අපේ අගනගරයට ජලය ලැබෙන්න තියෙන එකම මාර්ගය නැති කර දැමීම වැරදියි කියල' ඔහු මෙසේ කතාව ඇරඹූ විට සියලු දෙනා තමන්ගේ ඇස් කන් අදහා ගත නොහැකි ලෙස ඔහු දෙස බලා සිටියහ.

'අපේ රටේ මේ විනාශය දැන් දුර ගියා ඇති. අපේ රටවැසියන් මෙච්චර දවස් මැරුණා ඇති. තවත් කවුරුවත් යුද්ධයක් නිසාවත්, පිපාසයෙන් හරි හාමතෙන් හරි මැරෙන්න ඉඩ තියන්න බැහැ. අපේ රට පුරා මැරුණ මිනිසුන් වගේ කිහිප ගුනයක් ගැහැණුන් සහ දරුවන් අනාථ වෙලා ඉන්නව. හාමතේ මැරෙනව. ලෙඩ වෙලා, අත පය, ඇස්, කන් අහිමි වෙලා දුක් විඳිනව' ඔහු යළිත් මොහෙතකට නැවතී ඔහු ඉදිරියේ සිටි ජනතාව දෙස බැලීය. 'යුද්ධ ඉවර උනාම අපි හිතුව දැන් ජනතාව දුක් විඳපු කාලය ඉවරයි කියල. රටේ අභාග්‍යසම්පන්න කාලය ඉවරයි කියල. රට වැසියන්ට නිදහසේ යහතින් සතුටින් ජීවත් වෙන්න පුලුවන් වෙයි කියල.

'බලහත්කාරයෙන් යුද සේවයට බඳවාගෙන අපේම රට වැසියන් මරා දමන්නට යොදා ගත් අපේ තරුණ පරපුර බලා හිටියා යුද්ධය ඉවර උනාම ඒ අයගෙ ගම රට වලට යන්න. අම්මල තාත්තල බලන්න. තමන්ගෙ බිරින්දෑත් අත දරුවන් බලන්න. ඒත් ඒ අයට සිද්ධ උනේ මොකක්ද?' රාජ පුත්‍රයා අවට සිටි හමුදා භටයින් දෙස බැලුවේය.

'ඒ අයට උනේ කුලියට වැඩ කරන කම්කරුවො වගේ වැලි ගඩොල් අදින්න. පස් කපන්න. මල් පැල හිටුවන්න. අර තරම් හොඳ මාලිගාවක් තියෙද්දි තවත් එකක් හදන්න බැල මෙහෙවර කරන්න. ඒ භටයින්ගෙ පුංචි ගෙදරක වහලට අලුත් පොල් අතු ටිකක් හෙවිලි කර ගන්න බැරුව පොඩි දරුවො තෙමෙද්දි මෙහේ මාලිගා හදන්න.

'ඒ වහල් වැඩ ඉවර උනාම ගම රට යන්න බලා ගෙන ඉන්න වෙලාවෙ තමයි තව වැවක් හදන්න හදිසි උනේ. තමන්ගෙ ගෙදර දරුවන්ට වතුර ටිකක් බොන්න ළිඳක් කපා දෙන්න බැරුව මෙහේ කිසිම අවශ්‍යතාවයක් නැති වැවක් හදන්න'

පිරිස රාජ පුත්‍රයාගේ කතාව අසා සිටියහ. ඉන්පසු ඔහු පහුගිය කාලය තුළ රට තුල පැවති භීෂණය ගැන සිහි පත් කළේය. විනාශය යළි යළිත් සිහිපත් කළේය. ජලය කපා හැරීම නිසා අගනුවරට සිදුවීමට යන විනාශය ගැන සිහිපත් කළේය. දරුවන් පිපාසයෙන් හඬනා හැටි, ගෘහිනියන් වළන් පිඟන් සෝදා ගත නොහැකිව, රෙදි සෝදා ගත නොහැකිව, මිනිසුන් තමන්ගේ එදිනෙදා වැඩ අවසන් කර දහඩිය කුණු සෝදා ගැනීමට නොහැකිව සිටිනා අන්දම ඔහු ඔවුන්ගේ සිත් තුල ඇන්දේය. වතුර නැතිව මිය යන හරකුන් සහ අනිත් සතුන් ද, ඒ මළකුණු වලට එකතු වන

sinhalaebooks.com



කපුටන් සහ බල්ලන්ද ගැන ඔහු පෙන්වා දුන්නේය. ඉන් පසු මහා දුර්භික්ෂයක් ඇති වූ කලක ලෙසින් ලෙඩ රෝග පැතිර යන බවත් පෙන්වා දුන්නේය.

'මේ අද වෙලා තියෙන දෙයින් අපට හිතාගන්න පුලුවන් ඉදිරියටත් වෙන්න යන්නෙ මොනවද කියල. අද ඉඳල මේ වැවට වතුර ලැබෙන්නෙ නැහැ. ටික දවසකින් මේ වැව් හිඳිල යනව'

'අපි වේල්ල බඳිමු', යළිත් පිරිස කෑ ගසන්නට වූහ.

රාජ පුත්‍රයා දෑත් ඔසවා පිරිස නිහඬ කරවා ගත්තේය.

'මේ වේල්ල ආයිත් බඳින එක අමාරු වැඩක් නොවෙයි. ඒත් අපේ ප්‍රශ්න ඒ නිසා විතරක් විසඳෙයිද?' ඔහු පිරිසගෙන් ඇසුවේය.

'මොනවද අපි පන්සල් වලිදි ඉගෙන ගෙන තියෙන්නෙ මේ ගරුතර ස්වාමීන් වහන්සේලාගෙන්?' ඔහු ඇසුවේ එතැන සිටි භික්ෂූන් වහන්සේ දෙස බලමින්ය. 'අපි ඉගෙන ගන්නව දුක පිළිබඳව. දුකට හේතුව පිළිබඳව. ඒ හේතු අඳුනාගන්න අපි ඉගෙන ගන්නව. ඒ හේතුව අඳුනාගත්තට පස්සෙ අපි ඒ හේතුව නැතිකර ගන්න ඕන අපේ දුක නැති කර ගන්න නම්' ඔහු යළිත් නැවතී භික්ෂූන් දෙස බැවුවේය. 'එහෙම නේද අපෙ හාමුදුරුවනේ'

'එහෙනම් අපේ මේ මුලු මහත් රටම විඳින දුකෙන් අපට ගැලවෙන්න නම් ඒකට හේතුව නැති කර ගන්න වෙනව' රැස්ව සිටි අය තවමත් ඔහුගේ අදහස අවබෝධ කර ගෙන නැති බව ඔහුට තේරුම් ගියේය. එයත් ඔහු බලාපොරොත්තුවූ ප්‍රතිචාරය විය යුතුයැයි මෙය අසා සිටි විතාට සිතිණි. එහෙත් මේ තරුණයාගේ කතාවේ අරමුණ කුමක් වේදැයි ඇයට සිතා ගත නොහැකි විය. භික්ෂූන් ද ඔහු දෙස බලා සිටියේ ඔහු කුමක් කරන්නට තැත් කරනවා දැයි සිතා ගත නොහැකිවය.

තිසගුත තෙරුන් ජීවිත පූජාවෙන් ගොඩ නැගූ අරගලය ඔහු තමාගේම කිසියම් අරමුනක් සඳහා යොදවා ගැනීමට මෙතැනට පැමිණ ඇතැයි විතාගේ සිතට සියුම් සැකයක් මතු වන්නට විය.

'මේ සියලු විනාශයන් සහ ඉදිරියට විය හැකි විනාශයන් නැවැත්වීමට දැන් වෙලාව ඇවිත් කියල මං විශ්වාස කරනවා'

'ඒක තමයි අපි මේ කරන්න හැදුවෙ' සෙනග අතරින් කිසිවෙක් කෑ ගැසුවේය.

'නෑ. ඔබ කවුරුත් ඒ ගැන කතා කරමින් හිටියා විතරයි' රාජ පුත්‍රයා කියා සිටියේය.

'පන්සල් වල බීම වාඩි වෙලා බලා හිටියට, උපවාස කළාට, භාවනා කළාට මේ ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. ප්‍රශ්නයට හේතුව නැති කරන කම් ප්‍රශ්නය විසඳන්න බැහැ'

sinhalaebooks.com



මේ අවස්ථාවේ කරන්නට අවශ්‍ය දෙය ගැන නොව වෙනත් අනවශ්‍ය දේ ගැන ඔහු කතා කරතැයි පිරිස කලබල කරන්නට සැරසෙන බව පෙනෙන්නට විය. ඔහු මතුවී ඇති ප්‍රශනය මග හැරීමට තැත් කරනවා විය හැකිය.

'ඔබ දන්නවාද මේ දුකට හේතුව කුමක් ද කියල?' ඔහු අසා සිටියේය.

ඔහුට පිලිතුරක් ලැබුණේ නැත.

'හොඳයි. එහෙනම් මම කියන්නම්. දුකට හේතුව ඇත්තේ මේ නගරයම ඇතුලෙමයි. මේ අලුතින් හදපු මාලිගය ඇතුලෙමයි.' ඔහු නව රජමැදුර දෙසට අත දිගු කළේය. 'ඔබලාගෙ මුදලින්, ඔබලාගෙ දහඩිය මහන්සියෙන් හදපු මාලිගාව. අපේ රටේ පාරවල්, පාසල්, රෝහල් හදන්න තිබුණු සල්ලි වලින් හදපු මාලිගාව. බඩගින්නෙ අඩන අපේ දරුවන්ට පෝෂ්‍යදායී කෑම වේලක් දෙන්න තිබුණ සල්ලි වලින් හදපු මාලිගාව. ඒ මාලිගාව ඇතුලෙ තමයි මේ සියලු ප්‍රශ්න වලට හේතුව ඇත්තෙ'

එතැන සිටි වැඩි දෙනෙකුට මේ කියන කිසිවක් වැටහී ඇති බවක් පෙනුනේ නැත. ඔහු කියනා දෙය ගැන සැකයක් ඇති වූ අයට වුවද ඔහු තමන්ගේ පියා ගැන මෙසේ කතාකරතැයි සිතා ගන්නට අපහසු විය. වෙළඳුන් හා භික්ෂූන් වඩාත් මේ ගැන කලබල වන්නට විය. මොහුගේ අරමුණ සිහසුන අත්පත් කර ගැනිමටද එසේ නැත්නම් මෙය රජතුමාගේ සහ හමුදා ප්‍රධානියා විසින් ම සැලසුම් කරන ලද උපාය මාර්ගයක් විය හැකිදැයි විතා ට හිතා ගන්නට බැරි විය. රජුට විරුද්ධ වන්නේ කවුදැයි පහසුවෙන් හඳුනා ගැනීමට මෙය අවස්ථාවක් කර ගත්තා විය හැකිය.

'ඒ තමයි මගේ පියා. පිය රජ්ජුරුවො', රාජ පුත්‍රයා යළිත් කතා කරන්නට විය.

'ඊළගට රජ කම ලැබෙන්නෙ මටයි. මට තියෙන්නෙ ඉවස ගෙන බලාගෙන ඉන්න එක විතරයි. ඒ අයිතිය කාටවත් උදුරා ගන්න බැහැ. මට හදිසියක් නැහැ. මට තව වයස තියෙනව. මට තව කාලයක් මේ වගේ සැහැල්ලු ජීවිතයක් ගත කරන්න පුලුවන් ඔය බරපතල වගකීම් බාරගන්න කලින්.

'මා මෙච්චර කල් හිතාගෙන හිටියෙ එහෙම තමයි. ඒත් මේ පසු ගිය දවස් වල වෙච්ච දේවල් නිසා මගේ ඇස් ඇරුණා. මම තවත් බලා හිටියොත් මට රජ වෙන්න රටක් ඉතුරු වෙන එකක් නැහැ. රජ වෙන්න දේශයක් ඉතුරු වෙන්නෙ නැහැ'

'මට රජ වෙන්න ඕන නිරොගීව සතුටින් සාමයෙන් ඉන්න ජාතියක. මට රජ වෙන්න ඕන මේ රටට සේවයක් කරන්න. යහපතක් කරන්න. අපේ රට වැසියන් සතුටින් සිටිනවා දකින්න. එහෙම බැරි නම් මට අද උනත් මැරිල යන එක හොඳ

sinhalaebooks.com



යි, මේ මගේ අවට මෙහෙම අපරාධ සිදුවෙද්දි මගේ ඇස් කන් වහගෙන ඉන්නවට වඩා' ඔහු කියන්නට විය.

'මගේ පියා විසින් පසුගිය දවස් වල කරපු අපරාද මම හිතල බැලුව. මට රජ පවුලක උපන්නා කියල කියන්න ලජ්ජා හිතෙනව. මට අපේ ගමක ගැමියෙකුට දාව හරි, මේ රටේ ඉන්න පහත්ම කියන කුලයක ඉපදුනා නම් මට ඔලුව කෙලින් කරගෙන ඔබ ඉදිරියේ ඉන්න තිබුණ. අද මට ඉන්න වෙලා තියෙන්නෙ මගේ පියාගේ වැරදි නිසා ඔලුව හංග ගෙන. පොලොව පලාගෙන යන තරම් ලජ්ජාවෙන්. මට දැන් තේරෙනව බුදු බනේ කියන කතාව මිනිහෙක් බ්‍රාහ්මණයෙක් හරි වසලයෙක් හරි වෙන්නෙ උත්පත්තිනේ නෙවෙයි ඔහුගේ ක්‍රියා වලින් කියන එක. මගේ පියා සූර්ය රාජ වංශයෙන් පැවත එන බව කිව්වත් මට හිතෙනව දැන් ඒ උසස් කුලයට අයිතියක් කියන්න එයාට සදාචාරාත්මක අයිතියක් නැහැ කියල. එයා විසින්ම ඒ අයිතිය නැති කර ගෙන කියල.

'අපේ රජු කෙළින්ම වග කියන්න ඕන විසිපන්දහස් අටසිය පනස් දෙනෙකුගෙ ජිවිත ගැන විරුද්ධ පැත්තෙන් යුද්ධයෙන් මැරුණ අපේම රටේ තරුණයො. ඒ යුද්ධය ඇති උනේ රජු ගේ වරදින් කියන එක නොදන්න කෙනෙක් නැතුව ඇති. අනියම් ආකාරයෙන් තවත් අටදහස් එකසිය අනූවක් මැරුණ අපේම හමුදාව. තවත් හයදහස් හාරසිය විසිපස් දෙනෙක් දරුවන් හා කාන්තාවන් මැරුණා ඒ ගම්බිම් විනාශ කිරීම නිසා.

මේ විස්තර රාජ පුත්‍රයා විසින් එකතු කර ගත්තේ කෙසේද, නැතිනම් ඔහු හිතට ආ පමණින් මේ දත්ත ඉදිරිපත් කරනවාදැයි විතාට හිතා ගන්නට බැරි විය. එහෙත් රාජ පුත්‍රයා විසින්ම ඇයට පිළිතුරු ලබා දුන්නේය.

'මං මේ විස්තර නිකම් අහසෙ පාවෙලා යද්දි අහුල ගත්තෙ නැහැ. මේ ටික කාලයක් තිස්සෙ මං එකතු කර ගත් විස්තර. ගමින් ගමට ගිහිල්ල, මගේ හිතවත් තරුණ පිරිස් හැම දිසාවකටම යවල, දුක් විඳින ජනතාව සමග කතා කරලයි මේ කරුණු දැන ගත්තෙ'

ඔහු මේ කියන්නේ ඇත්තදැයි දැන ගැනීමට කිසිවෙකුට හැකියාවක් තිබුනේ නැත. මෙසේ මේ කරුණු එකතු කිරීමට වෙනත් කිසිවෙකු වෙහෙස වන්නට නැත. රාජ නිලධාරින් මේ ගැන කිසිසේත් උනන්දුවන්නට නැත. ඒ නිසා රාජ පුත්‍රයාට ඕනෑම ගණන් විස්තර ඉදිරිපත් කළ හැකි බව පිරිස අතර සිටි සමහරුන්ට වැටහෙන්නට ඇත.

'මට ලැබී ඇති තොරතුරු අනුව මගේ පියා වගකියන්න ඕන තිස්දහස් හාරසිය හැටපස් දෙනෙකුගෙ ජීවිත වලට. ඔහුට කියන්න පුලුවන් ඒ සියලු දෙනාම ජීවිත පූජා කළේ රට වෙනුවෙන් කියල. මේ රට එක්සේසත් කරන්න කියල. විදේශ ආක්‍රමණ වලින් බේරෙන්න රට ශක්තිමත් කරන්න කියල. අපි බෙදිල ඉන්න කොට කාට හරි පරදේසක්කාරයෙකුට ඇවිත් අපේ රට යටත් කර ගන්න ලේසි නිසා කියල.

sinhalaebooks.com



'ඒ උනාට ඔබත් මමත් දන්නව ඇත්තටම හේතුව මොකක්ද කියල. එයාට තිබුණ ආසාවක් මේ මුලු රටේම රජ්ජුරුවො වෙන්න. ඔබ හිතනවද එයා මෙතනින් නවතීවි කියල? මී ළඟට එයාට ඕන වෙයි අහල පහල රටවල් අල්ල ගන්න. ඒවයෙත් රජ්ජුරුවො වෙන්න. චක්‍රවර්ති රජ කෙනෙක් වෙන්න. එතකොට අපේ මේ ඉතුරුවෙලා ඉන්න මිනිස්සු ටිකත් මරා ගන්නයි එයාට ඕන.

'මේ රජ්ජුරුවන් කරපු ඉතාම දරුණුම, ඉතාම කණගාටුදායකම අපරාදය අපේ මේ බෞද්ධ රටේ කෙනෙකුට හිතාගන්නවත් බැරි තරම් පවු කාර කමක්. සමාව දෙන්න කොහෙත්ම බැරි වැරද්දක්'

ඔහු වට පිට බලා යළිත් කතා කරන්නට විය. 'ඒ අවාසනාවන්ත දවසෙ, අපේ ජාතියේ මූසලම වූ දවසෙ, මම හිටියෙ දකුණු පළාතෙ ඈත කෙළවරේ. මට මේ අපරාධය ගැන දැනගන්න ලැබුණෙ දවස් කිහිපයකට පස්සෙ.

'මං එදා හිටිය නම් එක්කෝ මා ඒ අපරාධය වලක්කා ගන්නවා. බැරි උනානම් මාත් අපේ හාමුවුරුවන් එක්කම මගේ ජීවිතෙත් එතනම පූජා කරනව.

'රජ්ජුරුවො අපේ මහා සංසරත්නයේ ලේ හෙලෙව්වා. බෞද්ධයෙක් කියල කියාගන්න කෙනෙකුට මේ අනන්තරීය පාපකර්මය කරන්න පුලුවන්ද? මුලු රටම පිළිගත්, උගත් සිල්වත් හාමුදුරුකෙනෙක් මරා දමන්න තරම් මගේ පියාට එයාගෙ බල තන්හාව නිසා පුලුවන් උනා. ඉතින් එයාට ඊට වඩා අපරාධයක් කරන්න දෙපාරක් හිතන්න ඕන නැහැ. ඒ මගේ පියා කියල කිව්වත් මට අද ඔබ ඉදිරියේ කියන්නට වෙන්නෙ එයා මනුස්සයෙක් නෙවෙයි කියල. එයා බෞද්ධයෙක් නෙවෙයි කියල. මගේ පියා මාරයා ගෙ සරණ ගිය යක්ෂයෙක්'

රාජ පුත්‍රයා තුළ කිසිම හදිසියක්, කලබලයක් පෙනෙන්නට තිබුනේ නැත. විතා ර ස්ව සිටි පිරිස දෙස බැලුවාය. සියලු දෙනාම ඔහුගේ කතාවට වශීවී ඇතැයි ඇයට සිතුණේය.

හමුදා ප්‍රධානියා පැමිණ ඈතින් හිඳ මෙහි සිදුවන දේ බලා සිටියේය. ඔහුගේ ආරක්ෂාවට හමුදා භටයින් සිටි නිසා ඔහුට බියවීමට කරුණක් නොවීය. මතුවේගෙන එන තත්ත්වය ඔහුගේ ජීවිතයටත් ඔහුගේ අනාගතයටත් බලපෑමක් ඇති කළ හැකි බව ඔහුට වැටහී තිබුණේය. මහාවාපියේ ඉදිකිරීම් අවසන් වූ පසු ඔහුගේ හමුදා භටයින් වැඩි දෙනෙකුට අඹු දරුවන් බැලීමට ගම රටට යන්නට ඔහු අවසර දී තිබුණේය. තව දුරටත් ඔවුන් රඳවා ගන්නට තැත් කළහොත් පාලනය කරගත නොහැකි කැරැල්ලක් ඇති විය හැකි බව ඔහු දැන සිටියේය. අවුරුදු ගණනාවකට පසු තමන්ගේ ගමට යාමට බලා සිටි භටයින් දෙවරක් රඳ වා ගැනීමට ඔහුට සිදුවිය. ඒ මාලිගාව ඉදිකරන විටත් ඉන් පසු මහාවාපිය

sinhalaebooks.com



ඉදිකරන විටත් ය. රජු තවත් ව්‍යාපෘතියක් ගැන සිතන්නට පෙර ඔහු භටයින් මුදා හැරියේ ඒ නිසාය.

එහෙත් දැන් මතුවී ඇති ප්‍රශ්නය ඔහු කිසි දිනක බලාපොරොත්තු වූවක් නොවිය. අගනුවරට ජලය සැපයීම අඩාල වීම ජනතාව ප්‍රකෝප කරන කරුණක් විය හැකි බව ඔහු වටහා ගත යුතුව තිබුණේය. ඒ සඳහා සූදානම් ව සිටීම ඔහුගේ රාජකාරිය විය. එවැන්නක් ඇති වන්නට පෙර දැනගැනීමත් ඔහුගේ වගකීමක් විය. ජනයා කලබල වී මෙතැන රැස් වූ පසුත් ඔහු සිතුවේ වැඩිමනත් සිදුවිය හැක්කේ යළිත් වේල්ල ඉදි කර ඇළට වතුර හැරවීම හැරෙන්නට වෙනත් කළබලයක් විය නොහැකි බවයි. ඔහු විසින් ඒ වන විටත් වේල්ල බිඳි තැන ආරක්ෂාවට සිටි භටයින්ට රහස් පණිවිඩයක් යවා තිබුණේ සටන් නොකර ජනතාවට අවශ්‍ය දෙයක් කරන්නට ඉඩ හැරීමටය.

රාජ පුත්‍රයාගේ පැමිණීම මේ තත්ත්වය සුලු මොහොතක් ඇතුළත වෙනස් කිරීමට හේතුවිය. ඔහුගේ නිලධාරින්ගේ වාර්තා එන තෙක් නොසිට ඔහුම මෙතැනට පැමිණියේ ඒ නිසාය. රාජ පුත්‍රයා හෝ රජතුමා මේ ගැන ඔහුට කිසිවක් කියා තිබුණේ නැත.

ඔහුගේ සැලැස්ම සියල්ල වෙනස් කිරීමට කාලය පැමිණ ඇති බව ඔහුට වැටහුනේය. රජු ආරක්ෂා කිරීමට පෙර තමන් ආරක්ෂාවිය යුතු බව ඔහු තීරණය කළේය.

හමුදා ප්‍රධානියා වෙත ඔහුට පක්ෂපාතී දේශීය භටයින් සිටියේ ඉතා මත් සුලු පිරිසකි. සෙසු අය පිටරටවලින් ගෙන්වා ගත් මුදලට සටන් කරනා භට පිරිස්ය. ඔවුන්ගේ පක්ෂපාතිත්වය වැඩි මුදලට ඕනෑම වෙලාවක වෙනස් විය හැකිය. රජුගේම පුතා මේ විරෝධතාවයට මැදහත් වීම තුළ හමුදාවේ සිටි නිළධාරීන් කුමන පැත්තක් ගණු ඇතිදැයි ඔහුට සිතාගත නොහැකි විය.

ඔහුටත් තීරණයක් ගැනීමට අවස්ථාව පැමිණ ඇති බව යළිත් වරක් හමුදා ප්‍රධානියාට සිහිවිය.

මහඇමති හමුදා ප්‍රධානියා සිටි තැනට පැමිණියේය. පසුගිය මාස කිහිපය තුළ රේවා අවුරුදු දහයකින් පමණ වයසට ගොස් ඇතැයි හමුදා ප්‍රධානියාට සිතුණේය. රේවා මහලු වියටත් මරණයත් ඉඩදී බලා සිටින්නෙකු ලෙස පෙනුනි. ඔහු රජුත්, රටත් ඔහුගේම පවුලත් ඉදිරියේ අසාර්ථක පුද්ගලයෙකු වී ඇති බව ඔහුට වැටහී තිබුනේය. පූනා ඒ අවස්ථාවේ නිවැරදි තීරණයක් ගත් බව ඔහු දැන සිටියේය.

'මොනවද ඔබ හිතන්නෙ?' රේවා හමුදා ප්‍රධානියාගෙන් ඇසුවේය.

'ඒ තරම් සුභ දායක නැහැ. දැන් ඔබට වැටහෙනවද ඇයි මම ඒ වෙලාවෙ විරුද්ධ උනේ කියල මේ මාලිගය ඇතුලු නුවරින් පිට හදනවාට? රජතුමා ඇතුලු නුවර

sinhalaebooks.com



මාලිගාවෙ හිටියා නම් මට එතන ආරක්ෂාව සලසෙන එක ඉතා ලෙහෙසියි, මගේ හොඳ හටයො අතලොස්සකින් ඒ ආරක්ෂාව සපයන්න තිබුණ'

මහඇමති පිළිතුරක් දුන්නේ නැත. ඔහුටද තීරණයක් ගැනීමට වෙලාව පැමිණ තිබුණේය. පසුගිය කාලය තුළ සිදුවූ අවාසනාවන්ත සිදුවීම සියල්ලටම ඔහුද වගකිව යුතුයැයි ජනතාව සිතන බව ඔහු දැන සිටියේය. ඔවුන්ගෙන් ඔහුට සමාවක් බලාපොරොත්තු විය නොහැකිය. ඔහුට අත්වන ඉරනමක් බාරගැනීමට ඔහු සූදානම් වී සිටියත් ඔහුගේ බිරිඳත් දරුවන්ගේත් ආරක්ෂාව සලසන්නේ කෙසේදැයි ඔහුට අවබෝධයක් තිබුනේ නැත. හමුදා ප්‍රධානියා ගෙන් ඔහුගේ පවුලට ආරක්ෂාව බලාපොරොත්තු විය හැකිදැයි ඔහු කල්පනා කළේය. හමුදාපති කෙසේ හෝ තමන්ගේ තැන බේරා ගන්නා බව රේටා දැන සිටියේය.

'රටවැසියාගේ සියලු දුකට හේතුව රජ්ජුරුවෝමය'. මේ අතර රාජ පුත්‍රයා රැස්වූ පිරිසට කියා සිටියේය. 'ඒ නිසා ඒ හේතු ඉවත් කිරීමට දැන් වෙලාව ඇවිත්'

'මං මුලින් සඳහන් කළ ජාතික අපරාධ වලට අමතරව දැන් මේ අපේ අගනුවරට කර තියෙන්නෙ තවත් මහා අපරාධයක්. රජු මේ අගනුවර දසලක්ෂයක් දරුවන්, ගැහුණුන් හා පිරිමින් ට ස්භාවධර්මයෙන් අයිති වෙන වතුර ටික අහිමි කරල තියෙනව. පුරාකවාපිය කියල එයාගෙ නම තියාගන්න වැවක් හදන්න ඕන උන නිසා. ජනතාවට හෙනගැහිල ගියත් කමක් නැහැ එයාගෙ නම හැමදාම පවතින්න ඕන කියල නෙ එයා හිතන්නෙ. නම පවතීවි ඉර හඳ පවතින කම්. අපේ රටට මහා විනාශයක් කරපු රජ හැටියට. මේ හදල තියෙන වැවට නම දෙන්න ඕන මහා විනාශය කියල. අපේ රටේ ඇතිවෙන ඉතාම දරුණු විනාශයට මේ වැව හේතු වෙන නිසා.

'අපට තණකොල ගහකින් කඩුවක් වලක්වන්න බැහැ. ඊතලයක් අතින් අල්ලල නවත්ව ගන්න බැහැ. භාවනා කරල, යාඥා කරල අපරාධ නවත්වන්න බැහැ. දන්නවනෙ අපේ හාමුදරුවන්ට අත් වෙච්ච ඉරනම'. රාජ පුත්‍රයා දිගටම කතා කරගෙන ගියේය.

'දැන් සාමකාමී අරගල කරන කාලෙ ඉවරයි. හැම දුකක් කරදරයක්ම, පීඩාවක්ම, අවමානයක්ම, අසාධාරනයක්ම ඉවසාගෙන ඉන්න කොට තව තවත් අසරණ වෙන්නෙ මහජනතාව මයි. බල්ලෙක් වලිගෙ කකුල් දෙක අස්සෙ ගහගෙන දෙකට නැමෙන කොට තමයි කාට උනත් හිතෙන්නෙ ඌට පයින් එකක් ගහන්න ඕන කියල. ඒ බල්ල බුරාගෙන පැන්නොත් අපි පැනල දුවන්න හදනව නැත්නම් ඌට ආදරෙන් කතා කරල ඔලුව අතගාන්න හදනව'

රැස්වූ පිරිස රාජ පුත්‍රයා ගේ කතා අසා සිටියා මිස කිසිවෙක් පිළිතුරු දෙන්නට හෝ එතැණින් ඉවත්වීමට සිතුවේ නැත.

සියල්ල වෙනස් වී ඇත. ලෝකය කණපිට පෙරලී ඇත. තිසගුත හිමියන්ද ඊට පසු විතා ද මාස ගණනාවක් කරන්නට උත්සාය කළ දේ පැය ගණනාවක් ඇතුළත

sinhalaebooks.com



සිදුවෙමින් පවතින බව විතා දුටුවේය. ඒ වන විට එතැන රැස්ව සිටි දහස් සංඛ්‍යාත පිරිස සටන් කරන්නට, අසාධාරණයට එරෙහිව නැගී සිටින්නට සැරසී සිටියහ.

එහෙත් විතාගේ සිතට ඒ ගැන සතුටක් ඇති නොවූයේ ඇයි දැයි ඇයටම සිතා ගත නොහැකි විය.

'දැන් අපේ වාරයයි. අපේ දුක නැතිකර ගැනීමට වෙලාවයි. අපේ දෛවය දැන් අපේ අතේ' දෑත් ඔසවා පවසමින් රාජ පුත්‍රයා ඇළ කන්දෙන් බැස ජනතාව පිරාගෙන ඉදිරියට ඇදුණේය.

පිරිස මහා හඬින් කෑ ගසමින් ඔහු පසුපස යන්නට වූහ. කන්ඩිය මත සිටි විතා දුටුවේ රාජ පුත්‍රයා සෙනග රැගෙන යන්නේ වේල්ල බිඳුණු තැනට නොව රජ මාලිගය දෙසට බවයි.

එතෙක් මේ ජනතාව අත කිසිවක් තිබුණේ නැත.

මඳ දුරක් යද්දී කොහෙදෝ සිට මේ පිරිසේ සිටි තරුණයින් අතට අවි ආයුධ ලැබෙන්නට විය. ඇය වඩාත් හොඳින් වට පිට බලනා විටය දක්නට ලැබුණේ තරුණ පිරිසක් මේ ආයුධ බෙදා දෙන බව.

රාජ පුත්‍රයා මේ තරම් පෙර සූදානමක් වූයේ කෙසේදැයි විතා කල්පනා කළාය. ඔහු විසින් මෙවැනි විප්ලවයක් සැලසුම් කරමින් සිටිනා අතර ඇය විසින් ඔහුට මෙවැනි අවස්ථාවක් උදා කර දී ඇතැයි ඇයට සිතුණේය. ඇය අසල සිටි වෙළඳුන් හා භික්ෂූන් දෙස ඇය බැලූ විට ඔවුන්ද දෑස් අදහා ගන්නට බැරිවා සේ බලා සිටිනා බව දුටුවාය. මේ මහජන ගංගාවට තවත් සෙනග එකතු වෙමින් සිටි අතර ඔවුන් අතද කඩු කිණිසි වෙනුවට ගොවිතැනට අවශ්‍ය කැති, පොරෝ ආදී ආයුධ තිබිණ.

කැරළි කරුවන්ගේ සෝෂාව ඈත සිටම මාලිගාවට ඇසෙන්නට විය. ඒ සොෂාව කුමක් දැයි රජු විමසූ විට මාලිගාවේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා පැවසුවේ කලබල කාරයින් කිහිප දෙනෙක් කෑ කෝ ගසන බවයි.

'ඒ අතරෙ අපේ රජ කුමාරයත් ඉන්නව' ඔහු රජුට පැවසිය. රජු එය නෑසුනාක් මෙන් සිටියේය.

'කුමාරය ඉන්නෙ මොකක් හරි කලබලයක් ඇති කරන්න බලාගෙන' රජ බිසව පහත් හඬින් පැවසුවාය.

'කුමාරය ටිකක් වෙනස් උනා ඔබවහන්සේගෙ බාල කුමාරයට යුවරාජ පදවිය ලැබුනාට පස්සෙ', ආරක්ෂක නිලධාරියා කීවේය.

sinhalaebooks.com



'එයා කොහොමද යුවරාජ කමට අයිතියක් කියන්නෙ? කවුද එයාගෙ අම්මා? අපේ රාජ පෙළපතට කිට්ටු කරන්න පුලුවන් කෙනෙක්ද?' බිසව එවර උස් හඬින් ඇසුවාය.

'ඕන කෙනෙක් ඕන තරම් කෑ ගහපු වාවෙ. බල්ලො බිරුවට කන්දක් හෙල්ලෙන්නෙ නැහැ නෙ' රජු කතාව එතෙකින් අවසන් කළේය.

## 13.

ප්‍රධාන ආරක්ෂක නිලධාරියා මාලිගාවේ ගේට්ටුව වසා දමන ලෙස අණ කළේය. රාජ පුත්‍රයා රජුට විරුද්ධව නැගී සිට ඇතැයිද නගරයට ජලය යළිත් සපයා ගැනීම සඳහා සැරසෙන බවද මේ වන විට රජවාසලේ සේවක පිරිස අතර පැතිර යන්නට විය. මෙහිද රාජ පුත්‍රයාට ලැදිවූ පිරිස් ද, මහාවාපිය නිසා පීඩනයට පත් වූ වන්ගේ ඥාතී හිතවතුන්ද මාළිගය තුළ සිටි සෙසු පිරිස නම්මවා ගන්නට වතුර ප්‍රශ්නය පෙරට ගෙන ආවෝය. මෙයින් මූලික වූ සමහරුන්ට ඉන් පෙර රාජ පුත්‍රයා විසින් මෙවැනි අවස්ථාවක කටයුතු කළ යුතු අන්දම වටහා දී තිබුණේය.

මෙසේ තෝරාගෙන සිටි පිරිස වේලාසණින් සඟවා තිබූ ස්ථාන වලින් ඔවුන්ගේ ආයුධ එකතු කර ගත්හ. තමන්ට විශ්වාස වූ අනිත් සේවකයින් අතරද ආයුධ බෙදා දෙන ලදී. මේ පිරිස ඉන් අනතුරුව මාලිගාවේ දොරටුව අසලට එකතු වූහ. දොරටුව රැකවල් කළ සුලු භට පිරිස පරාජය කර දොරටුව විවෘත කිරීමට මේ අයට වැඩි වෙලාවක් ගත වූයේ නැත. එයින් ඇතුලු වූ රාජ පුත්‍රයා පසු පස මුලු රටේම වැසියන් ඇත් දැයි මාලිගාවේ සේවකයින්ට සිතුණේය.

කඩා දැමූ වේල්ල හරහා වතුර ගලා ගිය ලෙසින් මහජනතාව මාලිගාව ඇතුළට ගලා එන්නට පටන් ගත්තේය. චිතා ද මේ සෙනග අතරින් තවත් තරුණියන් කිහිප දෙනෙකු සමග පැමිණියාය. ඇය අසල සිටි පූනා ඇයට හඳුනා ගත හැකි විය. ඇය එතනට ආවේ ඇයි දැයි මුලදී ඇගේ සිතට ප්‍රශ්නයක් වුවත්, රාජ පුත්‍රයාට සිය පියාට විරුද්ධව නැගී සිටින්නට හැකි නම් පූනාට ඇගේ පියාට විරුද්ධ වන්නට අයිතියක් ඇති බවයි ඉන් පසුව පූනාට සිතුණේ.

චිතා මහඇමති දුව අසලට යන විට පූනාද ඇය හඳුනා ගත්තාය.

'මොනවද අනේ වෙන්න යන්නෙ', පූනා ඇයගෙන් ඇසුවාය.

'මටත් හිතා ගන්න බැහැ. දැන් මං හිතන්නෙ කවුරුවත් දන්නෙ නැහැ ඊළඟට මොනව වෙයිද කියල'

sinhalaebooks.com



රාජ පුත්‍රයා සහ ඔහුගේ පිරිස වලක්වාලීමට තරම් ශක්තියක් සහ උද්යෝගයක් ඇති පිරිසක් මාලිගාව තුළ සිටියේ නැත. ප්‍රධාන ආරක්ෂක නිලධාරියා පෙනෙන්නට සිටියේත් නැත. හමුදාපතිට යැවූ පණිවිඩයට පිලිතුරක් හෝ ඔහුට සහායට භට පිරිසක් ලැබුණේත් නැත. හමුදාපති කැරලිකරුවන් අතින් මැරුම් කන්නට ඇතැයි හෝ නැතිනම් ඔහු බේරී පළා යන්නට ඇතැයි නිලධාරියා සිතුවේය. ස්ථිර හමුදා භටයින් වැඩි දෙනෙක් නිවාඩු යැවීම ගැන නිලධාරියා හමුදාපතිට සිතින් සාප කළේය. ඊළඟට ඔහුගේ සිතට ආවේ භටයින් නිවාඩු යැවීමත් මේ කැරැල්ලේ සැලැස්මකට අනුව සිදුවන්නට ඇතැයි යන සැකයයි.

කැරලිකරුවෝ මාලිගාවේ ගොඩනැගිලි තුළට කඩාවැදුනහ. ජල ප්‍රශ්නයත් මේ කැරැල්ලට මුල් වූ හේතුවත් ඔවුන්ට අමතක වූවා සේ විය. වැඩි දෙනෙක් මාලිගාවේ තිබූ ඔසවාගෙන යා හැකි සියලු වස්තුව රැගෙන එතැණින් ඉක් ඉක්මනින් පලා යන්නට වූහ. තවත් අය මාලිගාවේ සේවය කළ රූමත් තරුණියන් ලුහුබඳින්නට වූහ.

ඇගේ සොහොයුරාත් ඇයත් හදා වඩා ගන්නට තැත් කළ බළල් පැටියා දරුණු කොටියෙක් වූයේ කෙසේදැයි චිතාට සිතා ගැනීම අපහසු වීය.

පිරිසක් විසින් රජු අල්වාගෙන මාලිගාවෙන් පිටතට ගෙන එන ලදී. කෙනෙක් ඔහුගේ බෙල්ලට කඹයක් දමා ගැට ගැසූ පසු රජු පාරදිගේ ඇද ගෙන යන්නට තරම් ඔවුහු සාහසික වූහ.

'මේ ළඟම තියෙන ගහේ එල්ලමු' මෙතෙක් ඒ රජු වෙතම සේවය කළ ඇමතිවරයෙක් පිරිසට කෑ ගසා කීවේය.

'නෑ. එහෙම කරන්න දෙන්න බැහැ', මෙය ඇසූ රාජ පුත්‍රයා ඇමති දෙසට හැරුණේය. 'ඒ ගැන කතා කරන්න ඔබට අයිතියක් නැහැ' ඔහු කී සැනින් පිරිසේ කිහිප දෙනෙක් ඇමතියා බිම පෙරළාගෙන ඔහුට පහර දෙන්නට වූහ.

රාජ පුත්‍රයාගේ උපදෙස් අනුව රජු මාලිගාවෙන් පිටතට ගෙන ඇළ කන්ද දිගේ ගඟ අයිනට ඇද ගෙන යන ලද අතර ඔහු කැරලිකරුවන් පසු පස ගමන් කළේය.

'මං දන්නව රජ්ජුරුවන්ට කළ යුතු දේ. මං කියන කම් කිසිම දෙයක් කරන්න එපා' ඔහුගේ සගයන්ට ඔහු අණ කළේය.

වේල්ල බිඳි තැනට ඇදගෙන ආ රජු එතැන බිම වැටුනේය. බිම දිගේ ඇද ගෙන යාම නිසාත් විටින් විට වැදුණු පහර නිසාත් තුවාල වූ ඔහුගේ සිරුරේ සෑම තැනින්ම ලේ ගලමින් තිබුණේය. ඔහුගේ සේද සලු මඩ සහ ලේ වලින් වැසී තැනිනු තැන ඉරී තිබුණේය.

sinhalaebooks.com



'දැන් අපි මේ වේල්ල යළිත් බඳින්න ඕන. ගඟේ වතුර ටික සේරම වැවට යන්න කලින්' රාජ පුත්‍රයා පිරිස අමතා කීවේය.

ඒ ඇසූ විගස පිරිස ගඟ මැදට පැන පහලට ගසාගෙන ගිය ගල් සහ ගල් කණු පැරණි වේල්ල තිබූ ස්ථානයට ඇද ගෙන එන්නට වූහ. තවත් පිරිස් වේල්ල බැඳීමට අවශ්‍ය වූ පස් සහ දැව කඳන් ගෙන ඒමට කරත්ත සොයාගෙන පිටත් වූහ.

මේ අතර රජු ගේ දෑත් සහ දෙපා කඹයකින් ගැට ගසා තිබුනේය.

'දැන් අපි මේ සියලු අපරාද කරපු, මේ සියලු දුකට හේතුවන, මේ රජ්ජුරුවෝ හැටියට හිටි එක්කෙනාට මොනවද කරන්න ඕන' රාජ පුත්‍රයා ජනතාවගෙන් ඇසුවේය.

'මරණ දඬුවම දෙන්න ඕන' හැමදෙනා එකා මෙන් කෑගැසූහ.

චිත්‍රා එතැනට දුවගෙන ආවේ සිදුවන්නට යන අපරාධය වැලැක්වීමට උත්සාහ කිරීමටය.

'පළිගැනීම අපේ ප්‍රශ්න වලට විසඳුමක් නෙවෙයි. අපේ රටේ අපි මෙච්චර කාලයක් ජීවත් උණේ එහෙම නෙවෙයි. අපේ බෞද්ධ පිළිවෙත් වලට අනුවයි අපි වැඩ කරන්න ඕන'

'රජාට මරණය', ඇගේ හඬ යටපත් කරමින් සෙනග ඝොෂා කරන්නට වූහ.

'එල්ලමු'

'උල තියමු'

'පුච්චමු'

'ඊට කලින් අත් පා කපා දමමු'

'පන පිටින් හම ගහමු'

'නැහැ. ඒ මොනවත් කරන්න ඕන නැහැ' මේ සියල්ල අසා සිටි රාජ පුත්‍රයා යළිත් ඉදිරියට ආවේය.

ඔහු කතා කරන තුරු කවුරුත් නිහඬ වූහ.

'ඊට වඩා හොඳ, ඊට වඩා සුදුසු දඬුවමක් තියෙනව'

ඔහු මොහොතකට යළිත් නිහඬ විය.

sinhalaebooks.com



'මෙයා ගෙනියන්න ගඟට, අරගෙන යන්න අතනට' ඔහු වේල්ල බිඳී ඇති තැන පෙන්වමින් කීවේය.

'දැන් මේ ගල් කණුවට තියල හොඳට ගැට ගහන්න', ඔහු වේල්ල බිඳුණු පසු ඉතිරි වී තිබූ ගල් කණුවක් පෙන්වීය.

රජු සීතල වතුරේ දඟලන සැටි රාජ පුත්‍රයා බලා සිටියේය.

'ඔලුව වතුරෙන් උඩට තියන්න', ඔහු අණ කළේය. 'දැන්ම මැරෙන්න දෙන්න හොඳ නැහැ නෙ' ඔහු මහ හඬින් සිනාසුනේය. 'මෙච්චර කල් කරපු පවු මතක් කර ගන්න ඉඩ දෙන්න ඕන නෙ'

රජු ඔහුගේම පුතා දෙස බලා සිටියේය.

'දැන් ඉතින් වේල්ල බඳින්න පටන් ගන්න' ඔහු පැවසුවේ ගඟෙන් ගොඩට පැමිණය. 'ඇයි තවත් බලා ඉන්නෙ'

'මේ රජ්ජුරුවෝ ඔබේ සහොදරයාට කළෙත් මෙහෙම නේද' ඔහු චිතා වෙත සමීපව ඇයගෙන් ඇසුවේය. 'ඉතින් එයාටත් ඒ දඬුවම දෙන එක හොඳයි නේද?'

'අපි එහෙම කළොත් අපිත් එතකොට රජතුමාටත් වඩා පවුකාරයො වෙනව. අපි උද්ඝොෂණය කලේ රජු මරන්න නොවයි. කාගෙන්වත් පළි ගන්න නොවෙයි. මෙහෙම කළා කියල අපේ රටේ මිනිස්සු විඳපු දුක් වේදනා මැකිල යන්නෙ නැහැ. අපේම සිත් තවත් කිළිටි වෙනවා මිසක. අපිත් ඒ වගේ දරුණු සිත් ඇති අය වෙනවා මිසක', ඇය පිළිතුරු දුන්නාය. 'අපට කරන්න තියෙන්නෙ මිනිස්සුන්ගෙ විනාශ වෙච්ච ගෙවල් හදල දෙන එක. වගා බිම් ලබා දෙන එක. මේ විනාශ වෙන ගස් වැල් වෙනුවට තව ගස් හිටවන එක'

'මේ බණ කියන්නවත්, බණ අහන්නවත් වෙලාවක් නෙවෙයි. අපට ඊට වඩා වැදගත් වැඩ තියනව කරන්න' එසේ කියමින් රාජ පුත්‍රයා වේල්ල බඳින තැනට ගමන් කළේය.

චිතා යළිත් වරක් අසරණව බලා සිටියාය. රජුගේ සිරුර මතට විශාල ගල් කුට්ටි සහ පස් වැටෙන සැටි බලා සිටියාය. මහාවාපි බැමීමට වඩා ඉක්මණින් මේ වේල්ල බැඳෙන අන්දම ඇය බලා සිටියාය. එදා මිනිසුන් ක්‍රියා කළේ අකමැත්තෙන් ය. මැරෙන්නට බියෙන්ය. මෙදා මිනිසුන් සිටියේ වෛරයෙන් අන්ධ විය. රාජ පුත්‍රයාගේ කතාවෙන් මත් විය. ඒ සමගම තමන්ගේ නගරයට යළිත් ජලය ලබා ගැනීමට ඇති උනන්දුව සමගය.

චිතා සෙමින් සෙමින් එතැනින් ඉවත්ව ගියාය. ඇය ඉවත් වන්නේ වැව් බැම්ම මතින් පමණක් නොව මුලු මහත් නොමිනිස් සමාජයෙන් ම යැයි ඇයට සිතුණේය.

sinhalaebooks.com



ඈත කුඩා නගරයක මෙහෙණි ආශ්‍රමයක පැවිදි බව ලබා ජීවිතයේ ඉතිරි කාලය ගෙවන්නට ඇය තීරණය කළාය. වනාන්තරයක ගල් ගුහාවක හිඳ භාවනාවේ යෙදෙන්නට වුවමනාව තිබුණත් තරුණ ගැහැනියක ලෙස ඇයට එවැනි ජිවිතයක් ගත කරන්නට මේ සමාජය ඉඩ නොදෙන බව ඇය දැන සිටියාය.

ඇගේ නික්ම යාම දුටු පූනා ඇය වෙත දුව විත් ඇගේ අතින් අල්ලා ගත්තාය.

'මටත් එන්න පුලුවන්ද ඔබ යන තැනකට' ඇය ඇසුවේ චිතාගේ හිත කියවූ කෙනෙකු සේය.

'බැහැ. ඔබට මේ ගමන යන්න බැහැ. ඔබට දෙමාපියන් ඉන්නව. නැගනියක් ඉන්නව. ඉන්න හොඳ ගෙයක් තියෙනව. පවුලෙ හැමෝගෙම ආදරය තියෙනව. ඒ අය අත්හරින්න ඔබට අයිතියක් නැහැ'

'ඒත් ඔබ වගේම මාත් මේ සිද්ද වෙච්ච දේවල් නිසා ඉතාමත් කළකිරීමකින් ඉන්නෙ. මේ වගේ මිනිස් සමාජයක ජිවත් වෙන්න මටත් කිසිම ඇසාවක් නැහැ'

'මා යන්නෙ මට වෙන යන්න තැනක් නැති නිසා. මගේ කියල කවුරුවත් නැති නිසා. ඔබට හොඳ අනාගතයක් තියෙනව. හොඳ අත්දැකීම් තියෙනව. මිනිස් ස්වභාවට ගැනත් හොඳ දැනුමක් ලබා ගත්තා. ඒ නිසා දැන් වෙනදාට වඩා ශක්තියක් ඔබට තියෙනව සමාජයට මුහුණ දෙන්න. ඒ එක්කම ඔබට හැකිවෙයි සමාජයට කිසියම් සේවයක් කරන්න මිනිසාගේ යහපත වෙනුවෙන්. ඔබේ පියා මේ අය වගේ නෙවෙයි. ඔහු හොඳ මිනිහෙත්. මිනිස් කම තියෙන. තමන්ගේ හිතට විරුද්ධව ඔහුට යම් යම් තීරණ ගන්න සිද්ධ උනේ ඔබලා වෙනුවෙන්. ඔබලාට ඇති ආදරය නිසා. ඒ හින්ද පියාට සමාව දෙන එක ඔබේ යුතුකමක්'

චිතා ඇගේ අත මුදා හැර සෙමින් ඇය වෙතින් පා නගනා අන්දම පූනා කඳුලු පිරි දෑසින් බලා සිටියාය.

චිතාගේ සිත තුල ඉමහත් දුකක් සේම පසුතැවිල්ලක් ද වීය. රජුගේ මරණයට ඇයද යම් පමණකින් වගකිවයුතු යැයි ඇයට සිතුණේය. මේ විරෝධතාවයට මූලික වූයේත්, නගරයේ මිනිසුන්ගේ අවධානය මේ ප්‍රශ්නය වෙත යොමු කළේත් ඇය නොවේදැයි ඇයට සිතුණේය. ඇය එදින උදේ නගරයේ වෙළෙන්දන්ට මේ බව පැවසුවේ නැත්නම්, ඒ සෙනග අමතා කතා කළේ නැත්නම් රාජ පුත්‍රයාට මේ අවස්ථාව ඔහුගේ ප්‍රයෝජනයට හරවා ගන්නට නොහැකි වන බව ඇය විශ්වාස කළාය.

සමහර විට ඇ එදින උදේ මුණගැසුණු වෙළඳුන් ඇයත් මේ රාජපුත්‍රයාගේ කුමණ්ත්‍රනයේ කොටසක් ලෙසත් එහි හවුල්කාරියක ලෙසත් සැක කළ හැකි බවත් ඇයට සිහි විය.

sinhalaebooks.com



රජු විසින් දරුණු අපරාධ කර ඇති බවත්, තිසගුත හිමියන්ගේ මරණය සිදුවූයේත් රජුගේ අණින් බවත් ඇය දැන සිටියත්, ඔහුට ඒ නිසා කිසියම් දඬුවමක් ලැබිය යුතු බවත් ඇය සිතුවත්, මෙවැනි දරුණු වූ මරණයක් ඔහුට අත් විය යුතුව තිබුණේ නැතැයි ද ඒ සමගම ඇය විශ්වාස කළාය.

විතාට අවශ්‍ය වූයේ ඔවුන්ගේ ගම් කිහිපයත්, කුඹුරු සහ හේන් ගොවිතැන් සමග මිටියාවතේ වනාන්තරය බේරා ගැනීමය. මිනිසුන්ගේ සහ සතුන්ගේ ජීවිත බේරාගැනීම මිස ජීවිත විනාශ කිරීම නොවේ. තවත් කෙනෙකුගේ ජීවිතය විනාශ කිරීමට කිසිවෙකුට අයිතියක් නැත. භික්ෂුවකට මෙන්ම රජකෙනෙකුට මෙන්ම කැලයේ සිටි අහිංසක සතකුට පවා ජීවත් වීමට අයිතියක් ඇත. අනිත් සතුන් මරා ගෙන කන සතෙකුට වුවද ජීවත් වන්නට අයිතියක් ඇත

විතා වඩාත් දුක්වූයේ ඇය මේ රටේ ජනතාව ගැන තබා තිබූ විශ්වාසය බිඳ වැටීම නිසාය. ඇය මෙතෙක් විශ්වාස කරගෙන සිටියේ බෞද්ධයින් වන මේ රටේ සියලු ජනතාව අවිහිංසාවට මුල් තැනක් දෙන, සාමකාමී ජන කොටසක් ලෙසය. එහෙත් මේ මිනිසුන්ගේ සැබෑ තත්ත්වය සිය ඇසින්ම දුටු පසු තව දුරටත් ඒ මිනිසුන් සමග මොහොතක් වත් වාසය කිරීමට ඇය ට අපහසු විය.

මේ මිනිසුන්ට අවශ්‍ය එවැනි දරුණු ජීවිත ගත කිරීමට නම්, එය වැලැක්වීමට ඇය ට ශක්තියත් නැත්නම්, ඇයට ඉතිරිව ඇත්තේ ඔවුන්ගෙන් හැකි තරම් ඈත්ව භාවනානුයෝගීව ඇගේ ඉතිරි ජීවිත කාලය ගත කිරීමය.